
# රණවිරුවා

2022 නොවැම්බර් • 249 කලාපය




## ජව බල පිරි විරුවන්ගේ පෙළහර පෑ අභිමානය

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර

# ජනාධිපතිතුමන් මන්නාරමේ සංචාරයක



ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා පසුගිය නොවැම්බර් මස 20 වන දින මන්නාරම ප්‍රදේශයේ සංචාරයක නිරත වන අතරතුරේදී තල්ලඩිහි පිහිටි 54 වන පාබල සේනාංකය වෙත ද පැමිණියේය. ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ 54 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ ගෞරවනීය පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි ජනාධිපතිතුමන් එහිදී දිවා භෝජන සංග්‍රහයටද එක්විය. ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද, විදුලිබල හා බලශක්ති අමාත්‍ය කාංචන විජේසේකර, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය කේ කාදර් මස්තාන්, උතුරු පළාත් ආණ්ඩුකාර ජීවන් ත්‍යාගරාජා සහ මන්නාරම දිස්ත්‍රික් ලේකම් ඒ ස්ටැන්ලි ද මෙල් මහත්මිය ඇතුළු අමාත්‍යවරු සහ රාජ්‍ය නිලධාරීන් රැසක්ද එම අවස්ථාවට එක්වූහ.

# ජපාන තානාපති හා යුද්ධ හමුදාධිපති අතර හමුවක්



ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලයේ තානාපති මිසුකොෂි හිඩෙකි (Mizukoshi Hideaki) මහතා සහ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් යූකි යොකොහාරි (Yuuki Yokohari) පසුගිය නොවැම්බර් 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ.

මෙම සුහද හමුවේදී, යුද්ධ හමුදාවේ අවධානයට ලක්විය යුතු කරුණු සහ සංවර්ධන ඉලක්ක කරගත් භූමිකාවන් පිළිබඳව අදහස් හුවමාරු කරගනු ලැබිය. තවද, දෙරට අතර පවතින සුහදතාවය සහ ද්විපාර්ශ්වික සබඳතාවයේ දිගුකාලීන බැඳීම, ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව සමග පැවැත්වෙන පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම සහ ඒකාබද්ධ අභ්‍යාසවලට සහභාගීවීමේ හැකියාව පිළිබඳව කරුණු වඩාත් අවධානයට ලක්කෙරිණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ද එක්විය.



# සඳහිරු සෑ රදුන් අභියස

## ප්‍රථම කඨින පූජෝත්සවය





මව්බිමේ ස්වෛරීත්වය සහ ඒකීයභාවය වෙනුවෙන් සිය ජීවිතය පූජා කළ ත්‍රිවිධ හමුදා රණවිරුවන්, පොලිස් සහ සිවිල් ආරක්ෂක බලකායේ වීරෝදාර රණවිරුවන් සිහිකිරීම, රණක්ෂිතයට පත් රණවිරුවන්ට ආශිර්වාද එක් කිරීම සහ තිස් වසරක යුද්ධයේ නිමාව සනිටුහන් කරමින් අනුරාධපුරයේ ඉදිකළ සඳහිරු සෑ චෛත්‍ය රාජයාණන් වහන්සේ අභියස ප්‍රථම කඨින චීවර පූජාව ඉකුත් නොවැම්බර් 03 වන දින ආරක්ෂක අංශ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසකගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබූහ.



මෙම අවස්ථාව සඳහා ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ඇතුළු සෑදැහැවතුන් පිරිසක්ද සහභාගී වූහ.

මෙම ආගමික වතාවත් බුද්ධ කාලයේ සිට සම්ප්‍රදායානුකූලව පවත්වාගෙන එනු ලැබූ චාරිත්‍රයන්ට අනුකූලව සිදුකළ අතර, එහිදී භික්ෂූන් වහන්සේලා උදෙසා දහවල් දානයද පිළිගන්වනු ලැබීය. යුද්ධයේදී දිවිපිදූ වීරෝදාර රණවිරුවන්, රණක්ෂිතයට පත් සහ සේවයේ නියුතු විරෝදාර රණවිරුවන්ට මෙන්ම සමස්ත රට වැසියන්ටම පිං අනුමෝදන් කර ආශිර්වාද එක්කිරීමද එහිදී සිදුකෙරිණ.

# වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයට නව නිලධාරී නිවස්නයක්





වේරහැර පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ නිලධාරී නිවස්න ගොඩනැගිලි සංකීර්ණය එම රෙජිමේන්තුවේ නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා නිල වශයෙන් භාරදීම පසුගිය නොවැම්බර් 09 වන දින ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ගේ සුරතින් සිදුවිය. එම අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද එක්වූහ.

වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දීර්ඝ කාලයක සිට පැවති අවශ්‍යතාවයක් සපුරමින් ඉදිකරනු ලැබූ මෙම නිලධාරී නිවස්න ගොඩනැගිලි සංකීර්ණය මහල් දෙකකින් සමන්විතය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ කර්නල් සේනාවිධායක බ්‍රිගේඩියර් පීඒසී ප්‍රනාන්දු යූඑස්පී සහ යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීහු රැසක්ද මෙම අවස්ථාවට එක්වූහ.

# ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී

## 1 වන බලනා මූලස්ථානයේ සංචාරයක




ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් පසුගිය ඔක්තෝබර් 14 වන දින 1 වන බලකායේ කඳවුරු සංචාරයක නිරත විය. එහි බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥාණරත්න එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් එහි පැමිණි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වෙත යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව හිමිවූයේ ගෞරවනීය පිළිගැනුමකි. එහිදී, කිලිනොච්චිය නෙලුම්පියස ශ්‍රවණාගාරයේදී සියලුම භටපිරිස් ඇමතූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පසුගිය කාල පරිච්ඡේදය තුළ රටෙහි පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ විවිධ මෙහෙයුම්වල නිරත වූ සියලුම භටපිරිස් වෙත සිය කෘතඥතාව පළ කළේය.



# යුද්ධ හමුදාධිපති ගේ මූලිකත්වයෙන් විරු දිරි සත්කාරයක්





යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරී කරනු ලබන හමුදා පිරිස් සහ සිවිල් කාර්ය මණ්ඩලය වෙත ඔවුන්ගේ ආර්ථික දුෂ්කරතා අවම කරගැනීමට සහනයක් සැලසීමේ අරමුණින් වියළි සලාක පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් යුද්ධ හමුදා මූලස්ථානයේදී පසුගිය නොවැම්බර් 10 වන දින පැවැත්විණ.

යුද්ධ හමුදා මූලස්ථානයේ පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද එම උත්සව අවස්ථාවට අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධානත්වය එහි දැරීය. යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථාපිත අධ්‍යක්ෂ මණ්ඩලයන්හි රාජකාරී කරනු ලබන හමුදා පිරිස් අතුරින් තෝරාගත් ප්‍රතිලාභීන් 250 දෙනකු සඳහා එහිදී වියළි ආහාර පාර්සල් බෙදාදෙනු ලැබීය. මෙම අවස්ථාවට පාබල අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ඒසී ළමාහේවා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඇතුළු නිලධාරීන් පිරිසක්ද සහභාගී වූහ.

# කෙඩෙට් නිලධාරීන් හා යුද්ධ හමුදාධිපති අතර හමුවක්





දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 91, 91 බී, SC 19, 61 (ස්වේච්ඡා) කණ්ඩායම්, කාන්තා කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 19, 18 (ස්වේච්ඡා) කණ්ඩායම් යටතේ පුහුණුව ලබන කෙඩෙට් නිලධාරීන් සහ නිලධාරිනියන් පිරිසක් පසුගිය නොවැම්බර් 10 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ. මෙම පිරිසට එම විද්‍යාපීඨයේ පුහුණුව හදාරන සැම්බියාව සහ මාලදිවයින යන රටවලට අයත් කෙඩෙට් නිලධාරීන් නිලධාරිනින්ද සහභාගී වූහ.

එම සංචාරයේදී කෙඩෙට් නිලධාරී පිරිස විසින් යුද්ධ හමුදා විද්‍යාපීඨය මගින් පවත්වනු ලබන පර්යේෂණ ව්‍යාපෘතීන්හි අවසාන ඉදිරිපත් කිරීමේ කොටසක් ලෙස, "රුසියානු සහ යුක්රේන ගැටුම සහ එමගින් දකුණු ආසියාවට ඇති වන බලපෑම්" යන කාලීන තේමාව යටතේ යුද්ධ හමුදාධිපතිතුමාගේ අදහස් විමසන ලදී. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුළු උපදේශක නිලධාරීන් කිහිප දෙනකුද සහභාගී වූහ.

# ජන දිවි නැගුමට අත්වැලක්

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු විසින් ලබාදුන් උපදෙස් මත යුද්ධ හමුදා භටපිරිස්, සිවිල් කාර්ය මණ්ඩලය සහ ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ ආර්ථික දුෂ්කරතා අවම කරගැනීමට සහනයක් සැලසීමේ අරමුණින් ඔවුන් වෙත වියළි සලාක පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 12 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපද පරිශ්‍රයේදී පැවැත්විණි.

එහිදී, හෝමාගම ප්‍රදේශයේ පදිංචි තෝරාගන්නා ලද දැඩි ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන සිවිල් වැසියන් 250 ක් වෙනුවෙන් එහිදී වියළි සලාක පිරිනැමිණි. යුද්ධ හමුදාව විසින් සිවිල් වැසියන් වෙනුවෙන් සිදුකරනු ලබන ප්‍රජා සත්කාරක සේවාවන් අගයමින් නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ උපකුලපති පූජ්‍ය බෝදාගම චන්දිම නායක හිමිපාණන් විසින් එම වියළි සලාක තොගය සඳහා අනුග්‍රහය ලබාදුන් සේක. ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ එම මූලස්ථානය භටපිරිස් විසින් හමුදාපති ලේකම් කාර්යාලය සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය සමගින් එක්ව මෙම ප්‍රජා සත්කාරක වැඩසටහන සිදුකරන ලදී.

තවද, පනාගොඩ යුද්ධ හමුදා ජනපදයෙහි ස්ථාපිත ගෘහස්ථ ක්‍රීඩාංගනයේදීද එම ජනපදයෙහි රාජකාරියෙහි නියුතු භටපිරිස් සහ සිවිල් කාර්ය මණ්ඩල සාමාජිකයන් 200 ක් වෙත වියළි සලාක පාර්සල් බෙදාදීමද එහිදී සිදුවිය. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ මාර්ගෝපදේශයන්ට අනුව එම සේවා වනිතා ඒකකය විසින් ඊට අනුග්‍රාහකත්වය දක්වනු ලැබීය.









# රණවිරු නිවාස අරමුදලෙන් විරු නිසට සෙවණ





රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ක්‍රියාත්මක කරනු ලබන යුද්ධ හමුදාධිපති රණවිරු නිවාස අරමුදලේ 8 වන අදියර යටතේ යුද්ධ හමුදා සාමාජිකයින්ට නව නිවාස ඉදිකිරීමට හෝ අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවාසයන්හි කටයුතු නිමකිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 29 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

රණවිරු නිවාස අරමුදලේ 8 වන අදියර යටතේ නව නිවාස 31 ක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1.5 ක් සහ අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවාස 40 ක ඉදිකිරීම් සඳහා රුපියල් 750,000/- ක් වශයෙන් ලබාදීම සඳහා එහිදී යුද්ධ හමුදාධිපතිගේ අනුමැතිය හිමිව ඇත. මෙම අවස්ථාවට නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ මෙන්ම රණවිරු සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එම් මායාදුන්න ආර්එස්පී යූඑස්පී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කරනු ලබන "විශ්‍රාමිකයන්ගේ රැකියා බැංකුව" (**Veterans Job Bank**) නව වෙබ් අඩවිය එළිදැක්වීම ද මෙම අවස්ථාවට සමගාමීව යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි. විවිධ වෘත්තීය විශේෂඥතාවයන්ගෙන් සමන්විත විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයන්ට තම සුදුසුකම් මත රැකියාවක් සොයාගැනීම සඳහා මෙම වෙබ් අඩවිය ප්‍රයෝජනවත් වනු ඇත.

ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මෙම නව වෙබ් අඩවිය එළිදක්වනු ලැබිය. දිවයින පුරා ස්ථාපිත සමාගම් 13 ක් මේ වනවිට එහි ලියාපදිංචි වී ඇත. මෙම අවස්ථාව සඳහා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් ජේඒආර්එස්කේ ජයසේකර යූඑස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන්, සෙසුනිලයන්, ප්‍රතිලාභීන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් පිරිසක් සහභාගී වූහ.



# නොහැක්කක් නොමැති විරුවන්ගේ ආඩම්බර විසිරයාම



කමාන්ඩෝ පුහුණු පාඨමාලා අංක 50 යටතේ පුරා මාස 18 කට අධික කාලයක් ක්‍රියාන්විත උපායමාර්ග පිළිබඳ විශිෂ්ට වූ පුහුණුවක් හැදෑරූ නිලධාරීන් 06 දෙනකු සහ සෙසුනිලයින් 366 දෙනකුගේ විසිරයාම පසුගිය නොවැම්බර් 26 වන දින කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රයේදී අභිමානවත්ව පැවැත්විණි.

මාතෘභූමියේ ආරක්ෂාව වෙනුවෙන් ඕනෑම කැපකිරීමක් සිදුකිරීමට නිරතුරුවම සූදානමින් සිටිමින් ජාතියේ අභිමානය සුරැකීම උදෙසා විශිෂ්ඨයින් අතර විශිෂ්ටයින් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුවට එක්වූ කමාන්ඩෝ භටයින්ගේ එම විසිර යාමේ පෙළපාලියට කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ගේ ආරාධනයෙන් ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු සහභාගී විය.



සුවිශේෂී පුහුණුවක් හැදෑරීමෙන් අනතුරුව විශිෂ්ටයකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුවට එක්වීම සංකේතවත් කරමින් ලෝකයේ විශේෂිත හමුදා සෙබළුන් පමණක් පළඳින "මෙරූන් හිස්වැසුම" මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සපැමිණි යුද්ධ හමුදාධිපති සමඟ එක්ව කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී, කමාන්ඩෝ බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීඑම්එන් හෙට්ටිආරච්චි ආර්ඩබලිව්පී ආර්එස්පී, කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් බීඑම්එස්කේකේ ධර්මවර්ධන ආර්ඩබලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් විසිරයන කමාන්ඩෝ භටයින් වෙත ප්‍රදානය කළහ.





ආරාධිත අමුත්තන්, විසිරගිය අයවලුන්ගේ පවුලේ සාමාජිකයන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති එම අභිමානවත් අවස්ථාවේදී කමාන්ඩෝ සෙබළුන් පෑ සජීවී සංදර්ශනය කුඩාඹිය කඳවුරු පරිශ්‍රයේ ගිගුම් දුන්නේය.




> "ගුවන දෙරණ දියඹ සිසාරා හරඹ පෙන්වූ කමාන්ඩෝ විරුවන්ගේ රණකාමීත්වය රැස්වසිටි සැමගේ නෙතට කඳුලක්ද හදවතට ආඩම්බරයක්ද ගෙනදුන් වෛතිහාසික අවස්ථාවක් විය. උපන්බිම සුරකින උතුම් විරු පුතුන්ගේ පළමු පා සටහන එදින එලෙස සනිටුහන් වූයේ මව්බිමට අභිමානයද එක්කරමිනි"

# රතු කුරුස සංවිධානයේ සහයෝගය යුද්ධ හමුදාධිපති ගේ ඇගයුමට

ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නියෝජිත පිරිසක් පසුගිය නොවැම්බර් 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ. මෙම අවස්ථාව සඳහා කොළඹ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නියෝජිත කණ්ඩායමේ ප්‍රධානී සෙවරින් චාපාස් (Severine Chappaz) මෙනවිය, ශ්‍රී ලංකාව සහ බංගලාදේශය සඳහා ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ සන්නද්ධ හමුදා නියෝජිත ඇල්බට් ස්චොනෙවෙල්ඩ් (Albert Schoneveld) සහ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ සන්නද්ධ හා ආරක්ෂක හමුදා වැඩසටහන් නිලධාරී චන්න ජයවර්ධන යන මහත්වරු ද එක්වූහ.



මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමඟ සහයෝගයෙන් කටයුතු කරන ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ සාමාජිකයන් සමඟින් අන්‍යෝන්‍ය අවශ්‍යතා පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමේ මූලික අභිප්‍රායෙන් මෙම සුහද හමුව පැවැත්විණි.



# පාබල හමුදාවට

## නවවන කණ්ඩුලගේ සම්ප්‍රාප්තිය

වසර 141 ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව (ශ්‍රීලපාහ) විසින් 1960 වර්ෂයේ සිට 2021 අප්‍රේල් මස 28 වන දින තෙක් ''මංගල වස්තුව'' ලෙසින් හස්ති රාජයකු විවිධ සම්මාන උත්සව සහ දෙස් විදෙස් රාජ්‍ය නායකයින් වෙනුවෙන් පිරිනමන සම්මාන මුර හා පෙළපාළි සඳහා යොදාගන්නා ලදී. ඒ තුළින් ශ්‍රී ලාංකීය අභිමානය ඉතාමත් ඉහළින් නිරූපණය වන ලදී. පවතින නෛතික රාමුව තුළ නවවන කණ්ඩුල ලෙස නව අලි පැටවකු ලබාගැනීම වෙනුවෙන් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයුගේ අධීක්ෂණය යටතේ කටයුතු සම්පාදනය කෙරිණ. මෙම ක්‍රියාදාමයේදී එවක මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස කටයුතු කළ බ්‍රිගේඩියර් ටීසීකේ පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ වත්මන් රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් එම්පීඑස්පී කුලසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හා නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ක්‍රියාකාරී කාර්යභාරයක් සිදුකරනු ලැබූහ. එහිදී දෙහිවල සත්ත්ව උද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, රිදීගම සෆාරි උද්‍යානය හා පින්නවල අලි සුරක්ෂිතාගාරය යන ස්ථානයන්හි සිදුකරන ලද නිරීක්ෂණ චාරිකාවන් හි ප්‍රතිඵලයක් වශයෙන් වනජීවී සහ වන සංරක්ෂණ අමාත්‍යංශය, නීතිපති දෙපාර්තමේන්තුව හා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ඇතුළු අනුබද්ධිත රාජ්‍ය ආයතන සහාය ඇතිව පින්නවල අලි



සුරක්ෂිතාගාරයේ වාසය කරන ''නිල්ගල'' නමැති අලි පැටවා නීත්‍යානුකූලව මෙම රෙජිමේන්තුව වෙත පවරා ගැනීමේ කටයුතු සිදුකරනු ලැබීය.

ඒ සමගම මෙම නිල්ගල අලි පැටවාගේ රාජකාරීන් සිදුකිරීම වෙනුවෙන් පළපුරුදු ඇත්ගොව්වන් දෙදෙනකුගේ බඳවාගැනීම් කටයුතුද කඩිනමින් සිදුකෙරුණි. තවද අලි පැටවාගේ මූලික පුහුණුවීම් සහ අලිපැටවා ඔවුන් වෙත හුරු කරගැනීම පිණිස එසේ බඳවාගත් ඇත්ගොව්වන් අලිපැටවා නවාතැන් ගෙන සිටි පින්නවල අලි සුරක්ෂිතාගාරය වෙත අනුයුක්ත කිරීමටද කටයුතු සිදුකෙරිණි.

ඒ අනුව පුරා වසර එකහමාරක් තිස්සේ මෙම අලිපැටවා ලබාගැනීම වෙනුවෙන් කළ මෙහෙයුම මල්ඵල ගන්වමින් අලි පැටවා රෙජිමේන්තුවට නීත්‍යානුකූලව පවරා ගැනීම වෙනුවෙන් ගිවිසුම අත්සන් තැබීම ඉකුත් නොවැම්බර් මස 23 වන දින දෙහිවල ජාතික සත්ත්ව උද්‍යානයේ දී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ගේ සුරතින් සිදුවිය.

# ජන දිවියට සත්කාරයක්





හිටපු යුද්ධ හමුදාධිපති විශ්‍රාමික ජෙනරාල් ජගත් ජයසූරිය ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, මංජුලා ජයසූරිය මහත්මිය සහ දානපතීන් පිරිසකගේ පූර්ණ දායකත්වයෙන් යුතුව තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශය තුළ ජීවත්වන දිළිඳු පවුල් සඳහා පෝෂණ මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 06 වන දින එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණ. ඒ සඳහා පවුල් 65 ක් තෝරාගෙන තිබූ අතර, එම උත්සවය 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ උපදෙස් හා මගපෙන්වීම මත 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදුකරන ලදී.

# රාජ්‍ය තාන්ත්‍රිකයින් රැසක් ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) හි සංචාරයක



ශ්‍රී ලංකාවේ දකුණු කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජ්‍ය උපදේශිකා ඇන්ඩිරී රෝසෙන් (Anderee Rosen) මහත්මිය පසුගිය නොවැම්බර් 07 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) හි සංචාරයක නිරත වෙමින් එහි ආඥාපති සමඟින් සුහද සාකච්ඡාවක නිරත වූවාය.

මෙම සාකච්ඡාවන්හිදී යාපනය අර්ධද්වීපයේ යුද්ධ හමුදාව සහ සිවිල් ජනතාව අතර සහයෝගීතාවය, සමාජ සුබසාධක ව්‍යාපෘති, ආරක්ෂක තත්ත්වය සහ සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරිණ.



ශ්‍රී ලංකාවේ දකුණු අප්‍රිකානු මහ කොමසාරිස් සැන්ඩිල් එඩ්වින් ස්චාක් (Sandile Edwin Schalk) මහතා පසුගිය ඔක්තෝබර් 31 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) හි සංචාරයක නිරත වෙමින් එහි ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ හමුවී සාකච්ඡාවක නිරත විය.



ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් විකාස් සූඩ් (Captain Vikas Sood) මහතා පසුගිය නොවැම්බර් 03 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) හි සංචාරයක නිරත වෙමින් ආඥාපති හමුවූ අවස්ථාව.

# පාකිස්ථාන මහ කොමසාරිස්වරයාගේ සංචාරය





ශ්‍රී ලංකාවේ පකිස්ථාන ඉස්ලාමීය ජනරජයේ මහ කොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) උමාර් ෆාරුක් බුර්කි, Hi (M), පසුගිය නොවැම්බර් මස 24 වැනි දින මන්නාරම ප්‍රදේශයේ සිදුකරන ලද සංචාරය අතරතුරදී 54 වන පාබල සේනාංක මූලස්ථානයටද පැමිණෙන ලදී. 543 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීසී හරස්ගම ආර්එස්පී සහ 54 වන පාබල සේනාංකයේ කර්නල් ප්‍රධාන මාණ්ඩලික කර්නල් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී විසින් එහිදී මහ කොමසාරිස් තුමා පිළිගනු ලැබූහ. මෙම සංචාරය සඳහා පකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයේ මාධ්‍ය ලේකම්වරියද සහභාගී වූවාය.



## හිසට සෙවණක්

65 වන පාබල බලසේනා බලප්‍රදේශයේ ජනතාවගේ සමාජ තත්ත්වය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීමේ අරමුණින් මඩු, පෙරියපණ්ඩිවිරිච්චාන් ප්‍රදේශයේ පදිංචි රාසු කාලිඅම්මා මහත්මිය වෙනුවෙන් ස්ථිර නිවසක් ඉදිකර පසුගිය නොවැම්බර් 17 වන දින නිවැසියන්ට භාරදීම ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඊඒඩීපී එදිරිසිංහ පීඑස්සී ගේ මගපෙන්වීම මත 653 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීඑන්සී සේරසිංහ ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණයෙන් සිදුකෙරුණු මෙම නිවස ඉදිකිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන රජය විසින් ලබාදී තිබූ අතර, 24 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් ඊට ශ්‍රම දායකත්වය ලබාදුන්හ. තවද, නිවසට අවශ්‍ය ගෘහභාණ්ඩ, වියළි සලාක හා පවුලේ දරුවන් සඳහා පාසල් උපකරණ ප්‍රදානය කිරීමද මීට සමගාමීව සිදුකෙරිණ. මෙම අවස්ථාවට එම පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී, 24 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී, ප්‍රාදේශීය ලේකම් ඇතුළු යුද්ධ හමුදා නිලධාරීන් සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# එක්සත් ජනපද තානාපති කාර්යාලයේ නියෝජිත පිරිසක් වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ සංචාරයක

මෙරට එක්සත් ජනපද තානාපති කාර්යාලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී ලෙස සිය ධූරයේ රාජකාරී භාරගත් ඩග්ලස් සොනෙක් මහතා (*Mr Douglas Sonnek*) ඉකුත් ඔක්තෝබර් 24 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හි සිය ප්‍රථම නිල සංචාරය සිදුකරනු ලැබීය.

එහිදී, වන්නි ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ඔහුව උණුසුම් අයුරින් පිළිගන්නා ලද අතර, අනතුරුව පැවති සුහද සාකච්ඡාවේදී වන්නි ප්‍රදේශයේ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ආරක්ෂක හමුදාවන් සිවිල් ජනතාව සමඟ එක්ව ප්‍රදේශයේ සංවර්ධන වැඩසටහන් වැඩිදියුණු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග, කෘෂිකාර්මික කටයුතු සඳහා යුද්ධ හමුදාවේ දායකත්වය සහ ප්‍රදේශයේ ආරක්ෂාව යන කරුණු කෙරෙහිද අවධානය යොමුකරන ලදී. මෙම සුහද හමුව සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී සහ ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් ඇන්තනි නෙල්සන් (*Lieutenant Colonel Anthony Nelson*), සහකාර ආරක්ෂක උපදේශක සෙත් නෙවින්ස් මහතා (*Mr Seth Nevin*) සහ දේශපාලනික අංශ නිලධාරී අනාමිකා චක්‍රවර්ති (*Ms Anamika Chakravorty*) මහත්මියද එක්ව සිටියහ.



# 19 වසරක අභිමානය සැමරේ





2022 ඔක්තෝබර් 30 වන දිනට යෙදුණු ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) 19 වන සංවත්සරය එහි ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් එම මූලස්ථානයේදී සැමරිණ. එහිදී එම හටපිරිස්වලට සෙත් පතා පැවති විශේෂ බෝධිපූජා පිංකම හා පසුදින උදෑසන පූජනීය සෝමාවතිය විහාරස්ථානය වෙත කිරි ආහාර පූජාවක් හා මහා සංඝරත්නය උදෙසා දහවල් දානය පිළිගැන්වීම සිදුවිය.

තවද එම මූලස්ථානයේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් වෙත බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික ගේ සුරතින් වියළි සලාක මළු බෙදාදීමක්ද සිදුකෙරුණු අතර, සන්ධ්‍යාවේ මූලස්ථාන පරිශ්‍රයේදී උත්කර්ෂවත් සංගීත සංදර්ශනයක් ද පැවැත්විණ.

# රතු කුරුස ප්‍රධානීහු නැගෙනහිර ආඥාපති හමුවෙති



ජාත්‍යන්තර ශ්‍රී ලංකා රතු කුරුස සංගමයේ ප්‍රධානීහු පිරිසක් සහ සහකාර නිලධාරීහු පිරිසක් පසුගියදා නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී මූලස්ථාන කාර්යාලයේදී හමුවූහ. එහිදී අන්‍යෝන්‍ය සහයෝගය, මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂීය නීතිය ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව (රතු කුරුස සංගමය) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම පිළිබඳ අදහස් හුවමාරු කෙරිණ.

# රන් අස්වනු නෙළීමේ උත්සවය





2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ භටපිරිස් විසින් නැවත වගාකරන ලද කුඹුරුවල ප්‍රථම අස්වනු නෙළීමේ මංගල්‍යය ඉකුත් නොවැම්බර් 11 වන දින ගිරිතලේ ප්‍රදේශයේදී සිදුකරන ලදී. මේ සඳහා එම ඒකක අණදෙන නිලධාරී මේජර් එන්පීඊඑන් තේරංගම යූඑස්පී එල්එස්සී සමඟින් අනෙකුත් නිලධාරීන්, සෙසුනිලයින් සහ ගම්වාසීන් සහභාගී වූහ. පුරන් කුඹුරු නැවත වගාකිරීමේ ජාතික වැඩසටහනට සමගාමීව මෙම කටයුත්ත සිදුවිය.





# ආත්මාරක්ෂක සටන් පුහුණු සැසියක්

ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ අදහසකට අනුව 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ උපදෙස් පරිදි ආරක්ෂක සේනා (මුලතිව්) බලප්‍රදේශයේ රාජකාරී කරනු ලබන ඒකකයන්හි භටපිරිස්වල සහභාගීත්වයෙන් ආත්ම ආරක්ෂක සටන් පුහුණු සැසියක් පසුගිය ඔක්තෝබර් 20 වන දින කිලිනොච්චිය ක්‍රීඩා සංකීර්ණයේදී ආරම්භ කෙරිණි.

දින පහකින් සමන්විත වූ මෙම පුහුණු සැසිය ආත්ම ආරක්ෂක සටන් පුහුණුකරු ප්‍රජලිත පුෂ්පකුමාර මහත්මා විසින් මෙහෙය වූ අතර, එම අවස්ථාව සඳහා 571,572 හා 573 පාබල බලසේනාධිපතිවරු, අණදෙන නිලධාරීන් ඇතුළු නිලධාරීන් 15 දෙනකු හා සෙසුනිලයින් 200 දෙනකු සහභාගී වූහ.

# අකුරු කරන්නට දිරියක් - ජන දිවියට සවියක්







572 වන පාබල බලසේනාධිපතිගේ අදහසකට අනුව 6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බලප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් 20 ක් සඳහා වියළි සලාක මළු හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් 20 වන දින ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් විශ්වමඩු විද්‍යාලයේදී පැවැත්විණි. 6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් යූබීකේ සුභසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සම්බන්ධීකරණයෙන් "නිත්මිර ඇපරල්" අධිපති නිශේද්‍ර බණ්ඩාර මහතා එම මාහැඟි සත්කාරය සඳහා අනුග්‍රාහක දායකත්වය ලබාදී තිබිණි.

මෙම අවස්ථාවට 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, 571,572 හා 573 පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# දශකයක අභිමානය සැමරේ

ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) 10 වැනි සංවත්සරය ඉකුත් නොවැම්බර් 15 වන දින ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සමරනු ලැබීය. එහිදී ආඥාපති වෙනුවෙන් පැවැත්වූ සම්මාන පෙළපාළිය, හටපිරිස් ඇමතීම හා සියළු නිල දිවා භෝජනය එකී සංවත්සර කටයුතු අතර ප්‍රධාන විය. මෙම අවස්ථාව සඳහා 61 සහ 14 වන පාබල සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, අණදෙන නිලධාරීන් ඇතුළු ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) මාණ්ඩලික නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් රැසක් සහභාගී වූහ. 2022 නොවැම්බර් 15 වන දින ආරම්භ කරන ලද ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර), බස්නාහිර, වයඹ, සබරගමුව සහ දකුණ යන පළාත් හතරක් සහ දිස්ත්‍රික්ක නවයක් ආවරණය වන පරිදි තම රාජකාරි ඉටුකරනු ලබයි.



# කටුකැලියාව බළඇණි පුහුණු පාසලේ නිල සංචාරයක්

1 ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී බලකායේ බළඇණි පුහුණු පාඨමාලාව කටුකැලියාව බළඇණි පුහුණු පාසලේදී 2022 සැප්තැම්බර් 20 සිට නොවැම්බර් 05 වන දින දක්වා පැවැත්විණ. එම පුහුණු කටයුතු පිළිබඳ සොයාබැලීම සඳහා ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පසුගිය නොවැම්බර් 04 වන දින එහි නිල සංචාරයක නිරත විය. එහිදී, ආඥාපති විසින් කඳවුර අවට ස්ථාන, උපදේශකවරුන්ගේ හා සිසුන්ගේ සුබසාධන කටයුතු සම්බන්ධව නිරීක්ෂණය කළ අතර, එහි යටිතල පහසුකම් පුළුල් කිරීම සබැඳිව පුහුණු පාසලේ නිලධාරීන්ට උපදෙස් ලබාදීමටද කටයුතු කරන ලදී.







# සමාධි බුද්ධ ප්‍රතිමාවක් හා අභිනව බුද්ධ මන්දිරයක්

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ අදහසකට අනුව කඳවුරු පරිශ්‍රයේ ඉදිකරන ලද සමාධි බුද්ධ ප්‍රතිමාව හා බුද්ධ මන්දිරය පසුගිය නොවැම්බර් 05 වන දින නිරාවරනය කෙරිණ. යුද්ධ හමුදා බෞද්ධ බලමණ්ඩලය සහ ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) හි රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින්ගේ මූල්‍ය දායකත්වය මේ සඳහා හිමිවිය. චිත්‍ර හා මූර්ති ශිල්පී පීඑම්ජී රෝහණ මහත්මා විසින් නිමකරන ලද එම සමාධි බුද්ධ ප්‍රතිමාවෙහි නේත්‍රා තැබීම හා අභිනව බුද්ධ මන්දිරය විවෘත කිරීම එදින උදැසන යෙදුණු සුබ මොහොතින් මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ සිදුකෙරිණ.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ජාතික ක්‍රීඩා සභාවේ සභාපති හිටපු ක්‍රිකට් ක්‍රීඩක අර්ජුන රණතුංග මහත්මා, ඉදිරි නඩත්තු පෙදෙස (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් එම අවස්ථාවට සහභාගී වූහ.



# ජන දිවියට

## අත්වැලක්



ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ මගපෙන්වීම මත ආර්ථික වශයෙන් ඉතා අසීරු කාලසීමාවක් මධ්‍යයේ කටයුතු කරන ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති කහගොල්ල තේවතු සමාගම අවට වෙසෙන පවුල් 75 ක් සඳහා රුපියල් 7500.00 ක වටිනාකමකින් යුත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 05 වන දින සිදුකෙරිණ. මෙම මාහැඟි කටයුත්ත සඳහා පූර්ණ අනුග්‍රාහකත්වය කොළඹ ප්‍රදේශයේ පදිංචි ව්‍යාපාරික ක්‍රිෂ්ගෝපි මහතා විසින් ලබාදෙන ලදී.

## සංචාරයක මතක සටහන්

යුද්ධ හමුදා පාබල අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් හා ගැමුණු හේවා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒසී ලමාහේවා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් නොවැම්බර් 29 වන දින මාතර ලන්දේසි කොටුව තුළ පිහිටා ඇති 3(සේවා) බළඇණිය ගැමුණු හේවා බලකායේ චාරිකාවක නිරතවිය. එහිදී, ඒකකය වෙතින් පිදුනු ගෞරව සම්මාන මධ්‍යයේ සපැමිණි රෙජිමේන්තු අධිපති එහි හටපිරිස් අමතමින් ඔවුන්ගේ පාලන අවශ්‍යතා හා සුබසාධන කටයුතු පිළිබඳවද සොයාබැලීය.





# “යුද සාහිත්‍යය” දේශන මාලාවක්





යුද්ධ හමුදා මූලස්ථානයේ පැවති "යුද සාහිත්‍යය" දේශනය



දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයේ කෙඩෙට් නිලධාරීන් සඳහා පැවති "යුද සාහිත්‍යය" දේශනය

තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට දායක වූ විරුවන් අගයමින් එකී මතක හා අත්දැකීම් පිළිබඳ නව පරපුර දැනුවත් කිරීම වෙනුවෙන් වූ "යුද සාහිත්‍යය" දේශන මාලාවක් පසුගියදා යුද්ධ හමුදා අංශ, ආයතන රැසකදී පැවැත්විණ. ඒ යටතේ දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨය, කුට්ටිගල වෘත්තිය පාසල හා යුද්ධ හමුදා මූලස්ථානයේදී එම දේශන පැවැත්විණ. යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් පැවැත්වූ මෙම දේශන එහි සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද විසින් මෙහෙයවන ලදී.

# නායකත්ව පුහුණු වැඩමුළුවක් රුහුණු විශ්වවිද්‍යාලයේදී





61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ආර්ආර් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ උපදෙස් පරිදි නායකත්ව පුහුණු වැඩමුළුවක් රුහුණු විශ්ව විද්‍යාලීය තාක්ෂණික පීඨයේ නවක සිසුන් 300 දෙනකු වෙනුවෙන් එම විශ්වවිද්‍යාලීය පරිශ්‍රයේදී පසුගිය ඔක්තෝබර් 20 වන දින පැවැත්විණ. නවක විශ්වවිද්‍යාල සිසුන්ගේ පෞරුෂයත්වයල ආකල්ප හා නායකත්ව ගුණාංග වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කළ මෙම වැඩමුළුව සඳහා 613 පාබල බලසේනා මූලස්ථානය හා 3(සෙව්) බළඇණිය ගැමුණු හේවා බලකාය වෙතින් උපදේශක සහාය ලබාදෙන ලදී.





# තෘප්තිමත් හමුදාවක් සඳහා මනෝවිද්‍යාත්මක මඟපෙන්වීමක්

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් "තෘප්තිමත් හමුදාවක් සඳහා මනෝවිද්‍යා උපදේශනය" යන මැයෙන් වූ දේශන මාලාවක් අරඹා ඇත. එහි අදියර කිහිපයක් පසුගියදා යුද්ධ හමුදා මූලස්ථානයේදී සහ මූලික යුධෝපකරණ ගබඩාව - රාගම හිදී පැවැත්විණ. වෘත්තීය තුළ හා පුද්ගලිකව හමුදා සාමාජිකයින් මුහුණදෙන ගැටළුවලදී ඇතිවන ව්‍යාකූල මානසික තත්ත්වය සමනය කොට ඔවුන්ගේ චිත්ත ධෛර්යය නංවාලීම හා තෘප්තිමත්ව තම රාජකාරියේ නියැලෙන්නේ කෙසේද යන්න පිළිබඳව පුළුල් දැනුමක් ලබාදෙන එම දේශනය මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී 1 ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක ගරෙ විසින් මෙහෙයවන ලදී.



# ආත්මාරක්ෂක හැකියාවන් වැඩිදියුණු කරමින්



මාලි රාජ්‍යයේ සාමසාධක රාජකාරී සඳහා සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම (මාලි) අදියර "බී" 01 ලෙස සහභාගීවීමට නියමිත රෙජිමේන්තු 16 කට අයත් නිලධාරීන් 22 දෙනකු හා සෙසුනිලයින් 221 දෙනකුගෙන් යුත් භටපිරිස් වෙත ආත්ම විශ්වාසය සහ ආත්මාරක්‍ෂක හැකියාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් ප්‍රතිවාදීන්ට පහරදීමකින් තොරව පාලනය කිරීමේ සටන් කලාවෙහි (AIKIDO) පුහුණු වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් 29 සහ 30 යන දෙදින මාලි රාජ්‍යයේ සාමසාධක රාජකාරී සඳහා සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම (මාලි) අදියර "බී" 01 හි අණදෙන නිලධාරී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. මෙම වැඩසටහන ප්‍රවීන සටන් පුහුණු උපදේශක ආර්ඩීජී ප්‍රජලිත පුෂ්පකුමාර මහතා විසින් ගැමුණු හේවා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්විණ.

# 11 වසක ගමන්මඟ අභිමානවත්ව සැමරේ

231 වන පාබල බලසේනාවේ 11 වන බලසේනා සංවත්සරය ඉකුත් නොවැම්බර් 11 වන දින බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එන්කේඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සමරන ලදී. සංවත්සර පැවැත්වීමේ වැඩසටහන ආරම්භයේ දී 231 පාබල බලසේනාවේ බලසේනාධිපතිතුමන්ට මාණ්ඩලික නිලධාරීන් විසින් ඉතා උණුසුම් ලෙස පිළිගත් අතර, කඳවුරු ඇතුල්වීමේ දොරටුව අසලදී කඳවුරු මුරය විසින් ගෞරවය පුදකිරීමෙන් පසුව නිලධාරීන් සහ සෙසුනිලයින් සමූහ ඡායාරූපයකට පෙනී සිටින ලදී.



ඉන් අනතුරුව නිලධාරීන් සහ සෙසු නිලයින් අමතන ලදී. සංවත්සර වැඩසටහන් අතර බලසේනාධිපති වෙනුවෙන් පිරිනැමුණු කඳවුරු සම්මාන මුරයන්, භටපිරිස් ඇමතීම, සියලු නිල දිවාභෝජන සංග්‍රහයට ප්‍රධාන තැනක් හිමිවිය.

# උතුම් ගුණයට පැතුම් කළඹක්



2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායට අයත් සෙ/679265 කෝප්‍රල් නානායක්කාර එන්ඊඩීපී යන කොනොනි ඉකුත් නොවැම්බර් 13 වන දින එම කඳවුර ඉදිරිපිට ඇති අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේ පිහිටි පූජාභූමියේ ආරක්ෂාව සඳහා රාජකාරී යොදවා සිටියේය. එහිදී එම බුද්ධ ප්‍රතිමා වහන්සේ වන්දනා මාන කිරීම සඳහා පැමිණි බැතිමතකු විසින් අමතක වීමකින් එම ස්ථානයේ දමා යන ලද ගමන් බෑගයක් ඔහු වෙත හමුවී ඇත. අනතුරුව ඔහු විසින් එය 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස්සේවා බලකා මූලස්ථානය වෙත භාරදෙන ලදී.

එම ගමන් බෑගය පරීක්ෂා කිරීමේදී ඒ තුළ තිබී රුපියල් ලක්ෂ හතකට අධික වටිනාකමකින් යුත් විදේශීය මුදල් නෝට්ටු, රුපියල් ලක්ෂ තුනක වටිනාකමකින් යුත් කැනොන් වර්ගයේ කැමරාවක්, "පේරුරාජ්‍යයේ" ජැක්ලින්ස් ලින්ඩා නම් කාන්තාවකට අයත් ගමන් බලපත්‍රයක්, දුරකථන ආරෝපකයක්, විදෙස් බැංකු කාඩ්පත් 11 ක් හමුවී ඇත. එහිදී ඒකක අණදෙන නිලධාරී මේජර් පීඊඑන් හේරංගම යූඑස්පී එල්එස්සී මැදිහත්ව එම ගමන් මල්ලේ අයිතිකාරිය වූ විදේශීය කාන්තාව දුරකථයෙන් සම්බන්ධ කර ගනිමින් ඇයව කඳවුර වෙත ගෙන්වා එම මුදල් හා අනෙකුත් භාණ්ඩ ඇය වෙත නිවැරදිව භාරදීමට කටයුතු කරන ලදී. එහිදී, එම රණවිරුවා සිදුකළ උතුම් පරිත්‍යාගය පිළිබඳව මහත් සේ සෑහීමකට පත්වූ එම විදේශීය කාන්තාව සමස්ත යුද්ධ හමුදාවට සිය පැසසුම් පිරිනැමුවේ එතෙරට පවා මනුස්සකමේ අගය දක්වමිනි.

විනයගරුක සොල්දාදුවකු වශයෙන් සෑම දෙනකුටම ආදර්ශයක් ගෙනදුන් එම කොනොනිගේ යහපත් ක්‍රියාකලාපය යුද්ධ හමුදා පොලිස් සේවා බලකායටද, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත්, ශ්‍රී ලංකා මාතාවටත් ඉමහත් අභිමානයක් ගෙනදෙන ආදර්ශවත් ක්‍රියාවකි. රණවිරුවා තුළින් අපි ද ඔහුට තුති මල් මිටක් මෙසේ පිරිනමන්නෙමු.

# 3 (සේවි) ගැමුණු සේවා බලකායේ හටපිරිස්හි තවත් නිර්භීත ක්‍රියාවක්



61 වන පාබල සේනාංකය යටතේ පාලනය වන 3 වන බලඇණිය ගැමුණු සේවා බලකාය නිල්වලා ගඟට මායිම්ව පිහිටා ඇත. ඉකුත් නොවැම්බර් 19 වන දින රාත්‍රි 1945 පැයට පමණ මාතර මහානාම පාලමෙන් නිල්වලා ගඟට පුද්ගලයකු පැන ඇති බව සැලවීමත් ඔහු මුදවා ගැනීමට කඩිනමින් අණදෙන නිලධාරී ඇතුළු සෙබළුන් වහා ක්‍රියාත්මක වූහ. එහිදී, බෝට්ටුවක ආධාරයෙන් ඔහුව බේරාගෙන මාතර මහ රෝහලට ඇතුළත් කිරීමට කටයුතු කෙරිණ. එම උතුම් ක්‍රියාව එම ඒකකයටත් සමස්ත යුද්ධ හමුදාවටත් අත්කර දුන්නේ මහත් ගෞරවයකි. "රණවිරුවා" හි මෙම සටහන එම විරු සෙබළුන් හට උපහාර පිණිසමය.

# ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) සංචාරයක





ශ්‍රී ලංකා යුද්ධ හමුදා හකාස අණසක ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී පසුගිය නොවැම්බර් 09 වන දින ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) හා යටතේ පාලනය වන හකාස ඒකකයන්හි පාලන කටයුතු පිළිබඳ සොයාබැලීම සඳහා සංචාරයක නිරත විය.

# රණක්ෂිතයට පත් විරුවන්ට මානසික සැහැල්ලුවක්



රණක්ෂිතයට පත්ව මිහිඳු සෙත් මැඳුරේ පුනරුත්ථාපනය ලබන රණවිරුවන් පසුගිය නොවැම්බර් 15 වන දින දෙහිවල ජාතික සත්ව උද්‍යානයෙහි විනෝද චාරිකාවක නිරත වූහ. මෙහිදී, එම රණවිරුවන් වෙනුවෙන් ජාතික සත්ව උද්‍යාන කාර්ය මණ්ඩලය විශේෂයෙන් සුරතල් සතුන්ගේ සංදර්ශන සහ උරග විශේෂ සමඟ ඡායාරූප ගැනීමට අවස්ථාව ලබාදුන් අතර, මාර්ග උපදේශකයකුගේ සේවාව සමගින් සත්ව උද්‍යානය දැකබලා ගැනීමටද අවස්ථාව සලසා දෙන ලදී. මෙම චාරිකාවට නේවාසික පුනරුත්ථාපනලාභීන් සමගින් මිහිඳු සෙත් මැඳුරෙහි කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සහ සෙසුනිලයින් ද සහභාගී සහභාගී වූහ. රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ මානසික සුවතාවය ඉහළ නැංවීම සඳහා සංචාරය මහත් සේ ඉවහල් විය.



# දශක තුනක අභිමන සැමරේ

2022 නොවැම්බර් මස 04 වන දිනට යෙදී තිබූ 7 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ 30 වන සංවත්සරය ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් අයිකේජීඑස්එන්ජ් බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සමරනු ලැබීය. ඒ නිමිත්තෙන් යාපනය



ශිෂණි රෝහලේ ලේ බැංකුවේ ඉල්ලීම අනුව 2022 ඔක්තෝබර් 26 වන දින ආරම්භ කරන ලද ලේ දන්දීමේ වැඩසටහන සඳහා ඒකකයෙහි රණවිරුවන් 100 කට අධික පිරිසක් සහභාගී වූ අතර, කයිතඩි ළමා නිවාසය වෙත වියළි සලාක පරිත්‍යාග කිරීමක්ද සිදුකරන ලදී. තවද රටදැය වෙනුවෙන් ජීවිත පූජා කළ රණවිරුවන් හට පිං අනුමෝදන් කිරීමටත් රාජකාරියේ නියුතු රණවිරුවන් හට ආශීර්වාද ප්‍රාර්ථනා කිරීමටත් විශේෂ බෝධිපූජාමය පිංකමක් ද පසුගිය නොවැම්බර් 03 වන දින ඒකක මූලස්ථානයේදී පැවැත්විණි.

එමෙන්ම අණදෙන නිලධාරී හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමා අභිනවයෙන් ඉදිකරන ලද රණවිරු ස්මාරකය විවෘත කිරීම, අණදෙන නිලධාරී විසින් හට පිරිස් ඇමතීම, සියලුනිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම, රූපවාහිනී නැරඹුන් මැදිරියක් විවෘත කිරීම ආදී කටයුතුද සංවත්සර වැඩසටහන් අතර ප්‍රධාන විය.



# දැනුම දිනුමට දිරියක්

11 වන බළඇණිය ගැමුණු හේවා රෙජිමේන්තු බලප්‍රදේශය තුළ මෙවර 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටින දරුවන් හට ශිෂ්‍යත්ව විභාග ආදර්ශ ප්‍රශ්න පත්‍ර බෙදාදීමේ වැඩසටහනක් කොළඹ රාජකීය විද්‍යාල ආදි ශිෂ්‍ය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය ආදි විද්‍යාර්ථි මිතුරු කැලගේ පරිත්‍යාග මත සිදුකෙරිණ. 11 වන බළඇණිය ගැමුණු හේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරීගේ පූර්ණ අධීක්ෂණය යටතේ පසුගිය නොවැම්බර් 04 වන දින සිදුකරන ලද මෙම වැඩසටහනට ඉදිගොල්ලෑව යකාවැව, කුන්චුට්ටුව, කණුගහ වැව, හල්මිල්ලවැටිය සහ රොෂාන් මහානාම ප්‍රාථමික විදුහල්වල ඉගෙනුම ලබන දරු දැරියන් ඇසක් සහභාගී වූහ.

# ශ්‍රී ලංකා සංඥා බලකායේ අභිමානවත් 79 වන සංවත්සරය





ශ්‍රී ලංකා සංඥා බලකා 79 වන සංවත්සර දිනයට සමගාමීව මෙවර එම රෙජිමේන්තු මූලස්ථානයේදී සැමරුම් වැඩසටහන් රැසක් පැවැත්විණ. මවුබිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල මෙහෙවර සිහිපත් කරමින් රෙජිමේන්තු මධ්‍යස්ථාන රණවිරු ස්මාරකය අභියසදී 2022 ඔක්තෝබර් මස 15 වන දින සන්ධ්‍යාවේ පැවති රණවිරු අනුස්මරණ උත්සවය ප්‍රධාන විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විශ්‍රාමික රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් හා මියගිය රණවිරුවන්ගේ ලගම ඥාතීන් සහභාගී වන ලදී.



තවද, එදින සංවිධානය කරනු ලබන සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක් හා පසු දින මහා සංඝරත්නය උදෙසා සාංඝික හීල් දානය පිරිනැමීමක්ද සිදුකරනු ලැබීය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බලකාධිපති ඇතුළු නිලධාරීන්, සෙසුනිලයන් සහ මියගිය රණවිරුවන්ගේ ලගම ඥාතීන් පිරිසක් සහභාගී වූහ.

2022 ඔක්තෝබර් මස 19 වන දින සංඥා බලකාධිපති වෙත සම්ප්‍රදානුකූලව පිරිනමන ලද කඳවුරු මුරයකින් සහ නිලධාරී 36 ක්, සෙසුනිලයින් 233 ක් හා සංඥා බලකා ඒකක 11 කින් සමන්විත පෙලපාලියයක් මගින් ගෞරවනීය උත්තමාචාරය පිරිනමමින් රෙජිමේන්තු සංවත්සර දිනයට අභිමානයක් එක්කරන ලදී. පසුව, යුද්ධ හමුදා සම්ප්‍රදායන් සුරකිමින් එදින දහවල් සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්ද, නිලධාරීන් සඳහා රාත්‍රී භෝජන සංග්‍රහයක්ද පැවැත්විණ.

# දමිළ භාෂා පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් කෙරේ

57 වන පාබල සේනාංකය යටතේ ඇති පාබල බලසේනා, ඒකක සහ පුහුණු පාසල්හි රාජකාරී කරනු ලබන සෙසුනිලයින්ගේ මූලික දමිළ භාෂා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඉකුත් ඔක්තෝබර් 11 වන දින සිට නොවැම්බර් 23 වන දින දක්වා දමිළ භාෂා පුහුණු පාඨමාලාවක් පැවැත්විණ. උතුරු පළාතේ ද්‍රවිඩ ජනයා සමග සුහදත්වය ඇති කිරීම සඳහා යුද්ධ හමුදා සෙබළුන් හට දමිළ භාෂාව පුරුදු පුහුණු කිරීමේ අරමුණින් 57 වන පාබල සේනාංකාධිපතිගේ උපදෙස් පරිදි 573 වන පාබල බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ මෙම පාඨමාලාව පැවැත්විණ.



පාඨමාලාව අවසන සහතිකපත් ප්‍රදානය සඳහා 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී එක්විය. එම අවස්ථාවට 573 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගී වූහ.


# විරු දරු හපන්කම්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් රණවිරු දූදරුවන්ගේ සුබසාධනය උදෙසා දිවයිනේ විවිධ ප්‍රදේශවල පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන අතර, ඒ සඳහා යුද්ධ හමුදා නොවන අයවළුන්ගේ දරුවන් හට ද අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසා දී ඇත. එම පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන අතුරින් පනාගොඩ, මැනිංටවුන් හා ගාල්ල විරු කැකුළු පෙරපාසල්හි ඉගෙනුම ලබන දරු දැරියන් විසින් වර්ෂ අවසාන කලා කුසලතාවයන් එළිදැක්වීම පිණිස පවත්වනු ලැබූ විවිධ ප්‍රසංගය පසුගිය නොවැම්බර් 09 සහ 25 වන දෙදින තුළ කොළඹ ඩීඑස් සේනානායක විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී සහ *"Hall De Galle"* උත්සව ශාලාවේදී පවත්වන ලදී. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය. නැටුම් ගැයුම් වැයුම් පිරි පෙර පාසල් දූ දරුවන්ගේ හපන්කම් රැදි එම විවිධ ප්‍රසංගය එහි පැමිණ සිටි සැමගේ අමන්දානන්දයට හේතු වූහ.





*කොළඹ ඩීඑස් සේනානායක විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පැවති විවිධ ප්‍රසංගය*





*"Hall De Galle" උත්සව ශාලාවේදී පැවති විවිධ ප්‍රසංගය*



# අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාගයක්

යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරී නියුතු සෙසුනිලයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් වෙත සහල් මළු බෙදාදීමේ උත්සවයක් පසුගිය නොවැම්බර් 10 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් එම කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. පවතින ආර්ථික අපහසුතා හමුවේ ඔවුනට සහනයක් සැලසීමේ අරමුණින් යුතුව මෙම මානුෂීය සත්කාරය සංවිධානය කෙරිණ.

# 38 වන වාර්ෂික මහාසභා රැස්වීම



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 38 වන වාර්ෂික මහ සභා රැස්වීම එම ඒකක සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පසුගිය නොවැම්බර් 02 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි. මේ සඳහා සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන් සහ සමාජිකාවන් සහභාගී වූහ. එහිදී, සභාවාරය අරඹමින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ඉදිරි සැලසුම් සහ යෝජිත ව්‍යාපෘතීන් පිළිබඳව දැනුවත් කරන ලදී. දේශන රුහුණු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්ද්‍රිමා ගයාත්‍රී විජේසුන්දර විසින් "ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය හා සමානාත්මතාවය" පිළිබඳ කාලෝචිත දේශණයක් ද එහිදී සිදුකරනු ලැබීය.





# නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ට පරිත්‍යාග

ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රුචිනි ලමාහේවා මහත්මිය ඇතුළු එහි සියලුම සාමාජිකාවන් පාන්ගොල්ල අභිමංසල - 3 සුවසහන නිකේතනයෙහි රණඝෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් සඳහා තේපැන් සංග්‍රහයක් හා ත්‍යාග පාර්සල් පිරිනැමීමක් පසුගිය නොවැම්බර් 07 වන දින සිදුකරනු ලැබූහ. එහිදී, එම රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා පිරිසි කෝප්ප 50 ක් පරිත්‍යාග කිරීමද සිදුවිය. මෙම අවස්ථාවට සඳහා පාන්ගොල්ල අභිමංසල - 3 සුවසහන නිකේතනයෙහි සේනාවිධායක ඇතුළු පිරිසක්ද එක්වූහ.

# විජයබාහු සේවා වනිතා ශාඛාවෙන් කාලීන වැඩසටහනක්




විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහ සභා රැස්වීම පසුගිය නොවැම්බර් 13 වන දින එහි සභාපතිනි කුමුදු මානගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් විජයබාහු පාබල රෙජිමේන්තු "ද සැලියුට්" උත්සව ශාලාවේදී පැවැත්විණ. අදාළ මහා සභා රැස්වීමට සමගාමීව සෙ/524110 කෝප්‍රල් ද සිල්වා කේඑච්පී කොනොනිගේ අසනීප තත්තවයෙන් පසුවන වයස අවුරුදු 06 ක් වූ පසිඳු මහේෂ ලසිත ද සිල්වා ආදරණීය පුතණුවන් හට රෝද පුටුවක් හා පාසල් උපකරණ ලබාදීම සහ මලියදේව ළමා නිවාසයේ නේවාසිකව සිට අධ්‍යාපනය හදාරා විශ්වවිද්‍යාලය ප්‍රවේශය ලබා ඇති මනුල සෙජිත් පුතනුවන් හට ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් හා පාසල් උපකරණ බෙදාදීමද සභාපතිනියගේ සුරතින් සිදුකරනු ලැබුවාය. තවද, එදින මහා සභාරැස්වීම සඳහා පැමිණි සාමාජිකාවන් වෙනුවෙන් කථිකාචාර්ය මනෝවිද්‍යා උපදේශිකා අමා දිසානායක මහත්මිය විසින් "යුද්ධ හමුදා සහකරුවකුගේ බිරිඳ වීම සහ එහි අභියෝග" යන මාතෘකාව යටතේ හරවත් දේශනයක්ද පවත්වන ලදී.

# අභිමංසල 2 - සුවසහන මධ්‍යස්ථානයෙහි සංචාරයක්

විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මිය පසුගිය ඔක්තෝබර් 28 වන දින කඹුරුපිටිය අභිමංසල 2 සුවසහන මධ්‍යස්ථානයෙහි නේවාසිකව වෙසෙන රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම සඳහා සංචාරයක නිරත වූවාය.



උඩවලව විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපොළෙහි අනුග්‍රාහක දායකත්වයෙන් සංවිධානය කළ මෙම සංචාරයේදී එම රණවිරුවන් හට සෞඛ්‍ය සම්පන්න කෙටි ආහාර වේලක් ලබාදීමට හා ඔවුන්ගේ පරිහරණය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ රාශියක් පිරිනැමීමටද කටයුතු කරන ලදී. එම අවස්ථාවට බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීජ්අයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් ද එක්වූහ.

# ගර්භනී මාතාවන්ට අත්‍යවශ්‍ය භාණ්ඩ පිරිනමමින්




යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ උපදෙස් පරිදි 4 වන යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ අනුග්‍රාහක දායකත්වය යටතේ ගර්භනී මාතාවන් 10 දෙනකු වෙත අත්‍යවශ්‍ය භාණ්ඩ ලබාදීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 08 වන දින 4 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේදී සිදුකෙරිණ.

# ස්වයං රැකියා සවිබල ගැන්වීම පිළිබඳ වැඩමුළුවක්





"ස්වයං රැකියා කරන්නන් සවිබල ගැන්වීම" පිළිබඳ වැඩමුළුවක් 2022 නොවැම්බර් 12 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය, හා Eclipse (Pvt) Ltd හි නිර්මාතෘ සහ ප්‍රධාන විධායක නිලධාරී පසිඳු රත්නසේකර මහතා විසින් පොදුසේවා බලකා රෙජිමේන්තු දේශන ශාලාවේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රුචිනා මෙත්තානන්ද මහත්මියගේ මගපෙන්වීමෙන් සහ එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකා රුක්මණී රත්නායක මහත්මියගේ සම්බන්ධීකරණයෙන් පැවති මෙම වැඩමුළුවට එම බලකායේ සෙබළුන්ගේ භාර්යාවන් රැසක් සහභාගී වූහ.

# මානසික සුව පතා සුහද සත්කාරයක්





කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මිය ඇතුළු එහි සාමාජිකාවන් පිරිසක් ඉකුත් ඔක්තෝබර් 23 වන දින මුල්ලේරියාවේ පිහිටි "ජාතික මානසික සෞඛ්‍ය ආයතනයේ" සංචාරයක නිරතවූහ. එම රෝහලේ වාට්ටු අංක 05 තුළ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් විමසා බැලීම එම සංචාරයේ අරමුණ විය. එහිදී, එම රෝගීන් සඳහා ආහාරපාන ආදියෙන් සංග්‍රහ කෙරුණු අතර, ඔවුන්ගේ රසාස්වාදය පිණිස කැලිප්සෝ සංගීත කණ්ඩායමක් සමඟින් සංගීත සන්ධ්‍යාවක් ද පවත්වන ලදී. තවද, එහිදී ආබාධිත පුද්ගලයන් සඳහා ඇවිදින ආධාරකයක්, විදුලි පංකා, සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළු දෛනික අවශ්‍යතාද පරිත්‍යාග කෙරිණ.

# ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි සත්කාරයක්



5 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව වෙතින් 3 වන විශේෂ බලකාය වෙත අන්තර් රෙජිමේන්තු මාරුවීම් ලබා රාජකාරී සිදුකරමින් සිටියදී 1997.09.09 වන දින පුල්මුඩේ ප්‍රදේශයේ ඛනිජ වැලි ප්‍රවාහනය සඳහා පැමිණි නෞකාවට ආරක්ෂාව සැපයීමේ රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව මියගිය සෙ/5කිහු01589 ලා/කෝ ප්‍රියන්ත බණ්ඩාර ආර්එම් යන කොනොනිගේ පියාණන් වෙත ඇසි කාච බද්ධ කිරීම සඳහා රුපියල් 52,300.00 ක මුදලක් දැරීමට ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේවා වනිතා ශාඛා සභාපතිනියගේ මැදිහත්වීමෙන් සිදුකෙරිණ. එම පියා විසින් සිදුකරනු ලැබූ ඉල්ලීමකට අනුව ආරක්ෂක ලේකම්තුමා ගේ උපදෙස් පරිදි මෙම මාහැඟි කටයුත්ත සිදුවිය.



# අපේ හෙළයන්ගේ ගිණි අවි භාවිතය විමසුම

**30** වසරක ශාප ලත් කුරිරු ත්‍රස්තවාදයේ අඳුරු සෙවණැලි මුලිනුපුටා දමා අද අප ගෙවන්නේ සාමකාමී පරිච්ඡේදයකි. අප ලැබූ ජයග්‍රහණයේ සාර්ථකත්වය පිටුපස වූ අවිය අතැතිව සවිය දුන් ඒ වීරෝදාර මානුෂවාදී ප්‍රාණය මෙන්ම, අත දැරූ අවියද ඉතාම වැදගත්ය. මක් නිසාද යත්, වර්තමානයේ දියුණු තාක්ෂණය සමග නවීන පන්නයේ විවිධ අවි ආයුධ භාවිත කළද අප රටට අතීතයේදී එල්ල වුණ සතුරු තර්ජන මැඩලීමට අපගේ හෙළයන්ගේම දැනින් නිපදවා ගත් අවි ආයුධ පිළිබඳව ඉතිහාසගත තොරතුරු ජීවමානව තවමත් සාක්ෂි දරන හෙයිනි.

කඩු, දුනු, ඊතලවලින් සටන් කළ සිංහලයෝ තුවක්කු භාවිතයට පෙළඹී ඇත්තේ පෘතුගීසීන් ලංකාවට පැමිණීමෙන් පසුව බව ඉතිහාසය අධ්‍යනය කිරීමේදී පැහැදිලි වේ. එම යුගය සීතාවක රාජසිංහ (පළමු රාජසිංහ) රජ සමය තෙක් දිව යයි. සීතාවක හමුදාව අති නවීන අවි ආයුධවලින් සන්නද්ධ කිරීමට රාජසිංහ රජතුමාගේ විශේෂ අවධානය යොමු වූ බවත්, ඒ අනුව සිංහලයෝ කෙටි තුවක්කු භාවිතයේදී මහා නිපුනත්වයක් දක්වා ඇති අතර, පෘතුගීසින්ද එය පිළිගෙන ඇති බවත්, නීල් රණවක මහතා විසින් රචිත "සීතාවක රාජසිංහගේ නොනිමි මෙහෙවර" කෘතියේ සඳහන් කර තිබේ. එසේම, කීර්ති ශ්‍රී රාජසිංහ රජු මෙම යුගයේදීද කාලතුවක්කු භාවිත කරන්නට ඇති බවට බොහෝ සාක්ෂි ඉතිහාසය පිරික්සීමේදී හමු වේ. තවද, කන්ද උඩරට රජුගේ ගුණ අගුණ විස්තර කරන "රොබට් නොක්ස්" රජුගේ විනෝද ක්‍රීඩා ගැන ගෙනහැර දක්වමින් ඉලක්කය බලා වෙඩි තැබීමද රජුගේ ප්‍රියතම ක්‍රීඩාවක් බව "එදා හෙලදිව" කෘතියේ විස්තර කර තිබේ.

ක්‍රි.ව 1745 දී, සතර කෝරලය භාර "ලෙව්කේ දිසාව" විසින් සාදා නිමකර කන්ද උඩරට විජය රාජසිංහ රජු වෙත පිරිනැමූ අතිවිශිෂ්ට කාලතුවක්කුවක් "ලෙව්කේ කාලතුවක්කුව" නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් නුවර කෞතුකාගාරයක ප්‍රදර්ශනයට තබා ඇති බව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව විසින් 2014 වසරේ දී සම්පාදිත "125 වසරක ප්‍රත්‍යවලෝකනය" නම් ග්‍රන්ථයේ සඳහන් කර තිබේ.

එදා, උඩරැටියන් හරඹ පෑ තුවක්කු වර්ග අතර ගිණි තුවක්කුව, අත් තුවක්කුව, කොඩි තුවක්කුව, බොන්ඩික්කුලම සහ කාලතුවක්කුව විශේෂිත වූ අතර, ඒවායින් පෘතුගීසීන්ට සිදුවූ විනාශය කෙබඳුදැ යි අප බොහෝ දැනුවත් වෙතැයි සිතමි. මෙම විවිධ තුවක්කු වර්ග භාවිතය සඳහා රජු විසින් පත්කර තිබූ විවිධ සේනාංකවල සිටි සෙන්පතියන්ගෙන් පැවත ආ පෙලපත් නාම අදද සුලභ වේ. ඉංග්‍රීසීන්ද මෙරටට පැමිණීමෙන් පසුව උඩරට සිංහලයන් සමග ඇති වූ බොහෝ සටන්වලදී සිංහලයන් විසින් බහුලව ගිණි අවි භාවිතකර සටන්කර ඇත. මෙරට සිංහලයන්ගේ ගිණි අවි නිපදවීම හා ඒවා යුද උපක්‍රම අනුව භාවිත කිරීම පිළිබඳ ඉංග්‍රීසීන්ද පුදුමයට පත්වන්නට ඇත. "සිංහලයෝ ඔවුන් අසලට එන තෙක් සැඟව සිට එක්වරම පහර දෙති; අඟලක පමණ විෂ්කම්භයක් ඇති වෙඩි



උණ්ඩ පිට කරන ඔවුන්ගේ තුවක්කුවලින් පහර දෙද්දී මා ඊට යාර හයක් පමණ දුරින් සිටින්නට ඇතැයි මම විශ්වාස කරමි" යන්න බ්‍රිතාන්‍ය හමුදාවේ මෙරට සටන් මෙහෙය වූ කපිතාන් බීවර් ගේ අත්දැකීම් "කන්ද උඩරට සටන්" නමැති කෘතියෙන් හමුවේ.

අපේ හෙළයන්ගේ තාක්ෂණික දැනුම හා හැකියාවන් පසක් කරන අදටද පවතින සාක්ෂි අතර, ප්‍රමුඛත්වයක් ගන්නා වැදගත් ස්ථානයක් වන්නේ මැදගොඩ පත්තිනි දේවාලයයි. ඒ අදටත් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින කොඩිතුවක්කුවක් මෙම පත්තිනි දේවාලයේ තැන්පත්කර ඇති නිසයි. මැදගොඩ සන්නසට අනුව එම කොඩිතුවක්කුව පළමුවන රාජසිංහ රජු විසින් මැදගොඩ පත්තිනි දේවාලයට පූජාකර ඇති බව පැහැදිළි වේ. මෙම අවියේ ගිණි හටයේ ඉදිරිපස සවිකර තිබෙන්නනේ ලී කනු දෙකක් මතය. බටය තුළින් වෙඩි බෙහෙත් දමා කොටා අදටත් මෙම කොඩිතුවක්කුව ක්‍රියාත්මක කළහැකි බව, ලේඛක චාමිකර පිලපිටිය මහතා විසින් රචිත "The History of Sri Lanka Fire Arms" කෘතියේ විස්තර කර ඇත.

මෙතෙක් හමු වී ඇති කොඩිතුවක්කු අතරින් විශාලත්වයෙන් වැඩි හා සම්පූර්ණ වානේ යොදගෙන නිමකරන ලද කොඩිතුවක්කුව හමුවන්නේ රත්නපුර ශ්‍රී සුමන සමන් දේවාලයෙනි. මෙම කොඩිතුවක්කුව ලොව පැරණිම කොඩිතුවක්කුව වනු ඇති බවටද බොහෝ පිරිස් මත දරති. මෙය දෙවන රාජසිංහ රජතුමා විසින් සුමන සමන් දේවාලය වෙත පරිත්‍යාගකර ඇත්තේ ශබ්ද පූජාව පැවැත්වීම උදෙසා බව සඳහන් වේ.

රත්නපුර සුමන සමන් දේවාලයේ පෙරහැර වීදි සංචාරය ආරම්භ කිරීම සිදුකරනු ලබන සංකේතය වන්නේද මෙම කොඩිතුවක්කුවෙන් වෙඩිල්ලක් තැබීමයි. අපද කුඩා කල සමන් දේවාලයේ රාත්‍රී පෙරහැර නැරඹීමට ගොස් පෙරහැර ආරම්භ කරන තෙක් පෙරහැර හොඳින් දර්ශනය වන ස්ථානයක් බොහෝ අසීරුවෙන් වෙන්කරගෙන බිමට ඉටිකොළ හෝ පැදුරු එලා ඒ මතට වී නිදි වර්ජිත දෑසින් බලා සිටින විට එකවරම මුළු දේවාල පරිශ්‍රයම ගිගුරුම් දෙමින් කොඩිතුවක්කුවෙන් නිකුත් වන වෙඩි හඬට කලබල වී නොඉවසිල්ලෙන්, දේවාලයේ වීදි දෙසට නෙත් යොමා පෙරහැර දැන් ලඟ එනු ඇතැයි සිතා බලා සිටි හැටි අදටද සිහිගන්වයි. එනමුත් අද එම වෙඩි හඬ නිකුත් වන සෑම මොහොතක් පාසා අහස්කුස පුරා ගිගුම් දෙමින් කියාපාන්නේ අපගේ හෙළයන්ගෙන් සැඟව ගියා වූ දියුණු තාක්ෂණය නොවේදැයි කනස්සලු වූ මනසින් දකිමි.

රාජසිංහ රජතුමා විසින් භාවිත කරන ලද අත් තුවක්කු තුනක් පිළිබඳ විස්තර "මහනුවර යුගයේ වින්ති" නමැති කෘතියේ විස්තර කෙරේ. තවද, එම අත් තුවක්කුවලින් එකක් කොළඹ කෞතුකාගාරයේ තබා ඇති අතර ඉතිරි තුවක්කු දෙක ඇමරිකාවේ සහ රුසියාවේ කෞතුකාගාරවල තැන්පත් කර ඇති බවට එම කෘතියේ වැඩි දුරටත් පෙන්වාදී තිබේ. මෙම අත් තුවක්කුවෙන් රාජසිංහ රජතුමා, පෘතුගීසින් සමඟ සටනට පැමිණි කාපිරි සෙබළකුට වෙඩි තැබූ බවටද තොරතුරු "මන්දාරම් පුවතේ" 342 පද්‍යයෙන්ද කියවේ.

රාජසිංහ රජු විසින් භාවිතකරන ලද අත්තුවක්කු අතරින්, දික්තුවක්කුව (එල්ලය බලා වෙඩි තැබිය හැකි) ඇමරිකාවේ නිව්යෝක්හි පිහිටි මෙට්‍රොපොලිටන්ට් කෞතුකාගාරයේ සුරක්ෂිතව තැම්පත්කර අත. එම තුවක්කුව ඇත්දළ, යකඩ, දැව හා රිදී යොදාගෙන විවිධ කැටයම්වලින් නිමකර ඇති බවත්, එම දික්තුවක්කුව දිගින් අඩි 7 යි අඟල් 2ක් හා බරින් කිලෝ 5 ක් පමණ බරින් යුක්තය. එම අවියේ තාක්ෂණික ලක්ෂණ අනුව එය ස්නයිපර් අවියක් ලෙසට සැලකීම සාධාරණ සැකයකින් තොරව ජාත්‍යන්තරය පිළිගන්නේනම්, දීර්ඝතම ඉතිහාසයක් ඇති ජාතියක් ලෙස එය මොනතරම් ගෞරවයක් දැයි ඕනෑම දේශ හිතෛෂියකුටම සිතිය හැකිය.

දෙවැනි රාජසිංහ රජතුමාට අයත් අනෙක් තුවක්කුව දැනට තැන්පත්කර තිබෙන්නේ රුසියාවේ ශාන්තපීටර්ස්බර්ග් හි පිහිටි හර්මිටේජ් කෞතුකාගාරයේ බවටද ලේඛණ සාක්ෂි දරයි. මෙම තුවක්කුව ඇමරිකාවේ මෙට්‍රොපොලිටන්ට් කෞතුකාගාරයේ තබා ඇති දික්වක්කුවට වඩා දිගින් අඩු අතර, එම අවියද කැටයම් කර ඇත්තේ රාජසිංහ රජ යුගයේ කැටයම්වලින්ම බවටද පැහැදිලි වේ.

බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ මෙරටට හිමි පෞරාණික වස්තු බොහෝමයක් විජාතිකයින් වන එවකට සිටි ආණ්ඩුකාරවරු හා විවිධ රාජ්‍ය නිලධාරීන් විසින් ත්‍යාග පිණිස ලබාදීමට කටයුතු කර තිබේ. තවද, බොහෝ පෞරාණික වටිනාකමක් ඇති දෑ ඔවුන් රැගෙන ගොස් ඇත.

අසීමිත කැපකිරීම් හා දහදිය රුධිරය වගුරා මේ මාතෘ භූමිය ආරක්ෂා කිරීමට එදා උරදුන් හෙළයන් සැමටම මෙය උපහාරයක්ම වේවා!



ශ්‍රී ලංකාවේ විශාලත්වයෙන් වැඩි, වානේවලින් සාදා ඇති ලොව පැරණිතම සිංහල කොඩිතුවක්කුව



සටහන -:
මේජර් ඒම්ජී සාලින්ද වීඑස්බී ශ්‍රීලනාත,
මාති II (මූලය කළමනාකරණ හා ප්‍රසම්පාදන)
ප්‍රර්යේෂණ විශ්ලේෂණ යෝජනා හා සංවර්ධන අංශය,



# ස්වාමි පුරුෂයන්ට දස පනතක්

මිනිසකු සහ ගැහැණියක විවහ වන්නේ ඉදිරි කාලය පුරාවට සාමයෙන්, සමගියෙන් සහ ප්‍රේයෙන් යුතුව ජීවත්වීමටය. එහෙත් බොහෝවිට සිදුවන්නේ ගෙදර දොරේ දහසක් අවුල් වියවුල් සහ අඩදබර සිදුවීමය. ඊට හේතුව බොහෝ දුරටම ගෙදර ස්වාමි පුරුෂයා ස්වකීය ගෘහ මූලිකත්වය ඒකාධිපතිත්වය දක්වා වර්ධනය කරගැනීමය. මේ ලිපිය එවැනි ස්වාමි පුරුෂයන්ට තම බිරින්දෑවරුන් ගැන අලුතින් හිතන්නට කරුණු දහසක් සඳහන් කරන්නකි.

1. ඇගේ දර්ශනයට ඉලක්කයට සහ අදහස් වලට ගරු කරන්න. ඇය ඥාණවන්තියක් වන නිසාය. ඇගේ අදහස්වලට සවන් දෙන්න.

2. ඇය සමඟ කතා කරන්න. ඇය ගැන කතා කිරීමෙන් වළකින්න. ඇයට බලපෑම් කිරීමෙන් වළකින්න. කිසිම විටෙකත් ඇගේ ස්වාමියා වීමෙන් වළකින්න.

ඇයව ඔබට අවශ්‍ය පරිද්දෙන් හදාගන්නට උත්සහ නොකරන්න. එවැන්නකට ඈ අකමැති වන්නේ නම් එසේම එය කළ හැක්කක්ද නොවේ.

3. ඔබට කිසියම් ප්‍රශ්නයකට මුහුධ දෙන්නට සිදුවූ විට ඒ ගැන ඇය සමඟ කතා කරන්න. ඇගෙන් උපදෙස් ලබාගන්න. ඒකාධිපතියකු නොවී හෝ සවන් දෙන්නකු වන්න. ගැටළුවට විසඳුම් කිසි කරදරයක් නොමැතිවම ඔබට ලැබෙනු ඇත.

4. අවංක වන්න. ඇයට කිසිවිටෙකත් බොරු කියන්නට උත්සහ නොකරන්න. ඔබේ හැඟීම් පිළිබඳව විනීතව ප්‍රකාශ කරන්න. සිදුවූ වැරදිවලට සමාව ඉල්ලන්ට පුරුදු වන්න.

**බිරිඳ යනු සේවිකාවක නොවේ. ඔබට බිරිඳක් අවශ්‍ය ඔබට වෙලාවට අවදි කරවීමට කෙනෙක්, කොකියෙක්, පිරිසිදු කරන්නෙක් ලෙස සිටීමට නොවේ. එබැවින් ඇයට උදව් කරන්න. මතක තබාගන්න විවහය යනු සෑම කටයුත්තකම කොටස්කරුවකු වීම පමණකි...**

5. ඇයට නිදහස දෙන්න. ඇයව පාලනය කිරීමෙන් වළකින්න. ඇයටද වෘත්තීය ජීවිතයක් පවතින බව මතක තබාගන්න. එසේම ඇයගේ වෙනත් මිතුරු මිතුරියන් සමඟ කතා කරන්නට ඇයට අවකාශ ලබාදෙන්න.

6. ඇගේ ප්‍රශ්නවලදී වඩාත් සංවේදී වන්න. ඇයට උදව් කරන්න. ඔබට හැකි පමණින් ඇයව ආරක්‍ෂා කරන්න.

7. ඇගේ නම කියා කතා කිරීමෙන් වළකින්න. ඇය ඇයට රිදවීමක් විය හැකි බැවිනි. ඇයට ගෞරවයක් ලැබෙන පරිදි ආදරණීය ලෙස ඇය අමතන්න.

බිරිඳ යනු සේවිකාවක නොවේ. ඔබට බිරිඳක් අවශ්‍ය ඔබට වෙලාවට අවදි කරවීමට කෙනෙක්, කෝකියෙක් පිරිසිදු කරන්නෙක්, ලෙස සිටීමට නොවේ. එබැවින් ඇයට උදව් කරන්න.

8. ඇය සමග තරග කරන්නට යාමෙන් වළකින්න. ඔබ දෙදෙනකු වන බැවින් ඔබ සමග දෙදෙනාගේ ඉලක්කයන්ද වෙනස් වේ. ඔබ දෙදෙනාම හෝ නැතිනම් දෙදෙනාගෙන් කවරකු හෝ වඩා හොඳ අධ්‍යාපනයක් ලැබීමත් වඩාත් හොඳ රැකියාවක නිරත වීමත් වරදක් නොවේ. එවැනි විටෙක ඇයට වඩා ඉහලින් ඔබ සිටින්නට තරග කිරීම වරදකි.

9. එක්ව විනෝද වන්න. ඇය තනි නොකරන්න. ඇයද සිනාසීමට ප්‍රියකරන බව විහිළුවලට ප්‍රියකරන බව අමතක නොකරන්න.

10. ඔබට මුණගැසී ඇත්තේ සුවිශේෂී කාන්තාවකි. ඔබ දෙදෙනා විවහ වූයේ ඒ නිසාය. පහත සඳහන් උපදේශන තුන ඔබ වෙනුවෙන් සැපයීමට පුළුවන.

(අ) බිරිඳ යනු සේවිකාවක නොවේ. ඔබට බිරරිඳක් අවශ්‍ය ඔබට වෙලාවට අවදි කරවීමට කෙනෙක්, කොකියෙක්, පිරිසිදු කරන්නෙක් ලෙස සිටීමට නොවේ. එබැවින් ඇයට උදව් කරන්න. මතක තබාගන්න විවාහය යනු සෑම කටයුත්තකම කොටස්කරුවකු වීම පමණකි..

(ආ) දරුවන් ගැන ඔබ දෙදෙනාම සොයා බලන්න ඔවුන්ගේ ආහාර සැපයීමට, පිරිසිදු කිරීමට ඔබටද හවුල් විය හැකිය. දරුවකු මැදියම් රැයේ අවදිව හඬන විට ඔබද අවදි විය යුතුය. දරුවකු උපන්විට ඔහුගේ කටයුතු වෙනුවෙන් ඔබ නිවාඩු දමා ගෙදර නැවතිය යුතුය.

(ඇ) ඔබේ බිරිඳට ලිංගික කටයුතු සඳහා කවදාවත් බලපෑම් නොකරන්න. එය දූෂණයක් වන බැවිනි. ලිංගික කටයුතු දෙදෙනාගේම අවශ්‍යතාවය පරිදි කර ගත යුතු වේ.



*සටහන*

*1997 අගෝස්තු මනහර ඇසුරිණි.*

# විරු දෑතින්
## පූජා සත්කාරයක්



මන්නාරම දිස්ත්‍රික් රෝහලේ විවිධ අඩුපාඩු මත වසා තිබූ 11 වාට්ටුව එහි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ අධීක්ෂණය මත යුද්ධ හමුදා සාමාජිකයින් විසින් ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු පසුගිය සැප්තැම්බර් 29 වන දින එම රෝහල වෙත භාරදෙන ලදී. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රුපියල් 300,000.00 ක පමණ මුදලක් වැයවූ අතර, ඒ සඳහා ප්‍රදේශයේ ධීවර සමිති හා වෙළඳ සංගමයේ මූල්‍ය දායකත්වය හිමිවිය. එම අවස්ථාවට 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී, 543 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 54 වන පාබල සේනාංකයේ කර්නල් (සම්බන්ධීකරණ), මන්නාරම දිස්ත්‍රික් රෝහලේ වෛද්‍යවරුන්, රෝහලේ කාර්යය මණ්ඩලය ඇතුළු ප්‍රදේශයේ ධීවර සමිති හා වෙළඳ සංගමයේ නියෝජිතයන් පිරිසක් සහභාගී වූහ. මෙම අවස්ථාවේදී එම රෝහලෙහි නේවාසික රෝගීන් සඳහා ත්‍යාග පාර්සල්ද පිරිනැමිණ. 54 වන පාබල සේනාංකයේ 12 වන සංවත්සරයට සමගාමීව මෙම කටයුත්ත සිදුකෙරිණ.



යකඩ වැඩ පොළකින් සුළු ගාණකට මිලදී ගත් යකඩ කූරු කිහිපයක් හා කුඩා රෝද තුන හතරක්ද පයිප්ප කැබලි සමූහයක්ද එකිනෙකට යාකොට ගෙන තනා ගත් මොකක්දෝ දළ එංජිමක හැඩලයක් වැනි යමක් ඒ මේ අත ගස්සමින් තරුණයෙක් කිසියම් උත්සාහයක යෙදෙමින් සිටියේය. ඔහුගේ තරුණ බිරිඳ ඒ අසලින්ම සිටගෙන අතෙහි වූ කුඩා කෝප්පයකින් යන්ත්‍රයට පෙට්‍රල් වත් කළාය.

ඊට තෙල් වත් කළ යුතුව තිබුණේ සෙමෙන් සෙමිනි. තරුණයා යන්ත්‍රය ක්‍රියා කරවන්නට තැත් කළේ බිරිඳ අතින් තෙල් වත් කෙරෙන ප්‍රමාණයට අනුකූලවය. තරුණියාගේ දෑත පුරා මජන් තෙල් බදාමයක් මෙන් ගෑවී ඇත. ඔවුහු බොහෝ වේලා එම ප්‍රයත්නයෙහි යෙදී සිටියහ.

හිටි හැටියේම යන්ත්‍රය පණ ගැන්විණි. මහා ඝෝෂාවකින් පෙදෙස සලිත කරවමින් එය දිගටම ක්‍රියාත්මක විය. වෙනත් අයට එය කරච්චලයක් වුවද තරුණ හෙන්රි ෆෝඩ්ටත් ඔහුගේ බිරිඳ ක්ලේරාටත් එය ඉමිහිරි සංගීත රාවයක් මෙන් විය.


සොම්නස උතුරා ගිය හෙන්රි ෆෝඩ් විහිදා ගත් යුගත් ඇතිව තමා දෙස බලා සිටි ක්ලෝරා වෙත ලංවුණේය. දරාගත නොහැකි ප්‍රීතිය බෙදාගෙන ඔවුනොවුන්ගේ උණුසුමට එක්වී මොහොතක් නිහඬව බලා සිටියහ.

ඒ 1896 යේ එක් සන්ධ්‍යාවකි. වාෂ්ප බලයෙන් පීලි මත දිවෙන ගල් අඟුරු දුම්රියත් සාමාන්‍ය මහා මාර්ගවල දිවෙන අශ්ව කරත්තයත් හැරෙන්නට වෙනත් ප්‍රවාහන මාධ්‍යයක් එකල නොවීය.

අශ්ව කරත්තෙට වඩා වේගයෙන් දිවෙන ස්වයංක්‍රීය රථයක් පිළිබඳ සිහිනය තරුණ හෙන්රි ෆෝඩ්ගේ හදවත කැකෑරෙමින් තිබිණ.

මිචිගන් ප්‍රදේශයේ ගොවියකු වූ හෙන්රි ෆෝඩ්ගේ පියාට ඕනෑ කළේ තම පුත්‍රයාද හොඳ ගොවියකු කරගැනීමටය. ඒ සඳහා ලොකු සැලැස්මක්ද විය. වගා පැලෑටි වර්ග මෙන්ම කෘමීන් පිළිබඳව පුතුට මනා අවබෝධයක් ලබාදීමට හේ කටයුතු කළේය.

හෙන්රි ෆෝඩ්ගේ බලාපොරොත්තුවත් පියාගේ ඕනෑකමත් අතර ලොකු පරතරයක් ඇති බව පෙනී යන්නට වැඩි කලක් ගත නොවීය. කුඩාකල සිටම යන්ත්‍ර සූත්‍ර කෙරෙහි ඇල්මක් දැක්වූ




# හෙන්රි ෆෝඩ්

හෙන්රි ෆෝඩ්ට ඕනෑ වූයේ වෙනත් මඟක යන්නටය. යන්ත්‍ර සූත්‍ර ලෝකය ඔහුගේ කුතුහලය හා උනන්දුව ඇද ගත්තේය.

1876 ෆෝඩ් 13 වැනි වියේ සිටියදී තම පියාද සමඟ නුදුරෙහි ඩෙට්රොයිට් නගරයට ගිය අවස්ථාවේ ඔහුට ප්‍රථම වරට වාෂ්ප බල දුම්රියක් දක්නට ලැබිණි. එහිදී, දුම්රියේ රියදුරා සමග කතාවට වැටුණු මේ කොලුගැටයා එහි යාන්ත්‍රික ක්‍රියාකාරීත්වය ගැන ප්‍රශ්ණ ඇසීය.

"කරුණාකරලා මට මේ දුම්රිය දුවන

**යන්ත්‍රයට තෙල් වත්කළ යුතුව තිබුණේ සෙමින් සෙමිනි. තරුණයා යන්ත්‍රය ක්‍රියා කරවන්නට තැත් කළේ බිරිඳ අතින් තෙල් වත් කරන ප්‍රමාණයට අනුකූලවය. තරුණයාගේ දෑත පුරා මජන් තෙල් බදාමයක් මෙන් ගෑවී ඇත. ඔවුහු බොහෝ වේලා එම ප්‍රයත්නයෙහි යෙදී සිටියහ.**

**හිටි හැටියේම යන්ත්‍රය පණ ගැන්විනි. මහ ඝෝෂාවකින් පෙදෙස සලිත කරවමින් එය දිගටම ක්‍රියාත්මක විය.**

හැටි කියා දෙන්නකෝ" යි ඔහු එහි රියදුරාට ඇවිටිලි කළේය.

රියදුරා ඉංජිනේරුවකු නොවූයෙන් ඒ පිළිබඳ වැඩි යමක් පැහැදිලි කර දෙන්නට අපොහොසත් වුවද ගල් අඟුරුවලින් උණුවන ජලයේ වාෂ්ප බලය පීඩනයක් තුළින් පිස්ටනයකට එල්ල කිරීමෙන් ඉදිරියට තල්ලු වන බව තේරුම් කර දෙන්නට ඔහුට පුළුවන් විය. කුඩා හෙන්රි පියා සමග ආපසු ගෙදර පැමිණියේ කිසියම් තීරණයකට බැසගෙන විය යුතුය. තම පියාට හේ බෙහෙවින් ආදරය කළද ඔහුගේ කැමැත්තට නොකමැත්තෙන් වුවද පිටුපාන්නට ඔහුට සිදුවිය.

"මට යාන්ත්‍රික කටයුතු ගැන ඉගෙන ගන්න ඕනෑ" යි ඔහු පියාට කීවේය. එය බලවත් වේදනාවට හේතු වුවද බුද්ධිමතකු වූ පියා ඔහුගේ කැමැත්තට ඉඩ දුන්නේය. ඉන් ඉක්බිති ඩෙට්රොයිඩ් නගරයේ යාන්ත්‍රික ආයතනයක පුහුණුවක් ලබාදෙන්නට කටයුතු සලස්වන ලදී.

විවිධ අවශ්‍යතා සඳහා අතින් ක්‍රියාකරවන යන්ත්‍රවල අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය පිළිබඳ හොඳ අවබෝධයක් කෙටි කාලයකින්ම ලබාගන්නට සමත් වූ හෙන්රි ෆෝඩ් එහි සේවයේ යෙදී සිටියදීම ක්ලේරා වයිරන්ට් තරුණිය සමග ආලයෙන් බැඳුණේය. මඳ කලකින් ඔවුහු විවාහ වූහ. එවකට ඔහුගේ වයස අවුරුදු 25 ක් විය.

තෙල් බලයෙන් දිවෙන වාහනයක් තැනීමේ බලාපොරොත්තුව ෆෝඩ් ක්ලේරා සමගද කීවේය. දවසේ වැඩ නිම කර ගෙදර එන හෙන්රි යකඩ කැබලි වයර් පටලවාගෙන අළුත් යන්ත්‍රයක් නිර්මාණය කරන්නට උත්සාහ කරද්දී ක්ලේරා ඔහු ධෛර්යමත් කරමින් ඊට සහය වූවාය.

මෙහි මුලින්ම සඳහන් කළ ජයග්‍රාහී මොහොත උදාවූයේ ඒ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙනි.

එදා තෙල් බලයෙන් පණගැන්වුනු එනිජිම බයිසිකලයේ රෝද 04 ක් මත ඉදිකරගත් අට්ටාලයක රඳවා ලෝකයේ ප්‍රථම මෝටර් රථය නිපදවාගත් හෙන්රි ෆෝඩ් 1896 ජුනි 04 වැනිදා එය මහා මාර්ගයේ ධාවනය කළේය. එය බොහෝ දෙනාගේ මවිතයට හේතුවිය.

ඊළඟ වසරේ තවත් නවීකරණය කෙරුණු ෆෝඩ්ගේ මෝටර් රථයක් අශ්ව කරත්ත සමග ධාවන තරගයක යෙදී ඉන් විශිෂ්ට ජයග්‍රහණයක් අත්කර ගත්තේය. හෙන්රි ෆෝඩ්ගේ නිර්මාණය කෙරෙහි ඒ වන විට ඇමරිකාව පුරා ලොකු ප්‍රසිද්ධියක් ලබා තිබුණි. ජනතාවගේ රුචිකත්වය හඳුනා ඒ අනුව පිළියෙල කරගත් සැලැස්මක් යටතේ මෝටර් රථ නිපදවීම සඳහා ජේම්ස් කොවුසර්ස් නමැති තවත් කොටස්කාරයකු සමග ෆෝඩ්මොබයිල් සමාගම පිහිටුවා ගන්නා ලද්දේ 1903 දීය.

ආකරයකින් තෙල් ගලා එන්නාක් මෙන් ෆෝඩ්මොබයිල් සමාගමට මුදල් ගලා එන්නට විය. සාමාන්‍ය මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ඩොලර් 950 කට විකිණිය හැකි මෝටර් රථයක්ද ඉහල පෙළේ තැනැත්තන්ටද ඔරොත්තු දෙන ඩොලර් 2000 ක රථයක්ද ඔවුහු වෙළඳ පොළට නිකුත් කළහ.

වසරින් වසර අළුත් පන්නයේ මෝටර් රථ නිපදවීමට පර්යේෂණාත්මකව ඇරඹුනු අතරම ඒවා මිලදී ගන්නට පොර කන්නට වූහ. 1915 වනවිට තවත් කර්මාන්තායතනද මෝටර් රථ කර්මාන්තයට අත ගසා තිබුණි. එහෙත් මෝටර් රථයේ නිර්මාතෘවරයා පසු බැස්සවීමට ඒ කිසිවකුටත් නොහැකි විය.

ජනතාව තුළ විවිධත්වය කෙරෙහි ඇති රුචිකත්වය තේරුම්ගෙන ඒ අනුව තම මෝටර් රථවලට නව හැඩ වැඩ දීමට හෙන්රි ෆෝඩ් තුළ තිබූ දක්ෂතාව ඔහුගේ සාර්ථකත්වයට හේතුවිය.

හෙන්රි ෆෝඩ් තරම් ලෝක ජනතාවගේ සුබ සෙත උදෙසා ධනය පරිත්‍යාග කළ වෙනත් කෙනෙක් නොවීය. ලොව පුරා නොයෙක් සුබසාධක සේවාවන් සඳහා වසරක් පාසා මුදල් පිරිනැමීම පිණිස "ෆෝඩ් පදනම" නමින් අරමුදලක් පිහිටුවන ලදී. 1930 පමණේදී එම පදනමේ මුදල් ශක්තිය ඩොලර් ප්‍රකෝටි 300 ක් විය. සෑම වසරකදීම ඉන් ඩොලර් ප්‍රකෝටි 25 ක් වැය කරන ලද්දේ පිටරටවල සුබ සාධක සේවාවන් සඳහාය.

සාමාන්‍ය ගොවිපොළක් හිමියකු වශයෙන් ලොව නොහඳුනන පුද්ගලයකු හැටියට මිය යන්නට සිටි හෙන්රි ෆෝඩ් ලොව ප්‍රබලම ධනවතා වුණා පමණක් නොව ඒ ධනයෙන් මිනිස් සමාජයට ලොකු මෙහෙයක් කළ තැනැත්තා හැටියට නමක් දිනාගෙන 1974 දී මිය ගියේය.

*උපුටා ගැනීම -*

*1993 "මනහර" මාර්තු කලාපය ඇසුරිනි...*

# "බ්‍රේව්බීට්ස්"

## සංගීත කණ්ඩායම - අභිමංසල 3





කුරුණෑගල, පාන්ගොල්ල, අභිමංසල 3 සුවසහන මධ්‍යස්ථානයේ රණක්ෂිතයට පත් නේවාසික සෙබළුන් 12 දෙනකුගෙන් සමන්විත "බ්‍රේව්බීට්ස්" සංගීත කණ්ඩායම මේ වනවිට යුද්ධ හමුදා සංගීත ප්‍රසංග වේදිකාව අතික්‍රමණය කොට ඉතා සාර්ථකව තම දක්ෂතාවයන් ප්‍රදර්ශනය කරමින් සිටී. රණක්ෂිතයට පත් සෙබළුන්ගේ සහභාගීත්වයෙන් පවත්වා ගෙන යන මෙම "බ්‍රේව්බීට්ස්" සංගීත කණ්ඩායම 2018 වර්ෂයේ එවකට සේනාවිධායකගේ මගපෙන්වීමෙන් ආරම්භ කර ඇති අතර, මේ වනවිට යුද්ධ හමුදා සුවසහන මධ්‍යස්ථානයන්හි රණක්ෂිත සෙබළුන්ගේ මානසික ඒකාග්‍රතාවය උසස් මට්ටමකට ගෙන ඒමේ අරමුණින් යුතුව සංගීත ප්‍රසංග පවත්වමින් සිටී.



# පරිනත සොල්දාදුවා විශිෂ්ඨ නායකයෙකි

**"මිනිසුන්ට සාමූහික කටයුත්තක් ප්‍රයෝජනවත් ලෙස භාරගෙන නිසිලෙස නිමාකළ හැක්කේ එහි මුල සිට අග දක්වාම ඔවුන්ගෙන් එක් අයෙකු විසින් සියලු දෙනාගේම ක්‍රියාකාරකම් ඒ දෙසට යොමුකොට මෙහෙයවනු ලැබුවහොත් පමණි" නායකත්වය පිළිබඳ මා දකින හොඳම නිර්වචනය ඉහතින් දැක්වූයෙමි. මෙය හුදු වචන පෙලගැස්මක් පමණක් නොවේ. නායකත්වය පිළිබඳ සංක්ෂිප්ත නිවැරදි අදහසක් ඒ තුළ ගැබ්ව තිබේ. ඈත ඉතිහාසයේ පටන්ම මානව සමාජය ඔවුන්ගේ පාලනය සඳහා නායකයින් තෝරාගත්තේය. එය මානව සමාජය ආරම්භය තෙක්ම දිවයන බව පුදුමයක් නොවේ. ප්‍රධාන නායකයාගේ පටන් දෙවන පෙල, තුන්වන පෙල, හතරවන පෙල ආදී වශයෙන් "පිරමීඩයක" ආකාරයෙන් පුළුල්ව පැතිරගිය නායකයින්ගේ සංස්ථාවක් ඒ අනුව බිහිවිය.**

මානව සමාජය දීර්ඝකාලයක පටන් ඔවුන් සඳහා නායකයින් තෝරා ගත්තද, නායකයින් තෝරාගැනීම සඳහා අනුගමනය කර ඇත්තේ ක්‍රම ස්වල්පයක් පමණකි. එයින් වඩාත් පැරණිතම ක්‍රමය වන්නේ පරම්පරාගත ක්‍රමයයි. සිය උරුමයෙන් එසේත් නැතිනම් පරම්පරාවෙන් නායකත්වය ලබාගත් තැනැත්තා ජනතාව ඔවුන්ගේ අණ පිළිගැනීම හේතුවෙන් ස්වභාවයෙන්ම අසීමිත ගෞරවයක් භුක්ති විඳී. විශාල බලයක් ඔවුන් සතුවන බව අප දනිමු. ස්වභාවයෙන්ම එංගලන්තයේ රැජින උසුලන ශ්‍රේෂ්ඨත්වය එයට හොඳම උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

නායකත්වය ලැබීම සඳහා වූ ප්‍රධාන හා ජනප්‍රිය අනෙක් ක්‍රමය වන්නේ තම උත්සාහයෙන්, දක්ෂතාවයෙන් නායකත්වයට පත්වීමයි. "රජකු පරාජයවුවත් ඔහු රජුම බවත් ස්වකීය ප්‍රයත්නයෙන් ඒනැන ලැබූ තැනැත්තාට සිය තත්වය පවත්වාගෙන යාමට දිගින් දිගටම ජයග්‍රහණයේ පිහිට වුවමනා බව වරක් මහා රණශූර නැපෝලියන් ප්‍රකාශ කළේය. ඒ නිසාදෝ ඔහු හැමවිටම ජයග්‍රහණය සොයා ගියේය. සිය ප්‍රයත්නයෙන් නායකත්වයට පත්ව විශාල බලයක් ගොඩනගාගෙන සිටි නැපෝලියන් අධිරාජ්‍යයාගේ මේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ පරම්පරාගත රජකු ස්වභාවයෙන්ම භුක්ති විඳින අසීමිත බලයයි. එසේ වුවද පරම්පරාගත නායකයන්ගේ ශ්‍රේෂ්ඨත්වය හෝ බලය පිළිබඳව වැඩි අවධානයක් නොදක්වන වර්තමානයේ ශ්‍රේෂ්ඨ නායකයින් බොහෝ පිරිසක් එම තත්වයට පත්වී ඇත්තේ සිය උත්සාහයෙන් බව අමතක කළයුතු නොවේ.

සමහර නායකයෝ බලෙන් නායකත්වය තමන් වෙත පවරාගෙන කටයුතු කරන අවස්ථාද ඇත. එසේ වුවද බලෙන් නායකත්වයට පත්වන පුද්ගලයෙකු තුළ වුවද නායකත්වයට අවශ්‍ය ගති ලක්ෂණ පිහිටා ඇති බව පෙනේ. මන්ද, එසේ නොවන්නට ඔහුට පක්ෂපාතී යම් පිරිසක් ඇතිකර ගෙන එවැනි බලයක් හිමිකර ගැනීමට ඔහුට නොහැකිවනු ඇත. නමුත් ප්‍රශ්නය වන්නේ ඔහු සතු නායකත්ව ගුණාංග හෝ සුදුසුකම් එවැනි ශ්‍රේෂ්ඨ නායකත්වයක් දරණ පුද්ගලයෙකුට සුදුසු වන්නේද යන්නයි. නායකත්වයට පත්වූ අවස්ථාවේ නොවුනත් කල්යත්ම ඔහුගේම යටත් පිරිස විසින් එම ප්‍රශ්නය නායකත්වය වෙත යොමුකරනු ඇත.

නායකයෙකු ලෙස හොඳින් පිළිගනු ලැබීම නායකයෙකු සතුවිය හැකි විශිෂ්ඨ ගුණයයි. එම පිළිගැනීම කරණකොට ඔහු අසීමිත ගෞරවයක්, බලයක් ගොඩනගා ගනී. යම් නායකයෙකුගේ

සුදුසුකම් ගැන ප්‍රශ්නයේද එවැනි සෑම නායකයෙක්ම පැහැදිලිවම ක්‍රියාකාරී බලයෙන් අඩු අයෙකි. නායකයෙකු වීමට සුදුසුකම් සපුරාගන්නේ කෙසේද? මෙහිදී බොහෝ කෙනෙකුගේ අවධානය යොමුවන්නේ අධ්‍යාපන සුදුසුකම් වෙතයි. දෙවනුව උස, මහත, පෞරුෂත්වය නායකයෙකුට අත්‍යාවශ්‍ය කරුණු බවට අවධානය යොමුකරයි. මෙවැනි උසස් අධ්‍යාපන සුදුසුකම් හෝ උස, මහත, මනා පෞරුෂයත් නායකයෙකු සතුවීම යහපත් වේ. එසේ වුවද මේ කිසිවක් සැබෑ නායකයෙකු වීමට අත්‍යාවශ්‍ය කාරණා නොවේ. ඉතිහාසය පුරා මේ දක්වා බිහිවූ ශ්‍රේෂ්ඨ නායකයෝ බොහෝ පිරිසක් උසස් අධ්‍යාපන සුදුසුකම් හෝ උස, මහත හෝ කැපීපෙනෙන ශාරීරික තත්වයන් ලැබූ අය නොවෙති. මේ පිළිබඳව ලබාදිය හැකි උදාහරණ ඕනෑ තරම් තිබේ.

සහතික පත්‍රවලින් තීරණය කරන අධ්‍යාපන සුදුසුකම්වලට වඩා නායකයකු සතුවිය යුතු පලපුරුද්ද, බුද්ධිමත් බව, ස්වානෝචිත ප්‍රඥාව ඉතා අගනේය. දීර්ඝකාලීන අත්දැකීම්, පලපුරුද්ද මගින් ලබාගත් ඥාණය නායකයෙකුට හොඳ ආභරණයකි. එසේම ලබාගන්නා ඥාණය, දැන උගත්කම සරල විය යුතුය. පැහැදිලි විය යුතුය. සංකීර්ණ සිද්ධාන්තවලින් සිතපිරී ගියවිට ප්‍රායෝගිකව ක්‍රියාකාරීවී ප්‍රතිඵල ලබාගැනීම අසීරු වේ. නායකයෙකුගේ කටයුතු අන්‍යන්ට තේරුම්ගත හැකි ආකාරයේ සරල, පැහැදිලි ප්‍රයෝජනවත් ඒවා විය යුතුය. මන්ද පමන ඉක්මවා සංවිධානය කරන කාර්මාන්තත් යන දෙකම එක හා සමාන මුදල් අපතේ යවන කර්මාන්ත බව උදාහරණයක් ලෙස පෙන්වා දිය හැකිය. නායකයෙකුගේ සරල බව පිළිබඳව දියහැකි හොඳම උදාහරණය වන්නේ වියට්නාමයේ ගරිල්ලා නායකයාව සිටි "හෝචිමිං" ය. ඔහුගේ ඇඳුම, පැලඳුම, කථා බහ, තීරණ කොතරම් සරලවීද යත් පොදුවේ "හෝචිමිං" ගේ ක්‍රියාවන් අනුමත නොකරන නියකයෝ පවා ඔහුගේ මෙම සරල පැවැත්ම අගයති. නොයෙකුත් ක්‍රම උපායන් මගින් තම දැනුම දියුණු කරගැනීම මෙන්ම මිනිසුන්ගේ හැගීම්, ආශාවන් පිළිබඳව ස්වයං අවබෝධයක් තිබීමද නායකයෙකුට ඉතා වැදගත් වේ. ආදර්ශමත් බව, විනයානුකූල බව ඔහුගේ පෞරුෂය තීරණය කරයි. ආදර්ශය නිතරම ගලායන්නේ ඉහළ සිට පහළට බව නායකයා දැනසිටීම ඉතා වැදගත් වේ.

නායකයෙකු ලෙස පිලිගනු ලැබීමට නම් ඔහු සෙස්සන්ගේ ගෞරවයට පාත්‍ර වියයුතු බව සත්‍යයකි. එසේනම් නායකයා සෙසු අයගේ ගෞරවය ලබාගන්නේ කෙසේද?

මෙයින් වසර දෙකකට පෙර ශිෂ්‍ය නායක නායිකාවන් සඳහා නායකත්වය පිළිබඳ ආරාධිත දේශනයක් කිරීමට පොළොන්නරුව රාජකීය විද්‍යාලයට යාමට මාහට සිදුවිය. එම දේශනයේදී " යම් නායකයෙකු ගෞරව ලබාගන්නේ කෙසේද" යි මම ශිෂ්‍යන්ගෙන් ඇසුවෙමි. ඔවුන් විවිධාකාර වූ පිළිතුරු ඉදිරිපත් කළේය. සමහර ශිෂ්‍යයෝ ගෞරව ලැබීම සඳහා හොඳ විනයක් නායකයකු සතුවිය යුතුබව පැවසීය. ඉතා හොඳ විනයකින් කටයුතු කළත්, අධිෂ්ඨානය හෝ ක්‍රියාශීලී බව දුර්වලනම් එවැනි නායකයෙකුට සෙස්සන්ගේ ගෞරවය දිනාගත හැකිදැයි මම ප්‍රශ්න කළෙමි. විනය, අධිෂ්ඨානය, ආදර්ශමත්බව, ක්‍රියාශීලීබව, සාමානාත්මතාවය ආදී ගුණාංග බොහෝ අය ඉදිරිපත් කළේය. ඒවා ඉතා වටිනා නායකත්ව ගුණාංග බව මම පැවසුවෙමි. අවසානයේ එක් ශිෂ්‍යාවක් මෙසේ කීවේය. "මේ නායකත්ව ගුණාංග අතුරින් අහවල් එක නිසා ගෞරව ලැබිය හැකියැයි තීරණය කරන්න බෑ. ගෞරව ලබන්නට තිබෙන හොඳම දේ තමයි ගෞරව ලබන්නට සුදුස්සෙකු ලෙස ජීවත්වීම" මමද ඇයගේ අදහසට එකගවීමි. ගෞරව ලැබීම සඳහා මෙලොව ඇත්තේ එක් ක්‍රමයක් පමණි. එනම් ගෞරව ලැබීමට තරම් සුදුස්සෙකු වීමයි. ශ්‍රේෂ්ඨ නායකයා ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකි. ඔහු ආත්මාර්ථකාමී හෝ පක්ෂපාතී නොවන්නෙකි. නායකයෙකු තම යටත් පිරිසට "තීරණ" ලබාදිය යුතුය. ඉතා හොඳ තීරණ ලබාදෙන නායකයා කාගේත් පැසසුමට ලක්වන්නේය. තීරණ ලබාදීමේදී නායකයාගේ අධ්‍යාපනය, දීර්ඝකාලීන පලපුරුද්ද අත්දැකීම් ආදිය මහෝපකාරී වන්නේය. මේ සියල්ලටම වඩා යම්, යම් තීරණ ලබාදීමේදී නායකයා සතුව යුක්තිය, අයුක්තිය හඳුනාගැනීම හා සාධාරණය, අසාධාරණය හඳුනා ගැනීම ආදිය පිළිබඳව මනාවූ අවබෝධයක්, මානුෂික ශක්තියක් පැවතිය යුතුය. කිනම් හේතුවක් මත තීරණ ලබාදුන්නත් ඒවායින් යුක්තිය හා සාධාරණය මූර්තිමත් කළ යුතුය. සමහර විට නායකයාගේ තීරණය ඔහුට වේදනාකාරී විය හැකිය. තමන්ගේ පසුපෙළ නායකයින් සමග තරහ මරහ, මත ගැටුම් ඇතිකර ගැනීම යහපත් නායකයකුගේ ලක්‍ෂණ නොවේ. එසේ වුවද තමන්ගේ හිතෛෂීන් සම්බන්ධයෙන් වුවද වේදනාකාරී තීරණ ගැනීමට නායකයා පසුබට නොවිය යුතුය. මන්ද, බොහෝ දෙනෙකුගේ යහපත පිණිස ස්වල්ප දෙනෙකු කැපකිරීමට ඉඳහිට සිදුවිය හැකිය. මේ අනුව නායකයා යෂ්ඨියක් (දිගු හෙල්ලක්) රැගෙන කඹයක් මත ගමන් කරන සර්කස්කරුවෙක් මෙනි. සර්කස්කරුවා තම යෂ්ඨිය (හෙල්ල) ඒ පැත්තට මේ පැත්තට උස්පාත් කරමින් තමාගේ සමබරතාවය රැකගෙන කඹය දිගේ ගමන් කරයි. නායකයාටත් එවැනි සමබරතාවයකින් ගමන් කිරීමට සිදුවේ. කාලයක් තිස්සේ සැරපරුෂ නායකයින් තුළ තිබූ "බිරීමේ" සම්ප්‍රදාය වර්ථමානයේ යල්පැන ගිය මෙවලමක් වී ඇත. අතීතයේදී නායකයාගේ ශරීරයේ රළුබව, උස් මහත්කම, බුරුසු රැවුල, හයියෙන් කෑගසා බැනීම, ඔහුගේ මතය පමණක් නිවැරදි බවට අන්‍යයන් පිළිගත යුතුවීම ආදී ලක්‍ෂණ නායකයාගේ දැඩිබව පිළිබිඹු කරන ලක්‍ෂණවලට නායකත්වයේ තැනක් නොමැත. ඒ වෙනුවට පිරිසිදු බව, ක්‍රමවත් බව, නිහතමානී බව, අන් මතයට ගරු කිරීම, සාමානාත්මතාවය ආදී ගුණාංග නායකත්වය ප්‍රබල කරන ලක්‍ෂණ බවට පත්වී හමාරය. මිනිසුන්ගේ උපරිම ප්‍රතිඵලයක් ලබාගත හැක්කේ මෙම ගුණාංග වර්ධනය තුළින් බව වර්ථමානයේ හඳුනාගැනීමත් සමගම බිරීමේ සම්ප්‍රදාය යල්පැන ගියේය. නායකයකු තද පුද්ගලයකු විය හැකිය. යම්තාක්දුරට එසේවීම හොඳ නායකයකුගේ ලක්‍ෂණයක්ද විය හැකිය. එහෙත් දුෂ්ඨ අන්දමින්, කෲර අන්දමින් පළිගැනීමේ චේතනාවෙන් ක්‍රියාකිරීමට නායකයාට අයිතියක් නැත. නායකයා ප්‍රලාප, කට කථා, කේලම් ආදිය ඉවතලිය යුතුය. නැතිනම් ඒවා මර්ධනය කළ යුතුය. එසේම තම විනෝදය නායකත්ව වගකීමට වඩා ඉහලින් සලකන තැනැත්තාද හොඳ නායකයකු වූ පමණින් සෙස්සන් සමග කෝපය, නොරිස්සුම ඇතිකර ගැනීමද යහපත් නායකත්ව ලක්‍ෂණයක් නොවන්නේය. එසේම වැඩි සැළකිලි, ඥාති සම්බන්ධතා පවත්වන තැනැත්තාද හොඳ නායකයකු නොවේ.

නායකයාගේ වගකීම වන්නේ මෙහෙයවීමයි. එනම් ගෞරවයෙන් වැඩකරන මාර්ගය පෙන්වාදීමයි. නායකත්වය කෙනෙකුට ලබාදෙන වරප්‍රසාදයක් නොවේ. එය ගෞරවයකි. ප්‍රබල විශ්වාසයක් මත යම් කාලයකට පැවරෙන භාරකාරීත්වයකි. අණදීම යනු මිනිස් සමූහයක් නිශ්චිත අරමුණක් කරා විනයානුකූලව මෙහෙය වීමයි.

**තව කොටසක් ලබන කලාපයෙන්...**



කර්නල් එම්පීපී පෙරේරා
(විශ්‍රාමික)



# උපදේශන කුසලතා සහ නායකත්වය

නායකයෙක් යනු මිනිසුන් පිරිසක් පාලනය කරන අයෙකි. තම අනුගාමිකයින්ට ඔවුන්ගේ ප්‍රශ්න, දුෂ්කරතා මෙන්ම ජීවිතයේ ඔවුන් මුහුණ දෙන යම් යම් බාධාවන් සහ ගැටුම්කාරී අවස්ථාවන්හිදී ඔවුන්ට නිසි මග පෙන්වීමක් ලබා දීම සැබෑ නායකයෙකුගේ යුතුකමකි. තම අනුගාමිකයින්ට පැවරී ඇති ප්‍රධාන භූමිකාව තුළ නායකත්වය ලබා දෙන අතරම, නායකයෙකුට වර්තමාන තරඟකාරී සමාජ, ආර්ථික පරිසරය තුළ ඔවුන් මුහුණ දෙන පොදු මනෝවිද්‍යාත්මක ගැටළු අවබෝධ කර ගැනීම වැදගත් වේ. මේ අනුව, තම අනුගාමිකයින් මුහුණ දෙන පොදු අනෙකුත් ගැටළු සම්බන්ධයෙන් නායකයින්ගේ උපදේශන කුසලතා සහ සංවේදීතාව වඩාත් වැදගත් වන අතර නායකයින්ට ඔවුන් අපේක්ෂා කරන දේ සාක්ෂාත් කර ගැනීමට ආශිර්වාදයක් වේ.

නායකයෙකුගේ උපදේශන හැකියාව තුළින් ඔහුගේ අනුගාමිකයින් මුහුණ දෙන යම් යම් දුෂ්කරතා නිසි ලෙස හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමෙන් අනුගාමිකයින්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවිය හැකිය. තවද, මෙය අනුගාමිකයින්ගේ නායකත්වය කෙරෙහි ඇති විශ්වාසය වැඩි කරන අතර මෙම තත්ත්වය ද සංවිධානයේ ඵලදායිතාවයට බලපානු ඇත. තම ගැටලුවලට නිසි විසඳුම් ලබා ගැනීම තුළින් නායකත්වය සහ අනුගාමිකයින් අතර යහපත් සබඳතාවයක් ගොඩනැගෙන අතර මෙම ධනාත්මක බැඳීම සංවිධානයේ දිගුකාලීන අරමුණු කරා ළඟා වීමට හොඳ පියවරක් වනු ඇත.

උපදේශන හැකියාව ඇති නායකයින් යටතේ අනුගාමිකයන්ගේ සේවා හැරයාම් (පිරිවැටුම) අවමය. බොහෝ ආයතනවල සේවකයන් සේවය හැර යන්නේ වැටුප් හා දීමනා, උසස්වීම් හෝ රැකියාවේ ස්වභාවය නිසා නොව, තෘප්තිමත් ලෙස වැඩ කළ හැකි පරිසරයක් නොමැති විටය. උපදේශක නායකයෙකුට තමා යටතේ සිටින නිලධාරීන් ගැන හොඳ අවබෝධයක් ඇති අතර ඔවුන්ගේ දුෂ්කරතා හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමට හැකියාව ඇත. මෙම තත්ත්වය සේවා ස්ථානයේ තෘප්තිමත් පරිසරයක් නිර්මාණය කරන අතර සේවක පිරිවැටුම අඩු කරයි.

නායකයෙකුගේ උපදේශන හැකියාව සෑම විටම අනුගාමිකයින්ගේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කරයි. උපදේශන කුසලතා ඇති නායකයෙකුට තම යටත් නිලධාරීන්ගේ දුර්වලතා සහ යම් යම් පසුබෑම් ඉක්මනින් හඳුනාගත හැකිය. තවද, සුදුසු ක්ෂණික පිළියම් ලබා දීමට ද ඔහු සමත් වේ. එවැනි නායකයෙකු තම අනුගාමිකයින්ගේ සහජ දක්ෂතා හඳුනාගෙන ඔවුන්ගේ කුසලතාවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට සහ ඔවුන් සුදුසු කාර්යයන් සඳහා යෙදවීමට ඔහුගේ උපදේශක/උපදේශන කුසලතා භාවිතා කරයි.

ඕනෑම ක්ෂේත්‍රයක නායකයෙකුගේ උපදේශන හැකියාව සහ සංවේදීතාව ඔහු හෝ ඇය නායකත්වය දෙන කණ්ඩායමේ හෝ සංවිධානයේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ සේවක සබඳතා කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි. එවැනි සංවේදී නායකයා යටතේ මිනිසුන් තෘප්තිමත් ලෙස වැඩ කරන අතර ඔවුන් තම උපරිමය සංවිධානයට ලබා දෙනු ඇත. එවැනි සංවිධාන අසාර්ථක වීමට අවම ඉඩකඩක් ඇති අතර අරමුණු කොට ඇති ඉලක්කයන් වෙත ඔවුන් ඉතා පහසුවෙන් ළඟා වේ.



සටහන

මේජර් ජෙනරාල් කීර්ති කෝට්ටවත්ත
(විශ්‍රාමික)

# “බංකරේ නැගණියට”



මීට 27 වසරකට පමණ ඉහත දී මඩකලපුව "පූනානි" කඳවුර ආශ්‍රිතව මා ලත් අත්දැකීම් පිළිබඳ මතක අදටද නොවෙනස්ව පවතී. මතකයේ හැටියට ඒ 1995 වසරයි. ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් උත්සන්නව පැවති එකල 2/ ලුතිනන් නිලයේ සිටි මා එම කඳවුරෙහි කණ්ඩනාර නිලධාරියකු ලෙස සේවය කරන ලදී. ඊට පෙර නැගෙනහිර පළාතේ තොප්පිගල ආශ්‍රිත විවිධ හුදෙකලා ප්‍රදේශවල සේවය කොට තිබූ මා හට "පූනානි" හි ගතකළ කාලසීමාව විශේෂ විය. සැලකිය යුතු හටපිරිසක්ද සහිත විශාල භූමි ප්‍රදේශයක පැතිර තිබූ එවන් කඳවුරක එලෙස මා රාජකාරී කිරීමට එක්වූයේ ප්‍රථම වතාවටය.

පූනානි කඳවුරට පැමිණි මුල් දිනයේම මාහට එහි ආරක්ෂක කටයුතු පිළිබඳ සොයාබැලීමට පැවරිණ. ඒ අනුව එදින මැදියම් රැයෙහි මා කඳවුරේ ආරක්ෂක වළල්ලේ බංකර්වල සේවයේ නියුතු සෙබළුන් පරීක්ෂා කිරීමටද ක්‍රියා කරන ලදී. විදුලි පන්දමද පුද්ගලික අවියද රැගෙන එම කටයුත්තෙහි නියැලෙද්දී සහායක සෙබළකුද මා සමඟ එක්වූහ. එම රාත්‍රියේ කඳවුර පසෙක පිහිටි මුරගල වෙත ගිය මා හට මුනගැසුනේ එදින මුරපති (Guard Commander) ලෙස කටයුතු කරන පාබල හමුදාවට අයත් සැරයන් වරයෙකි. ඔහුගේ සහායක මුරපති (Relieving Commander) වූයේ සිංහ රෙජිමේන්තුවට අයත් කෝප්‍රල් වරයෙකි. මා ඔවුන් දෙදෙනා සමඟ සුළු මොහොතක් කතා කිරීමෙන් අනතුරුව ආරක්ෂක වළල්ලේ බංකර් පරීක්ෂාවට පිටත් වෙද්දී අළුයම 01ට ආසන්නවී තිබිණ.

එහිදී, බංකරයක් සමීපයට යද්දී දුරතියාම එතුලින් ඇසුණේ කිසිවකු "හෝල්ඩ්" යනුවෙන් කෑගසන හඬකි. හමුදාවේ භාවිතවන ක්‍රමවේදයකට අනුව විධානයක් ලෙසින් වූ එම කටහඬ මා පුදුම කරන ලද්දේ එය කාන්තාවකගේ වීම නිසාය. සැබැවින්ම එය සිත් ගන්නා සුළු ලයාන්විත හඬකි. මෙතරම් පිරිමින් සිටින කඳවුරක කට්ට කළුවර බංකරයෙහි එලෙස කාන්තා සෙබළියන් සිටිනු දැකීම මා තුළ වූයේ පුදුමයකි. තොප්පිගල දෙසට මුහුණ ලා පිහිටි එම බංකරයෙහි ඉදිරිපස වූ කටු කම්බි වැටෙන් ඔබ්බට වූයේ ඝන කැලෑවකි. පාළු මූසල මැදියමක ගිනි අවියක්ද අත දරා එලෙස රට රකින ඇය පිරිමියකු තරම්ම හෝ ඊටත් වඩා නිර්භීත ගති ඇත්තියක් විය යුතු නොවේදැයි මට සිතුණි. කාන්තා සෙබළියක් සිටින කඳවුරක රාජකාරී සඳහා පැමිණි ප්‍රථම අවස්ථාව එයවූ බැවින් ඔවුනගේ ක්‍රියාකාරකම් පිළිබඳ දැනගැනීමට ලැබීම මාහට නැවුම් අත්දැකීමක් විය. එහිදී, මාගේ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව සහායක සෙබළාද සමඟ බංකරය සමීපයට පැමිණි මා එම සෙබළිය සමඟ මොහොතක් කතා කළේය.

"වජිරා" නම්වූ ඇය අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකාරියකි. යුද හමුදාවට බැඳී ඒ වනවිට ඇය ගෙවමින් තිබුණේ දෙවන වසරය. ඇය එහි රාජකාරී භාරගෙන තිබුනේ මැදියම් රාත්‍රියේදීය. බංකරය තුළ යකඩ ඇඳක් මත හා බිම එලන ලද "සියෙස්ටා" මෙට්ටයක් මත එහි රාජකාරී සඳහා නම්කර සිටි සෙසු සෙබළියන් දෙදෙනා නින්දේ පසුවන අයුරු විදුලි පන්දම් එළියෙන් යාන්තමින් දැකගත හැකි විය. ඒ සැම අයකුම නිල ඇඳුමින් සැරසී සිටි අතර, ඒ මොහොතේ රාජකාරියේ යෙදී සිටි සෙබළිය අවියට අමතරව කැප් තොප්පියක් හා පතරොම් සහිත පුවසයද පැළඳ අවියද අතැතිව සිටියාය. කරාබු, මාල, වළලු කිසිත් නොපැළඳි නිය, තොල් ආලේපනද නොගෑ ඇගේ ගතින් සෙබළ මුහුණුවර හැරෙන්නට සාම්ප්‍රදායික කාන්තාවකගේ ස්වරූපය දිස් නොවූවාය. එහිදී, ගෙදර දොර තොරතුරු හා ආරක්ෂාවට අදාළ කරුණු පිළිබඳ ඇය හා මොහොතක් කතා බස් කිරීමෙන් අනතුරුව සහායක සෙබළාද සමඟ මා අලුයම එතැනින් නික්මෙද්දී ඊළඟ මුර වාරය භාරගැනීම පිණිස එතෙක් එහි නින්දේ පසුවූ සෙබළියක් අවදි කරවන හඬද මාහට ඇසුණේය.

විදුලි පන්දමක් දල්වාගෙන ඉදිරියට එමින් සිටි දෙදෙනකුද ඒ මොහොතේ යාබද බංකරය සමීපයේදී මාහට මුනගැසුනි. ඔවුන්ද කාන්තා සෙබළියෝ වූහ. බංකර් රාජකාරීන්හි නිරත වූවන් අතර "තේ" බෙදාහැරීමේ කටයුතු බාරව තිබුණේ ඔවුන්ටය. එවක ක්‍රියාත්මක බිමෙහි රාත්‍රී රාජකාරීන්හි නිරත සැම අයකුටම "තේ" හෝ "කොත්තමල්ලි" කෝප්පයක් පිරිනැමුණි. එය ඇතැම් විට මැදියම් රැයෙහිද අලුයමේදීද ලෙස දෙතුන් වතාවකදී ලබාදුන් අවස්ථාද තිබිණ. රාත්‍රිය පුරා බංකර්වල සෙබළුන් අවදියෙන් තබාගැනීම එහි අරමුණයි.

මා ආරක්ෂක වළල්ලේ ඇවිදිමින් එකින් එක බංකරය වෙත

ගොස් එහි සිටියවුන් ගේ රාජකාරි කටයුතු සොයාබලා ඉන් නික්මෙද්දී අලුයම 3 පසුවී තිබිණ. උපක්‍රමිකව වැදගත් ප්‍රධාන බංකර් වල හැරුණු විට අන් සියළු බංකර්වල එහිදී මාහට මුණගැසුනේ කාන්තා සෙබළියන්ය. ඒ මොහොත වනවිට එම කඳවුරේ සේම කාන්තා සෙබළියන් සිටින සෙසු ක්‍රියාන්විත පෙදෙස්වල ඇති කඳවුරුවලද තත්ත්වය එසේම විය. උතුරු නැගෙනහිර හැරුණු විට දකුණේ සෙසු සියලු ප්‍රදේශවල සිටින තරුණියන් ඒ මොහොත වනවිට සුව නින්දේ පසුවනවාට සැක නැත. ඔවුන් රැය පහන් කරනුයේ දුෂ්කරතාවන් ද, අවධානමද නොමැතිවය. ඒ අතර බොහෝ පිරිසක් තම දූ පුතුන් තුරුළුකර ගනිමින් තම ලබැඳියන්ගේ උණුසුමට ගුලිව නිදිසුව ලබනු ඇත. ඒ වනවිට මා හටද වැඩිමහල් සොහොයුරියක් සිටි අතර ඇයද එලෙසින්ම නිවසෙහි සුවසේ නිදනු ඇති බව මෙනෙහි විය. එහෙත් ඒ සියල්ල අතරේ අන් අයගේ සුව නින්ද උදෙසා තම නින්ද කැපකරමින් උතුරු නැගෙනහිර ක්‍රියාන්විත භූමියේ කොතෙක් නම් යොවුනියන් මෙලෙස රෑ පුරා නොපියවූ දෑසින් සතුරු පෙරමග බලා හිඳින්නේදැයි දන්නේ කීයෙන් කීදෙනාද.

ත්‍රස්තවාදී තර්ජන උග්‍රව පැවති එකල ඒ හේතුවෙන්ම දිනපතාම පාහේ කෙනකු මියයාම හෝ තුවාල සිදුවීම සාමාන්‍ය කරුණක්ව තිබිණ. සෙබළුන් දිවා රෑ නොබලා අවධානම් තැන්වල ත්‍රස්තවාදීන්ට එරෙහි මෙහෙයුම්වල නියැලෙද්දී කාන්තා සෙබළියෝද කඳවුරු වටා රැකවල් ලා හිඳිමින් ඊට නොදෙවැනි මෙහෙවරක නිරත වූහ. එවක පූනානිහි රාජකාරී නිරත සෙබළියන් වැඩි දෙනකු පොළොන්නරුව, මනම්පිටිය, අරලගංවිල, දම්මින්න වැලිකන්ද ආදී ඒ අවට පදිංචිකරුවන්ය. කඳවුරට තරමක් යාබද ප්‍රදේශවල ඔවුන් පදිංචිව සිටියද පැවැති ක්‍රියාන්විත තත්ත්වය හමුවේ ඔවුනට නිරතුරු තම නිවෙස් වෙත යාමේ ඉඩක් නොවීය. විශේෂයෙන්ම විවාහක දරුවන් සිටිනා සෙබළියන්ට පවා නිවාඩු ලබා ගැනීමට අවම වශයෙන් මාස දෙකකට වැඩි කලක් කඳවුරෙහි ගෙවන්නට සිදුවිය. අද මෙන් එකල ජංගම දුරකතන නොවූ අතර, රාජකාරීන්හි නිරත සැමටම තම නිවෙස් සමග ගනුදෙනු කිරීමේදී භාවිත කිරීමට සිදුව තිබුනේ කඳවුරෙහි වූ ස්ථාවර දුරකතනයයි. එමගින්ද ඔවුනට දුරකතන පහසුකම් ලබාගැනීමට ඉඩ සැලසී තිබුණේ අත්‍යවශ්‍යම හේතුන් මත ඉතා සීමිත කාලසීමාවකට යටත්ව පමණි. එබැවින් කාන්තා සෙබළියන්ට තම ලබැඳියන් හා වැඩිපුර ගණුදෙනු කිරීමට සිදුවූයේ ලිපි මගින් පමණි. නමුත් ඒ සඳහාද ඔවුනට සති ගණන් බලා සිටීමට සිදුවිය.

එක්තරා පොහෝ දිනයක මා කඳවුරෙහි මුරහල අසළ කිසියම් රාජකාරී අවශ්‍යතාවයක් මත රැඳී සිටි මොහොතක එහිවූ දුරකතනයෙන් සෙබළියක් කතාබස් කරමින් සිටියාය. නමින් "ලාන්ස් කෝප්‍රල් පවිත්‍රා" වූ ඇය දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකාරියක වූවාය. ඇය එම දුරකතනය හරහා සිය සැමියා හා කතාබස් කරන අයුරු මා හට පැහැදිළි විය. තරමක් උස් හඬින් ආමන්ත්‍රණය කරන බැවින් ඇගේ කතා බහ එහි සිටි අන් අයටද හොඳින් ඇසේ. ඒ වනවිට තවත් සෙබළියෝ රැසක්ද දුරකතන ඇමතුම් ලබාගැනීමේ අපේක්ෂාවෙන් තම වාරය පැමිණෙන තෙක් එහි පසෙක රැඳී සිටියහ. දුරකතන ඇමතුම් ලබාගැනීමේදී එම සෙබළියන්ගේ නිවෙස්වල එම පහසුකම් නොවූ බැවින් එම ඥාතීන්ට සිදුව තිබුනේ ඒ සඳහා ගමේ විහාරස්ථානයේ, වෙළඳසැලක, තැපැල් ස්ථානයක නොඑසේනම් වෙනත් ආයතනයක වූ දුරකතනයක් කරා යාමටය.

පෙර කී කාන්තා සෙබළිය දුරකතනය ඔස්සේ සිය සැමියාට ලබාදුන් පණිවුඩ ඇතැම් විට විධානයන් පරිදිය. ඇතැම් විට බැගෑපත් වූ ලෙසකි. එලෙසින්ම බොහෝ දයාබරව

**සමස්ත රටේම මවුවරුන් තම දරුවන් විසිහතර පැය පුරා සිය උණුහුමට තුරුළු කරගන්නා මොහොතක මාස ගණන් තම අත දරුවන්ගෙන් මිදී බංකර් තුළට වී ජීවිත අවදානමද සමග කාන්තා සෙබළියන් ඉටුකළ කාර්යභාරය කෙබඳු වී දැයි එම අත්දැකීම නොවිඳි කෙනෙකුට ලියා දැන්වීම අපහසුය. නා කපන වර්ෂාවේදීද, තිත්ත කළුවර රැයවල් හිඳිද, හිරිග ඩු පිපෙන සීතලේද, පිනි වැටෙන හිමිදිරියේද ඔවුහු සිය සුකොමල දෑත්වලට ගිනි අවි රැගෙන ශාපලත් යුද්ධය හමුවේ දුක් වින්දාහ. එසේම යුද ගැටුම් හේතුවක් ජීවිත අහිමිවූ සෙබළියන් පිරිසක්ද විය. නමුත් අවාසනාවකට සෙබළුන් ලැබූ ඇගයීම්වලට සාපේක්ෂව සෙබළියන්ගේ මෙහෙවරට ඇගයුමක් ලැබුණු බවක් නොපෙනේ.**

දෙඩූ වදන්ද ඒ අතර විය. සිය නිවසේ තොරතුරු පිළිබඳවද දරුවන්ගේ කටයුතු ගැනද ඈ බොහෝ දේ විමසන්නට හා පවසන්නට වූවාය. ඒ අසල රැඳී සිටි නිසාම මා හට ඇගේ කතාබහ නිරායාසයෙන් අසන්නට ලැබුණි. එහිදී, මා වඩාත් උනන්දු වූයේ කඳවුරෙහි ඇය විරු සෙබළියක් සේ කටයුතු කළද සිය සැමියා හා සම්බන්ධ වීමේදී ඈ නියම බිරිඳක්, ගෘහණියක් මවක් ලෙස වන සිය භූමිකාව ඈ ඉටුකරන අපූරුව පිළිබඳවය.

ඉන් පසු එලෙසින්ම සෙසු සෙබළියන්ද දුරකතන ඇමතුම් ලබා ගන්නා අයුරු මා හට දැකගන්නට ලැබිණ. ඉන් බහුතරයක්ම කතාබස් කරන්නට වූයේ තම ස්වාමිපුරුෂයන් හෝ පෙම්වතුන් සමගය. ඒ සැම අයකුම පෙර කී ලාන්ස් කෝප්‍රල් පවිත්‍රා මෙන්ම සිය රණවිරු භූමිකාවෙන් ඉවත්ව බිරිඳක, මවක, ගෘහණියක, පෙම්වතියක ලෙසින් හැසිරුණු අයුරු දැකගත හැකි විය. එහිදී, අවි අත දරන යුද සෙබළියන් වුවද දරුවන්ගේ අසනීප තත්වයන්, අධ්‍යාපන කටයුතු, පවුලේ අඬදබර, ආර්ථික අපහසුතා ආදී සැමට එකසේ බලපාන පොදු සමාජ ප්‍රශ්න ඔවුනටද මුහුණදෙන්නට සිදුව තිබුණේ එකම ලෙසය.

යුද්ධය බිහිසුණුව පැවති එම කාලවකවානුවේ සිය දරුවන් ස්වාමිපුරුෂයින් බාරේ නිවෙස්වල තබා බිරින්දෑවරුන් එලෙස ගිනි අවි අත දරා ක්‍රියාන්විත පරිසරයේ දිවි ගෙවීම දෛවයේ

සරදමක් නොවේදැයි මට සිතිණ. සැබැවින්ම ඔවුන්ගේ මෙහෙවර සමස්ත ජාතියේම ඇගයීමට ලක්විය යුතුමය.

විවාහක කාන්තා සෙබලියන්ගේ සුබසාධනය සලකාබලා එවක කඳවුරු භාර නිලධාරීන් සෑම සතියේ ඉරිදා දිනකම තම පවුලේ සාමාජිකයන් කඳවුරට ගෙන්වා ගැනීමේ අවසරය විවාහක කාන්තා සෙබලියන් හට ලබාදෙන ලදී. ඒ සඳහා කඳවුරෙහි ප්‍රධාන දොරටුවට යාබදව පැමිණෙන අයවලුන් හා කතා බස් කිරීමට හැකිවන පරිදි කුඩාරමක්ද ඉදිකොට, ආහාර පාන ආදිය ලබාදීමේ ඉඩකඩද සැපයිණ. ඒ අනුව සෙබලියන්ගේ ස්වාමිපුරුෂයන්, තම දූ දරුවන්ද රැගෙන අදාළ දිනවල එහි පැමිණෙන අයුරු දැකගත හැකිවිය. එහිදී, විවාහක සෙබලියන් රාජකාරිය අතරතුර ලැබෙන සුළු විරාමයකදී පවා එසේ පැමිණෙන තම දූ පුතුන් සුරතල් කරන අයුරුත් ඉතා කුඩාවියේ පසුවූ ඇතැම් දූ දරුවන් ඒ ඇසිල්ලෙන් තම මවගෙන් කිරි බොන්නට දඟලන අයුරුත් බොහෝ හැඟුම්බර දසුන් විය.

සමස්ත රටේම මවුවරුන් තම දරුවන් විසිහතර පැය පුරා සිය උණුහුමට තුරුළු කරගන්නා මොහොතක මාස ගණින් තම අත දරුවන්ගෙන් මිදී බංකර් තුළට වී ජීවිත අවදානමද සමඟ කාන්තා සෙබලියන් ඉටුකළ කාර්යභාරය කෙබඳු වී දැයි එම අත්දැකීම නොවිඳි කෙනෙකුට ලියා දැන්වීම අපහසුය. නා කපන වර්ෂාවේදීද, තින්ත කළුවර රැයවල් හිඳිද, හිරිග ඩූ පිපෙන සීතලේද, පිනි වැටෙන හිම්දිරියේද ඔවුනු සිය සුකොමල දෑත්වලට ගිනි අවි රැගෙන ශාපලත් යුද්ධය හමුවේ දුක් වින්දාහ. එසේම යුද ගැටුම් හේතුවක් ජීවිත අහිමිවූ සෙබලියන් පිරිසක්ද විය. නමුත් අවාසනාවකට සෙබළුන් ලැබූ ඇගයීම්වලට සාපේක්ෂව සෙබලියන්ගේ මෙහෙවරට ඇගයුමක් ලැබුණු බවක් නොපෙනේ.

අ ඉහත සියලු දුක්ඛ දෝමනස්ස මැද වුව ඔවුන් තම රට වෙනුවෙන් එලෙස සිදුකළ කැපවීම හරහා ගම්‍යවනුයේ සැබැවින්ම ඔවුන් විහාර මහා දේවියගේ පරපුරේ දියණියන් බවය.

ලද බොළඳ පෙම් වදන් ඇසූ එදා නුඹෙ නමින්
පුදුමයක් වී මෙදා අත පුරා අවි දරන්
සෙබලියක් වුවත් නුඹ යුවතියක් වූ හෙයින්
දමා යනු කෙලෙසකද බංකරේ තනිකරන්

වෙහෙර මහදේවි ගැන අසා ඇතිමුත් එමට
බොරුවෙලා ඉතිහාසෙ ඈය දෙවැනිවී නුඹට
දිවියෙ බර උසුලගෙන යුද වදින රට දැයට
ලියැවුණා මදි සින්දු කවි කතා නුඹෙ නමට

නළල් තිලකය වැටුණෙ තොප්පියේ දැවටීද
කරාබුව ගැලවුණේ වෙඩි හඬට කන්දීද
පෙම්වතා නැති දුකට අවිය තනි රකීවිද
මැදියමයි නැගණියේ තාම නිදි නෑ නේද

සුනිල්වන් නුවන් යුග නිදි බරින් මිරිකිලා
මටසිලුටු වත කමල අනේ ගොර හැඩි වෙලා
නෙත් කොනින් හෙළු බැලුම් පෙම් හැඟුම් වියැකිලා
ගනදුරට මැදිව නුඹ බංකරේ තනිවෙලා

දැත් යුග බැඳන් තනි මාවතේ ඇවිද ගිය
අතීතය සිහිවෙලා ඉකි ගසන සඳවතිය
පිරිමි අය මෙන් නුඹත් අතට ගෙන ගිනි අවිය
රට රකින නැගණියේ දැයට නුඹ වේ සවිය

දිගු නිලවන් වරල නමා දා තොප්පියක්
පුළුලුකුළ වැසී ගෙන වෙලා හම් පටි වැලක්
රෝස පෙති වන් දෙපා හිරකරන් ලෝගුවක්
දිවි මගේ උහුලගෙන දුක් කඳුළු කප්පරක්



සටහන:
ලුතිනන් කර්නල් සුචින් චමින්ද එදිරිසිංහ

# පාඨමාලාවන් සාර්ථකව නිමාකරමින්







අම්පාර සටන් පුහුණු පාසල වෙතින් පවත්වන ලද "ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලා - අංක 61" හි සමාප්තිය පසුගිය නොවැම්බර් 03 වන දින එම පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්පී මුණිපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

එසේම "කණිෂ්ඨ උපදේශක පාඨමාලා - අංක 99" සාර්ථකව අවසන් කළ සිසුන් වෙත සහතික පත් ප්‍රදානය කිරීමද පුහුණු පාසලේ සේනාවිධායක ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.



# පුනරීන් රැකගත් මෙහෙයුමට වසර 29 යි

පළමු ඊළාම් යුද්ධයට සාපේක්ෂව දෙවැනි ඊළාම් යුද්ධය බැරෑරුම් සහ දරුණු වූ සටන් ඇවිළුණු යුගයකි. ආයුධ බලයෙන්, පිරිස් බලයෙන් සහ යුධෝපකරණ අතින් පළමු ඊළාම් යුද්ධයට වඩා ශක්තිමත්ව සිටි එල්ටීටීඊ සංවිධානයෙන් හමුදාවට දැවැන්ත තර්ජන එසමයේ ඇතිවිය. 1992 වසරේදී නාවික හමුදාපතිවරයා ඇතුළුව යුද සහ නාවික හමුදා නිලධාරීන් රැසක් ඝාතනය කරමින් ත්‍රස්තවාදීන් ජයග්‍රහණ රැසක් අත්කරගත් බව ඉතිහාසය සාක්ෂි දරයි. අවි ආයුධවල ඌණතාවයන්, ආහාර, ජලය සහ ඖෂධවල හිඟතාවයෙන් බැට කමින් මාරාන්තික සතුරකුට එරෙහිව හුදෙකලාව යුදවැදි වීරෝදාර රණවිරුවන් රැසකගේ ඉරණම තීරණය වූ සටනක් වශයෙන් පුනරීන් මෙහෙයුම ඉතිහාසයට එක්වේ.

ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන් මෙහෙය වූ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් වූ ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව, මේජර් ජෙනරාල් විජය විමලරත්න, රියර් අද්මිරාල් මොහාන් ජයමහ ඇතුළු සටන්කාමී රැසක් මෙන්ම නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් ක්ලැන්සි ප්‍රනාන්දු ඝාතනය කරමින් රටම භීතියට පත්කර සිටි එල්ටීටීඊ ත්‍රස්තවාදීන් 1992 වසර අවසානය වන විට සිටියේ යුදමය අතින් අතිශයින්ම ශක්තිමත්වය.

මේ කාලසීමාවේදී යුද්ධ හමුදාවෙන් සීමිත ප්‍රහාරාත්මක මෙහෙයුම් කිහිපයක් දියත් වුණ අතර, ඒවායින් දීර්ඝකාලීන ප්‍රතිලාභ අත්කර ගැනීමට යුද්ධ හමුදාවට හැකිවූයේ නැත. වන්නි ප්‍රදේශයේ ත්‍රස්තවාදී බලය අහිමි කිරීම වෙනුවෙන් අදියර දෙකකින් ක්‍රියාත්මක වූ "වන්නි වික්‍රම" මෙහෙයුම මෙන්ම අලිමංකඩ කඳවුර සතුරාගෙන් බේරාගැනීමට දියත් කළ බලවේගය මෙහෙයුමට පෙර ක්‍රියාත්මක කළ "අසේකසේනා" මෙහෙයුමත් "හයේ පහර" මෙහෙයුමත් ඒ ප්‍රහාරවලට හොඳම උදාහරණයි. එසේම අකුණු පහර මෙහෙයුමත්, පළමුවරට ටී 55 යුද ටැංකි යොදාගත් සත්බල මෙහෙයුමත් ක්‍රියාත්මක වූයේ මේ සමයේදීයි.


මේ කාලයේදී වන්නියට එල්ටීටීඊ තර්ජන වැඩි වූ අතර, ඊට සාපේක්ෂව අති දැවැන්ත තර්ජනයක් යාපනය අර්ධද්වීපයට එල්ල විය. මේ නිසාම පුනරීන් කඳවුරට තර්ජයක් වූ කිලාලි කලපුවේ එල්ටීටීඊ බෝට්ටු නැංගුරම්පොළවල් විනාශ කිරීම වෙනුවෙන් යාල්දේවි මෙහෙයුම 1993 වසරේදී ක්‍රියාත්මක විය. ඉන් යුද්ධ හමුදාවේ 108 දෙනකුට තම ජීවිත අහිමි විය. මේ කාලයේදී වන්නියත් යාපනය අර්ධද්වීපයත් යාකරන ගොඩබිම් මාර්ගයක අවශ්‍යතාවය සපුරන ඒ 35 මාර්ගය භාවිත කිරීමේ අවශ්‍යතාවය එල්ටීටීඊයට තදින්ම දැණුන සමයක් වුවත් පුනරීන් කඳවුර ඔවුන්ට දැඩි හිසරදයක් විය. එසේම අවිආයුධ රට තුළට ගෙන ඒමට පුනරීන් හමුදා කඳවුර එල්ටීටීඊයට දැවැන්ත තර්ජනයක් විය. එසේය යාපනය කලපුවේ මෙන්ම බටහිර මුහුදේ එල්ටීටීඊ ක්‍රියාකාරකම්වලටද පුනරීන් කඳවුර එල්ටීටීඊයට බාධාවක් විය. මේ නිසාම කලින් කලට පැවති සාම සාකච්ඡාවලදීත් එල්ටීටීඊයේ ප්‍රමුඛතම ඉල්ලීම වූයේ එම කඳවුර ඉවත් කිරීමයි.

නමුත් යාපනය අර්ධද්වීපයේ ආරක්ෂාව වෙනුවෙන් සහ යාපනය කලපුවේ නාවික හමුදා බලය පැතිරවීම වෙනුවෙන් පුනරීන් හමුදා කඳවුර රජයේ හමුදාවන්ට අත්‍යවශ්‍යය සාධකයක් විය. ඒ නිසාම 1 වන පාබල බළඇණියත්, 3 වන ගජබා බළඇණිය එහි ස්ථාපිත කළ අතර, පාබල හමුදාවන්ගේ සහය සඳහා මිමී120 මෝටාර් අවි සහ ටී 55 යුද ටැංකි දෙකක් කඳවුරේම ස්ථානගත කර තිබුණි. එසේම, අවශ්‍යතාවයකදී පලාලි අලිමංකඩ සහ කයිට්ස් කඳවුරුවලින් කාලතුවක්කු වෙඩිසහය ලබාගැනීමේ හැකියාව පුනරීන් කඳවුරට තිබිණ.

නමුත්, පුනරීන් කඳවුරේ ගොඩබිම දෙසට වූ මායිම් යම්තරමකට ආරක්ෂා වූ අතර, මුහුද දෙසට වූ මායිම් ආරක්ෂා කරගැනීම දැවැන්ත ගැටළුවක් වී තිබුණි. මේ නිසාම ත්‍රස්තවාදීන්ට පහසුවෙන් කඳවුරේ ඔත්තු බැලීමට අවස්ථාව උදාවිය. එලෙස ඔත්තු බැලීමට පැමිණි ත්‍රස්තවාදීන් රැසක්ම



ලුතිනන් කර්නල් රංජිත් සිල්වා



ලුතිනන් කර්නල් කේඩබ්ලිව්ටී නිස්සංක



මේජර් උපුල් ලැනරෝල්

අවස්ථා ගණනාවකදී හමුදාවන්ගේ ග්‍රහණයට ලක් වූ අතර, මේ නිසාම කඳවුරට එල්ටීටීඊ ප්‍රහාරයක් එල්ලවීමේ අවධානය ඇඩිව දැනෙන්නට විය. එසේම කොමාතුඩුවේ පිහිටුවා තිබූ අවතැන් කඳවුරක රැඳී සිටි පිරිස්ද එල්ටීටීඊ සංවිධානය සහය දක්වා ඇති බවට පසුව වාර්තා විය.

තත්ත්වය එසේ තිබියදී 1993 නොවැම්බර් 11 අලුයම තවලෙයි පාච්චල් නොහොත් ගෙඹි පිම්ම නම් වූ එල්ටීටීඊ ත්‍රස්ත ප්‍රහාරය පුනරීන් කඳවුරට එල්ල විය. යාපනය කලපුව තරණය කරමින් පැමිණි ත්‍රස්තවාදීන් මුලින්ම ප්‍රහාර එල්ල කළේ 1 පාබල බළඇණියේ එක් ඛණ්ඩයක් පමණක් ස්ථානගත කර තිබූ කොමා තුඩුව ප්‍රදේශයටයි. වෙරළෙන් ප්‍රහාර එල්ල කරද්දී ඊට සාපේක්ෂව ගොඩබිමින්ද ප්‍රහාර එල්ල කිරීමට ත්‍රස්තවාදීන් කටයුතු කළේ කඳවුර තුළම සැඟව සිටිමිනි. ඉන් වික්ෂිප්ත වූ පාබල සෙබළුන් පළවා හරිමින් කොමාතුඩුව ඉදිරි ආරක්ෂක වළල්ල අත්පත්කර ගැනීමට ත්‍රස්තවාදීන් කටයුතු කරනු ලැබිණ. ඒ සමගම බෝට්ටුවලින් පැමිණි තවත් ත්‍රස්තවාදීන් විශාල පිරිසක් පරදමින් කඳවුර තුළට කඩා පැන්නහ. එම බෝට්ටු ප්‍රහාරය හමුදාව විසින් කිසිලෙසකින්වත් අපේක්ෂා නොකළ තත්ත්වයකි.

කඳවුරේ පිහිටීම හොඳින් අවබෝධකරගෙන සිටි ත්‍රස්තවාදීන් පරන්තන් දෙසින් පැමිණ කඳවුරේ ඊසාන දෙසට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරනු ලැබීය. එසේම යුදවැංකි අංගනයද අපහසුවකින් තොරවම එල්ටීටීඊ ත්‍රස්තවාදීන් අත්පත් කරගනු ලැබීය. එලෙස අත්පත්කර ගත් යුද වැංකි දෙකෙන් එකක් ඒ කාලයේදීම ගුවන් හමුදා ප්‍රහාරයකින් විනාශ කිරීමට හැකි වූ අතර, අනෙක් යුද වැංකිය යුද්ධයේ අවසන් සමය දක්වාම එල්ටීටීඊ සංවිධානය විසින් භාවිත කරනු ලැබිණ.

පුනරීන් කඳවුරට පහරදෙන අතරතුර ඒ අවට තිබූ නාවික අනුඛණ්ඩවලටද පහරදුන් ත්‍රස්තවාදීන් නොවැම්බර් 11 උදෑසන වනවිට පුනරීන් කඳවුරේ සැලකිය යුතු කොටසක් අත්පත්කර ගෙන තිබුණි. එදින උදෑසන එල්ලවූ ත්‍රස්තවාදී ප්‍රහාරයකින් 3 ගජබා බළඇණියේ දෙවන අණදෙන නිලධාරී මේජර් හේමපාල ජීවිතක්ෂයට පත් විය.

නමුත්, ඔවුන් 3 ගජබා බළඇණිය වටා අලුතින් ආරක්ෂක වැටක් ඉදිකළ නමුත් ප්‍රහාරවලින් තුවාල ලබා සිටි සෙබළුන්ට ප්‍රතිකාර කිරීම විශාල ගැටළුවක් විය. ඒ ඖෂධ හිඟවීම සහ වෛද්‍යවරයකු නොමැතියවීම නිසාවෙනි. දෙවැනි දිනයටත් ත්‍රස්වතාදීන් රාත්‍රී ප්‍රහාරයක් එල්ල කළ අතර, ත්‍රස්තවාදීන් 3 වන ගජබා බළඇණිය පිහිටි ප්‍රදේශයට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරනු ලැබිණ. එහි රැඳී සිටි පාබල සහ ගජබා සෙබළුන් ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයට දරුණු ප්‍රතිරෝධයකින් ප්‍රතිප්‍රහාර එල්ල කරනු ලැබීය. මෝටාර් අවි ස්ථානගත කර තිබූ බතරොයියටද ත්‍රස්තවාදීන් ප්‍රහාර එල්ල කළ නමුත් එම ස්ථානය යළි අත්පත් කරගැනීමට හමුදා භට පිරිස් කටයුතු කරනු ලැබීය. 1 පාබල බළඇණියේ දෙවැනි අණදෙන නිලධාරී වූ මේජර් උපුල් ලැනරෝල් සහ 3 ගජබා බළඇණියේ කණ්ඩායම් භාර නිලධාරී කපිතාන් උදිත සිල්වා ප්‍රසංශනීය නායකත්වයක් එහිදී ලබාදෙන ලදී.

කඳවුරේ ආයුධ ගබඩාවද ත්‍රස්වාදීන් විසින් පළමු දිනයේදීම අත්පත්කරගත් නිසා දැඩි උණ්ඩ හිඟයකටද හමුදා සෙබළුන් මුහුණදුන්හ. ගුවන් යානා නාශක අවිද ත්‍රස්තවාදීන් විසින් සටනට යොදවා තිබූ නිසා යුද්ධ හමුදාවේ සහයට ගුවන් හමුදා සහය ලබාගැනීමට නොහැකි වීම පාබල හමුදාවන්ට මුහුණදීමට සිදුවූ දැවැන්ත ගැටළුවක්. නමුත් විටින්විට පනොරම් ආදිය කඳවුරු භූමියට අතහරිමින් ගුවන් හමුදාව විශාල සහයෝගයක් පාබල හමුදාවන්ට ලබාදෙන ලදී.

**මෙම ප්‍රහාරය නිසා යුද්ධ හමුදාවේ නිලධාරීන් 8 දෙනකුට සහ සෙබළුන් 225 දෙනකුට ජීවිත අහිමි වූ අතර තවත් 302 දෙනකු අතුරුදන් වූහ. ඊට අමතරව නිලධාරීන් 17 දෙනකු සහ සෙබළුන් 544 දෙනකු තුවාල ලැබූහ. එසේම නාවික හමුදාවේ 105 දෙනකුට මෙම ප්‍රහාරයෙන් ජීවිත අහිමි වූ අතර, යාත්‍රා 5ක් විනාශයට පත් විය. ඒම මරණ සංඛ්‍යාව ඒතෙක් යුද්ධයේදී නාවික හමුදාවේ විශාල පිරිසක් එකම තැනදී ජීවතක්ෂයට පත් වූ පළමු අවස්ථාවයි.**

ඒහිදී, එක් ගුවන් යානාවකට ත්‍රස්තවාදීන් ප්‍රහාර ඒල්ල කළ අතර, එය නිරුපද්‍රිතව පලාලි කඳවුරට ගොඩබෑස්වීමට ගුවන් නියමුවාට හැකිවිය. නමුත්, දෙවැනි දිනය අවසන්වන විට යුද්ධ හමුදා සාමාජිකයින් 200 කට අධික පිරිසක් ජීවිතක්ෂයට පත්ව තිබූ අතර, තවත් 250 කට ආසන්න පිරිසක් අතුරුදන්ව තිබුණි. ඒසේම ත්‍රස්තවාදීන්ට යටත් වූ තවත් දෙසීයක පමණ පිරිසක් වෙඩිතබා ඝාතනය කළ බවට පසුව වාර්තා විය.

කෙසේ වෙතත් 1 වන පාබල බළඇණිය වටා ඒක්වූ හමුදා භට පිරිස් දැවැන්ත ප්‍රතිරෝධයක් ත්‍රස්තවාදීන්ට එල්ල කරමින් කඳවුර තවදුරටත් අතනොහැර දිගටම සටන් කරනු ලබීය. මේ අතර උතුර පළාත් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් රොහාන් දළුවත්ත ගේ මූලිකත්වයෙන් පුනරීන් කඳවුරට ආධාරක බළඇණි යැවීමට කටයුතු සූදානම් කෙරුණි. ඔහුගේ සහයට බ්‍රිගේඩියර් ශාන්ත කොට්ටේගොඩ, එයාර් කොමදෝරු ජයලත් වීරක්කොඩි, කමාන්ඩෝ රෙජිමේන්තුවේ මේජර් චන්ද්‍රවංශ සහ නාවික හමුදාවේ කමාන්ඩර් සරත් වීරසේකර එක්වූහ.

ත්‍රස්තාවාදීන්ගේ ගුවන් යානා නාශක

අවි නිසා ගුවන් මගින් ආධාරක බලඇණි කඳවුරට ගොඩබෑමට නොහැකි වූ අතර නාවික හමුදාවේ ලෑන්ඩින් ක්‍රාෆ්ට් මගින් සෙබළුන් කඳවුරට ලොඩබෑස්වීමට සැලසුම්කර තිබුණි . නමුත් ත්‍රස්තවාදීන් කොමා තුඩුව ආශ්‍රිතව බලය අත්පත් කරගෙන සිටි නිසා ඒම කටයුත්ත බැරිරුම් ඒකක් විය. ෙ

නොවැම්බර් 14 දිනයේදී සිව්වන දිනට සටන් පැවති අතර, ත්‍රස්තවාදීන් පූනරීන් කඳවුර මුළුමවනින්ම අත්පත්කර ගැනීමේ අරමුණින් කටයුතු කරනු දක්නට ලැබුණි. අතිරේක හට පිරිස් ගොඩබෑස්වීම සාමාණ්‍යයෙන් රාත්‍රී කාලයේදී සිදුකළ යුතු වුවත්, පූනරීන් කඳවුර මුහුණපා සිටි බරපතල තත්වය නිසාවෙන් දිවාකාලයේදී අතිරේක හට පිරිස් ගොඩබෑස්වීමට කමාන්ඩර් සරත් වීරසේකරගේ නායකත්වයේ නාවික හමුදාව කටයුතු කරනු ලැබීය. ඒසේම අලුතින් ආරම්භ කරන ලද විශේෂ ප්‍රහාරක බලඇණිය ලුතිනන් කමාන්ඩර් රවීන්ද්‍ර විජේගුණරත්නගේ නායකත්වයෙන් නොගැඹුරු මුහුදේ මුර සංචාර සඳහා යොදවන යාත්‍රා දෙකක් මගින් පළමෙනි අතිරේක හට පිරිස් කණ්ඩායම ලෙසින් පැමිනි කමාන්ඩෝ සෙබළුන් විසින් ඒ ප්‍රදේශය බලය තහවුරු කරගන්නා ලදී.

ඒයින් ලැබුණු පැති අරක්ෂාව සමගින් නාවික යාත්‍රා මගින් යුද්ධ හමුදා අතිරේක හට පිරිස් වෙරළට ගොඩබෑම සිදුවුණි. මේජර් චන්ද්‍රවංශ නායකත්වය දුන් කමාන්ඩෝ හටයින් ප්‍රමබ අතිරේක ඊට පිරිස්වල ප්‍රහාර දරාගත නොහැකි වූ ත්‍රස්තවාදීන් පූනරීන් කඳවුර අතහැර පසුබසින්නට වූ අතර, ඔවුන් වැඩි වේලාවක් නොගොස් 1 පාබල බලඇණියේ බලය අල්ලාගෙන සිටි යුද්ධ හමුදා හට පිරිස් සමඟ ඒක් වූ අතර ඒය ඔවුන්ට දැඩි අස්වැසිල්ලක් විය.

ඒවකට හමුදාධිපති ලුතිනන් ජෙනරාල් සිසිල් වෛද්‍යරත්න පසුදාම මේජර ජෙනරාල් රොහාන් දළුත්ත සමගින් පූනරීන් කඳවුරේ නිරීක්ෂණ චාරිකාවකට ඒක් වූ අතර, පූනරීන් කඳවුරට ඵල්ල වූ ප්‍රහාරය වළක්වා නොගැනීම සහ විශාල ජීවිත සංඛ්‍යාවක් අහිමි වීම සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීමට හමුදා පරීක්ෂණ අධිකරණයක් පිහිටුවීමටද ඒවකට හමුදාපතිවරයා කටයුතු කරන ලදී.

මෙම ප්‍රහාරය නිසා යුද්ධ හමුදාවේ නිලධාරීන් 8 දෙනකුට සහ සෙබළුන් 225 දෙනකුට ජීවිත අහිමි වූ අතර තවත් 302 දෙනකු අතුරුදන් වූහ. ඊට අමතරව නිලධාරීන් 17 දෙනකු සහ සෙබළුන් 544 දෙනකු තුවාල ලැබූහ. ඵසේම නාවික හමුදාවේ 105 දෙනකුට මෙම ප්‍රහාරයෙන් ජීවිත අහිමි වූ අතර, යාත්‍රා 5ක් විනාශයට පත් විය. ඒම මරණ සංඛ්‍යාව ඒතෙක් යුද්ධයේදී නාවික හමුදාවේ විශාල පිරිසක් ඒකම තැනදී ජීවතක්ෂයට පත් වූ පළමු අවස්ථාවයි. නමුත් නාගතේවන්තුරෙයි නාවික අනුබණ්ඩයේ නිලධාරී අණදෙන ලෙසින් කටයුතු කළ වත්මන් නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න තවත් නාවිකයින් 67 දෙනෙකු සමඟ කිලාලි කලපුව තරණය කරමින් අලිමංකඩ දක්වා නිරුපද්‍රිතව පැමිනීමට හැකිවීම මෙම සටන් අතර සිදුවූ තවත් වැදගත් සිදුවීමකි.

හමුදාධිපතිවරයා පූනරීන් කඳවුරේ සිදුකළ සංචාරය අතුරදී සිදුකළ වැදගත්ම කටයුත්තවන්නේ කඳවුර සතුරාට නතුවන්නට ඉඩනොදී ආරක්ෂා කරගත් සෙබළ පිරිසට නායකත්වය දුන් මේජර් රංජිත් සිල්වාට ක්ෂේත්‍ර උසස්වීමක් ලබා දෙමින් ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීමය. ඒසේම කමාන්ඩර් සරත් වීරසේකර "රණවික්‍රම" පදක්කමින් පිදුම් ලැබූ අතර, 3 ගජබා බලඇණියේ බණ්ඩහාර නිලධාරී කේඩබ්ටී නිශ්ශංක "පරමවීර" විභූෂණයෙන් පිදුම් ලැබීය.

පරිත්‍යාගයන් රැසක් කරමින් රැගත් පූනරීන් කඳවුරු උපක්‍රමික හේතුන් මත අත්හරින බව යුද්ධ හමුදාව විසින් 1996 දී ප්‍රකාශයට පත්කළ අතර, 2008 නෙවැම්බර් 15 වැනිදා යළිත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පූනරීන් අත්පත් කරගන්නා ලදී.



සටහන-:
ලුතිනන් දිලංක ගුණතිලක,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

# විරු දරු හපන්කම්



ආර්ථික අපහසුතා මධ්‍යයේ දිවිගෙවන යාපනය කෙවිල් ප්‍රදේශයේ පදිංචි මදුරන් නදියා නමැති වැන්දඹු මවට සහයක් සැලසීමේ අරමුණින් රුපියල් 175,000.00 ක වටිනාකමකින් යුත් මහන මැෂිමක් පරිත්‍යාග කිරීමටද, එම නිෂ්පාදන අලෙවිසැලක් සකස් කරදීමටද 55 වන පාබල සේනාංකය මැදිහත් විය. ඒ අනුව එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ මූලිකත්වයෙන් සේනාංක හටපිරිස් එම මාහැඟි කටයුත්තට දායක වූහ. එම කාන්තාවගේ ස්වාමි පුරුෂයා හදිසි අනතුරකට ලක්ව මියගොස් ඇති අතර, ඇය අවුරුදු 12 ක සහ 16 ක වයස්වල පසුවන දියණියන් දෙදෙනකු සහ වයස අවුරුදු 4 ක පුතකුගේ මවකි.



# ආතතියෙන් මිදීමට (Stress)

# මනෝවිද්‍යාත්මක අත්වැලක්

එදිනෙදා අප වෙත පැවරෙන රාජකාරිය, එසේත් නැත්නම් අත්‍යවශ්‍ය වැඩවලදී එම කාර්යයන් නිමකිරීම සඳහා නිශ්චිත කාලයක් හිමිවිය හැක. එසේත් නැත්නම් නියම කරනු ඇත. එහිදී, නියමිත කාලපරාසයක් තුළ අදාළ කාර්යය නිමකිරීමට නොහැකි වේයැයි සිතන නිසා ඇතිවන ශාරීරික හා මානසික වෙනස්වීම "ආතතිය" හෙවත් "Stress" ලෙස හඳුන්වනු ලබයි.

මෙය යම් අවස්ථාවලදී අදාළ කාර්යය නිමකිරීම සඳහා උද්‍යෝගයක් වන අතර, තවත් අවස්ථාවකදී එම කාර්යය හේතුවෙන් ශාරීරයේ ඇතිවන්නාවූ රසායනික වෙනස්වීම නිසා හෘද ස්පන්දන වේගය වැඩිවීම, මානසික ආතතිය වැඩිවීම සිදුවිය හැක. මෙම තත්වය නිතර නිතර සිදුවීම තුළී මානසික ආතතිය වැඩිවීම හේතුවෙන් "විශාදිය" හෙවත් "Depression" තත්වය දක්වා වර්ධනය විය හැක.

එසේනම්, ආතතිය යනු අප කළයුතු කාර්යය හෝ අපට ලැබෙන අභියෝගය තර්ජනාත්මකව හෝ අභියෝගාත්මකව "මට කළ නොහැකිවේද" යන කරුණු මුල්කරගෙන හිතට ඇතිවන පීඩාකාරී ස්වභාවය මෙසේ හැඳින්විය හැක.

යමෙක් දීර්ඝකාලීනව එකම රාජකාරියේ යෙදී සිටීම නිසා ඇතිවන එපා වීම මගහරවා ගැනීම සඳහා පුළුවන් උපරිමයෙන්ම වර්තමානයේ ඔබ ජීවත්වීමට උත්සාහ දැරිය යුතුය. සමහර අවස්ථාවලදී තමුන්ට වඩා වේගයෙන් අන්අය රාජකාරියේ හෝ පුද්ගලික ජීවිතයේ ඉදිරියට ගමන් කරනවා දැක්මෙන්ද, ප්‍රියයන්ගෙන් වෙන්වීම, එවන් අයකුගේ අහිමිවීම නිසාද ඔබට ආතති තත්වයක් ඇතිවිය හැක.

මතක තබාගන්න ඔබටත් කාලයක් එන බව, ධනාත්මකව සිතන්න පුරුදු වන්න. ඔබ ඉක්මන් වියයුතු නැත. නමුත්, කරන කාර්යය කුමක් වුවත් එය නිවැරදිව කිරීමට පමණක් අදිටන් කරගන්න. ලෝකයේ ජයගත් මිනිසුන් ගැන බලන්න. සමහරුන් වෙළඳ ව්‍යාපාරිකයින්, සමහරුන් ක්‍රීඩකයින්, සමහරුන් අන්තර්ජාලයේ මුදල් උපයන්නන් විය හැක. එසේත් නැත්නම්, මේ සියලු දෙනා වෙනස් වූ වෘත්තියක යෙදෙන්නන් විය හැකිය.

ඒ නිසා ඔබ ඔබේ වෘත්තිය ගැන පීඩාවට පත්විය යුතු නැත. කළ යුත්තේ වෘත්තිය නිවැරදිව කිරීම සහ කාලය කළමනාකරණය කරගෙන ඔබ ගැනත් සොයා බැලීමයි. ඔබ ගැන සොයා බලනවා යන්නෙන් අදහස් කරනුයේ ඔබ ආතතියෙන් සිටිනවානම්, එසේත් නැත්නම් ආතති තත්වයට පත්වේයැයි සිතෙනවානම් කඩිනමින් ඔබ ගැන අවධානය වැඩිකරන්න.

1. නිවැරදි වේලාවට ආහාර ගන්න.
2. ශාරීරික ව්‍යායාමවල යෙදෙන්න.
3. වැඩ කරන අතරතුර කෙටි විවේකයක් ගන්න.
4. ගීතයකට සවන්දීම හෝ මිතුරකු සමග සතුටු සාමීචියේ යෙදෙන්න.

එදිනෙදා අප වෙත පැවරෙන රාජකාරිය, එසේත් නැත්නම් අත්‍යවශ්‍ය වැඩවලදී එම කාර්යයන් නිමකිරීම සඳහා නිශ්චිත කාලයක් හිමිවිය හැක. එසේත් නැත්නම් නියම කරනු ඇත. එහිදී, නියමිත කාලපරාසයක් තුළ අදාළ කාර්යය නිමකිරීමට නොහැකි වේයැයි සිතීම නිසා ඇතිවන ශාරීරික හා මානසික වෙනස්වීම් නිසාද "ආතතිය" හෙවත් "Stress" ඇතිවිය හැක.

5. ඔබ පොතපත කියවන්නෙක්නම් නොනවත්වා එහි යෙදෙන්න.
6. නියමිත වේලාවට නිදාගන්න.

ඉහත කරුණුවල නිරතවීමට අදිටන් කළද, එය හරියාකාරව කරගැනීමට නොහැකිනම් ඔබ ප්‍රතිකාර සඳහා යොමුවිය යුතු බව වටහා ගන්න. ඒ සඳහා පුහුණුවලත් මනෝ උපදේශකවරයකුගේ සහාය පතන්න. එවිට ඔහු විසින් මනෝ වෛද්‍යවරයකු වෙත යොමුකළ යුතුයැයි හැඟේනම් ඒ සඳහාද යොමු කරනු ඇත.

ඔබ නොදැනුවත්වම ඔබ ආතතිය පාලනය කර ඇති බව ඔබට ටික දවසකින් වැටහී යනු ඇත. මතක තබාගන්න. සිතුවිලිවලට ඔබව පාලනය කිරීමට නොදී ඔබ විසින් සිතුවිලි පාලනය කරන්න. සතුට යනු පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන කරුණක් බැවින් අන් අය සතුටුවන දේ ගැන සිතා අසතුටු නොවන්න. ඔබ ඔබේ ක්‍රමයට ජීවිතය රසට විඳින්න. ඔබ ඔබම වන්න.



සටහන -:
ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක ගරු,
(මනෝවිද්‍යා උපදේශක)

# වෘත්තීය ආධුනික කාන්තා සෙබළියන්ගේ අභිමානවත් විසිරයාම



යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා පුහුණු පාසල වෙතින් පවත්වන ලද වෘත්තීය ආධුනික කාන්තා පාඨමාලා අංක - 82 පසුගිය නොවැම්බර් මස 25 වන දින අවසන් විය. 2022 ජූලි මස 28 වන දිනෙන් ඇරඹි මාස හතරක් පුරාවට පැවති මෙම පාඨමාලාවට ශ්‍රීලංසංබ, ශ්‍රීලයුවෙබ, ශ්‍රීලයුකපබ, ශ්‍රීලයුපොදුසේබ, ශ්‍රීලයුකාබ රෙජිමේන්තු නියෝජනය කරමින් සෙබළියෝ 86 දෙනකු සහභාගී වූහ.



එම පාඨමාලාව අවසානයේ විසිරයාමේ අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ස්වේච්ඡා බලසේනා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් ජේජ්ජේ ජයරත්න කේඑස්පී සහභාගී විය. එහිදී, සෑම අතින්ම අතිශූර සෙබළිය ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකායට අයත් සෙ/2132601 ආකාසෙ ජයවික්‍රම කේපීඑන් සම්මාන හිමිකරගනු ලැබුවාය.



# සමීපතමයින් රැකගමු

දෙමාපියන් දරුවන්ට ආදරේය. ඒ මාපිය ආදරයේ හැටිය. දරුවන් බිහිකිරීම, රැකීම, සමාජ අනන්‍යතාවය පැවරීම, සමාජානුයෝජනය, සමාජ පාලනය, වර්තමානයේ පවුලෙන් ඉටුවිය යුතු කාර්යයන් බව අපි දන්නෙමු. "සදාකාලික යුද්ධය ජයග්‍රහණය කරන්නේ කෙසේදැයි නොදන්නා සටනක් මෙන්" රැකියාව හා පවුල් ජීවිතය සමතුලිත කිරීම පවුලක වගකීම් අතරට අයත් වන්නක්. යුද්ධ හමුදා සාමාජිකයින් වන අපට ද ඒ වගකීම ඒ ආකාරයෙන්ම හිමි ගැන්වෙන්නක්. එහි වගකීම මෙන්ම වගවීම මව හා පියා යන දෙපාර්ශ්වය නියෝජනය කරන අප අතර බෙදී යන්නේ නිරායාසයෙන්.

කෙසේ වෙතත්, "ඇහේ ඉහේ තබාගෙන සමීපතමයින් රැකිය යුතුය" යැයි යන ව්‍යවහාරය ජන සමාජයේ පවත්නේ අතීතයේ පටන්. එම ව්‍යවහාරය එදාටත් වඩා යුද්ධ හමුදා සාමාජකයින් වන අපට සුදුසු වන්නේ අදටයි. ඒ පෙර නොවූ විරූ තරමින් දිනෙන් දින ම නොයෙකුත් දුරාචාරයන් සඳහා යුද්ධ හමුදා පිරිස් දායක කර ගැනීමේ ආක්‍රමණ පවතින හෙයින්. ඒ සියල්ල අතරින් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි කරවීම පිණිස තරම් කුට වෙළඳ උපක්‍රම ප්‍රමුඛ වන්නක්. අද යුද්ධ හමුදා සාමාජිකයින් හමුවේ ඇති ප්‍රහල අභියෝගයක් ලෙස මත් උවදුරය කියා කීවද වරදක් නැහැ. නිල ඇඳුමින් වැසී ගිය ආදාරණීය පියකුගේ හද මානය, ආදරණීය සෙහොයුරකුගේ හද මානය අප සිහිපත් කළ යුතුය. එසේනම් අප අවබෝධ කොටගත යුත්තේ මත් ද්‍රව්‍ය වැනි විනාශකාරී පෙලඹවීම් අප සහ අපගේ පවුල් ඒකකයන් විනාශය කරා රැගෙන යන ආකාරයයි. අප සියල්ලෝ රටක දෙමාපියෝය. සහෝදර සහෝදරියෝය. උපන්දුවයකදී පෙරමුණ ගන්නෝය. එසේනම් මත් උවදුරෙන් රට මුදවාගැනීමට මුල් අත්තිවාරම් දැමිය යුතු බව අපි අවබෝධ කොට ගනිමු.

ආදරය පිරුණු, සෙනෙහස නිබඳ රැඳි පවුලේ "දරන්නෝ" දෙමාපියෝය. ඒ නිසාවෙන්ම අප කල්පනාවිය යුතුය. අප අවධානයෙන් සිටිය යුතුය. ඒ පවුල නම් වූ ලෝකය රකින්නටය. එනම්, නීති විරෝධී ක්‍රියා සඳහා එක් නොවීමට අප වගබලා ගත යුතුය. යුද්ධ හමුදා සාමාජිකයින් වන අප වටා මත්ද්‍රව්‍ය නම් වූ මාෆියාව ප්‍රධාන අවදානමක් ලෙස පැතිරී ඇති බැවින් අප විමසිලිමත්ව කටයුතු කළ යුතුය. අප සමීපතමයින් රැකීමට කටයුතු කළ යුතුය. යුද්ධ හමුදා සාමාජිකයින් මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීම, භාවිත කිරීම, ප්‍රවාහනය, ජාවාරම් ආදී චෝදනාවලට ලක් වූ අයුරු වාර්තා වීම පමණක් නොව ,ඒවා හුදු චෝදනා වීමෙන් පමණක් නොනැවතී, සත්‍යතාව තහවුරු වූ අවස්ථා ම බහුල වීම මීට නිදසුන්ය.

සමීපතමයින් "ඇස් සේ රැකිය යුතුය". මේ අතර මත්ද්‍රව්‍ය හේතුවෙන් අප පවුල රැකගත නොහැකි තරමට බලවත් අනතුරුදායක ස්තරයක අද අප සිටින බවට වාර්තා වන කාලීන සිදුවීම් දෙස බැලීමේදී ඊට වඩා සාක්ෂි වුවමනා නැත්තේමය. අප යුද්ධ හමුදාවේ සියලු සමීපතමයින් රැකිය යුතුය. ඒ ඔබේත් මගේත් වගකීමක් බව පසක් කළ යුතුය, අවබෝධකර ගත යුතුය.


පොඩ වූ පොරණ ඉතිහාසයකට උරුමකම් කියන අප අතීතයේ පටන් වෙළඳ මධ්‍යස්ථානයක් ලෙසින් ලෝක ප්‍රජාවේ අවධානයට පාත්‍රව මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේද බලවත් සැලකිල්ලට බඳුන් වීම රටේ අවාසනාවක්. අද වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේද ඇතැම් පිරිස් මෙම ජාවාරම් සඳහා වක්‍රාකාරව සම්බන්ධ කර ගන්නා පිරිසක් සිටින බව තහවුරු වී ඇති අතර එම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගෙන් ප්‍රවේසම්ව වටිනා යුද්ධ හමුදා දිවිය රැකගන්නට දිරිය දෙමින්, අප සමීපතමයින් ආරක්ෂා කරගැනීම අප සතු වගකීමක්. ජාවාරම් ඔස්සේ උපයන මුදල් හේතුවෙන් බලවත් භාවයන් ගොඩනගා ගත්තවුන් කෙදින හෝ නීතියේ රැ හැනට හසුවන බව ද තරයේ මතක තබාගත යුතු කරුණක්.

යුද්ධ හමුදාවේ සියලු සෙබළුන් "තුන් රැකවලෙන් රට ජාතිය රකින්නන්". "ආරක්ෂක පවුරු තනන්නන්". දුරාචාරයන්ගේ ගොදුරක් නොවී ශිෂ්ට ජීවන සම්ප්‍රදායේ අත්මුල් පැතිර ගිය හෙළ සමාජය සුරක්ෂිත කළ යුතු පරපුරේ මූලාරම්භය අපියි. "අපි යුද්ධ හමුදාවයි". එය අපගේද යුතුකමක්, පැහැර නොහැරිය යුතු වගකීමක්. අප සාමාජිකයින් "මතින් විකල්ව මිලින වන අවාසනාවන්ත ඉරණමින්" මුදවා ගැනීම පිණිස එකාවන්ව එක්සිත්ව අපිදු පෙළගැසෙමු. මතින් තොර රටක් ගොඩනගමු. මතින් තොර යුද්ධ හමුදා පරිසරයක් ගොඩනගමු. අභිමානනීය යුද්ධ හමුදාවේ ප්‍රතිරූපය සුරකින්නට දායක වෙමු. අප පවුල නම් ලෝකය සුරක්ෂිත කරන්නට උර දෙමු.



සටහන
සෙ/ඕ103810 කෝප්‍රල් චතුරානි
එච්ඩබ්ලිව්ජී
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

## පරම වීර විභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ විරුවෝ



# පුදුකුඩිඉරිප්පු හිදී සිදුකරනු ලැබූ වීර ක්‍රියාව



සෙ/කමා552511 සැරයන් ගුණසේකර කේපීඩීටී පීඩබ්ලිව්වී ආර්එස්පී

කමාන්ඩෝ රෙජිමේන්තුව



වර්ෂ 1976 ක් වූ බිනර මස 26 වනදා ඇතුගල්පුර "නාගොල්ලාගොඩ" ප්‍රදේශයේ ජීවත් වූ, කේපීඩී ගුණසේකර මහතාටත්, ඒපීඩී නන්දාවතී මහත්මියටත් තෙවන වතාවටත් මව්පිය වරප්‍රසාදය පිරිනමමින් මුණමල්දෙණිය මාතෘ නිවාසයේදී සිගිති පුත් රුවනක් මෙලොව එළිය දුටුවේය. එම පුත් රුවන මතු දිනෙක තමන් දෙපළ වීර මවක සහ පියකු ලෙස විරුදාවලි ලබන බැව් පෙදරේරු කර්මාන්තයෙහි හා ගොවිතැනෙහි නියැලුනු කේපීඩී ගුණසේකර මහතා හෝ ඒපීඩී නන්දාවතී මහත්මිය සිහිනෙනුදු දැන නොසිටින්නට ඇත. තම වැඩිමහල් සොහොයුරා හා සෙහොයුරිය සමගින් සාමකාමී දිවියක් ගත කළ කුඩා තිස්ස, ඔවුන් දෙදෙනාට වඩා තරමක දඟකාරයකු වූයේය.

තිසි වයසට එලඹෙත්ම අධ්‍යාපනය සඳහා රණස්ගල්ල පෙර පාසලට තිස්ස දරුවා ඇතුළත් විය. පාසල් ගොස් පැමිණි තිස්සගේ විනෝදාංශය වූයේ මිදුලේ තිබූ අඹ ගසෙහි වැලි කොට්ටයක් එල්ලා එයට පහරදීමය. තිස්ස පාසල් අධ්‍යාපනය සඳහා 1982 වර්ෂයේදී ගිරිවුල්ල රණස්ගල්ල කනිෂ්ඨ විද්‍යාලයට ඇතුළත් විය.

පොතපතට මෙන්ම ක්‍රීඩාවට ද ඔහු එක සේම දක්ෂයෙක් විය. මළල ක්‍රීඩා, උස පැනීම, දුර පැනීම වැනි තරග ඉසව්වලදී මහත් සේ දක්කම් දැක්වූ ඔහු විද්‍යාලයීය නිවාසාන්තර ක්‍රීඩා තරග හා මාණ්ඩලික තරග සඳහාද සහභාගී වූයේය.

වරෙක විද්‍යාලයීය ශිෂ්‍යනායක සංගමයේ කනිෂ්ඨ ශිෂ්‍ය නායකයකු වශයෙන්ද, වරෙක විද්‍යාලයීය සාහිත්‍ය සංගමයේ උදේ‍යාගිමත් සාමාජියකු වශයෙන් ද ඔහු විසින් පාසලට ඉටු කරන ලද යුතුකම් පිලිබඳ එවකට විද්‍යාලයීය විදුහල්පතිව සිටි ආර්එම් ආරියරත්න (විශ්‍රාමික) ගුරු මහතා අදද සිහිපත් කරනුයේ ඉමහත් භක්ත්‍යාදරයෙනි. විද්‍යාලයේ පවත්වනු ලබන ඕනෑම කටයුත්තක් උදෙසා ස්වකැමැත්තෙන්ම ශ්‍රමදායකත්වය ලබාදුන්

තිස්ස තම ගම් ප්‍රදේශයේ පවත්වන ලද අවුරුදු උත්සවයකදීම ගම හරහා දිවීමේ තරඟයට සහභාගී වී නිරතුරුවම ජයග්‍රහණ ලබාගැනීමට සමත්විය.

පාසලේ පමණක් නොව ශ්‍රී විජයානන්ද පුරාණ විහාරානුබද්ධිත දහම් පාසලේද තිස්ස කීර්තිමත් ශිෂ්‍යයකු විය. කුඩාවියේදී නිවස ඉදිරිපිට වැලිකොට්ටයක් බැඳ එයට සිගිති දෑතින් පහරදුන් තිස්ස කාලයක් සමග තම මිතුරන් හා කුලියාපිටිය ප්‍රදේශයේ පැවැත්වුණු සටන් පුහුණු පන්තියකින් ආත්මාරක්ෂක සටන් කලාව ප්‍රගුණ කළේය.

ක්‍රමයෙන් ජීවිතය මුහුකුරායත්ම තම නිවසෙහි වූ ආර්ථික අපහසුතාවන්ද ඉහළ යන බැව් නව යොවුන් වියෙහි වූ තිස්සට දැනෙන්නට විය. ජීවිතය ගැටගසා ගැනීම පිණිස තම දෙමාපියන් දරණ තැන දුටු ඔහු වර්ෂ 1992 දී තම අධ්‍යාපන ගමනට සමුදී "දිරියෙන් ජීවිත ජය ගැනීම" නමැති ගමන ආරම්භ කළේය. වරෙක තම පියාගෙන් ලත් අභාෂය ඇතිව පෙදෙරේරු වෘත්තියද වරෙක නක්කාවත්ත ප්‍රදේශයේ පිහිට පොල්මෝලක යන්ත්‍ර ක්‍රියාකරු ලෙසද රැකියාව කළ තිස්ස, තම දෙමාපියන්ගෙන් ලත් ගුරුහරුකම්, අවවාද හා අනුශාසනා මත තම ජීවිත වෘත්තියන්හි සාර්ථකත්වය කරා කෙමෙන් ලඟාවන්නට විය.

එසේ වුවද, තිස්සගේ සිහිනය වූයේ ආරක්ෂක අංශයට බැඳී රට ජාතිය වෙනුවෙන් කැපවීමය. ඒ අරමුණ සාර්ථක කරගනු පිණිස තම ආරණීය පියාණන්ගෙන් හා ආදරණීය මෑණියන්ගෙන් තිස්ස අවසර ඉල්ලා සිටියද තත්කාලීනව රටේ පැවති යුද්ධමය වාතාවරණය දුටු ඔවුන් තිස්සට අවසර නොදුන්නේය. එහෙත් තම ආදරණීය බාල පුතණුවන්ගේ නිරන්තර ඇවිටිලි කිරීම් හමුවේ ඔවුන්ට දිගින් දිගටම විරෝධය පෑමට නොහැකිවූ අතර, දෙමාපිය අවසරලත් තිස්ස එසැණින් 1997 ක් වූ සැප්තැම්බර් මස 30 වන දින ඉදුරාම බඳවාගැනීම් අංක 15 යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත ඇතුළත් වූයේය.

අම්පාර සටන් පුහුණු පාසල වෙතින් 1997 ඔක්තෝබර් මස 20 වන දින සිට 1997 දෙසැම්බර් මස 30 වන දින දක්වා ආධුනික පුහුණු පාඨමාලා අංක 29 හැදෑරූ ඔහු පාඨමාලාව අතරතුරදීද ආධුනිකයන් වෙනුවෙන් පැවැති තරග සඳහාද ඉදිරිපත්වී සාර්ථක ප්‍රතිපල නෙළා ගත්තේය. ඔහු නියෝජන කළ කණ්ඩායම සෑම අතින්ම අතිශූර



*සිය රණවිරු මිතුරන් සමග*

කණ්ඩය බවට පත්විය. ආධුනික පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව තිස්ස ඇතුළු කණ්ඩය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විශිෂ්ටයන් බිහිකිරීමෙහිලා මුලිකව කටයුතු කරන පුහුණු පාසල වෙත අනුයුක්ත කරන ලදී.

විශිෂ්ටයින් අතර විශිෂ්ටයන් බිහිකිරීමෙහිලා අතිදුෂ්කර පාඨමාලාවක් වන කමාන්ඩෝ තෝරාගැනීමේ පාඨමාලා අංක 45 වර්ෂ 1998 සැප්තැම්බර් මස 21 වන දින සිට 1998 ඔක්තෝබර් මස 28 දින දක්වා සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කමාන්ඩෝ උසස් පෙළ පාඨමාලා අංක 26, වර්ෂ 1999 මාර්තු මස 24 වන දින සිට අගෝස්තු මස 13 වන දින දක්වා සාර්ථකව හැදෑරූ තිස්ස, ලෝකයේ විශේෂ හමුදාවන්ට පමණක් හිමිවන මෙරූන් හිස්වැසුම හිස ලා කමාන්ඩෝ ලාංඡන පැළඳ කමාන්ඩෝ සෙබළකු වශයෙන් සේවයට එක්වීමේ වරම් ලැබුවේය.

සාමාන්‍ය සෙබළ තිස්ස ගුණසේකර පළමුවන කමාන්ඩෝ රෙජිමේන්තුවේ "බී" කණ්ඩායම වෙත අනුයුක්තව රාජකාරී ඇරඹූ අතර, ක්‍රියාන්විත රාජකාරියෙහි මෙන්ම සෑම කටයුත්තකදීම දීප්තිමත් සෙබළකු වශයෙන් නිරතුරුවම කැපී පෙනුණි. ඔහු තම කණ්ඩය සමග මුතුර් ප්‍රදේශය සතුරු ග්‍රහණයෙන් මුදවාගැනීම පිණිස දියත් කළ "රිවිකිරණ I,II,III" සහ යාපනය කිලාලි, පලෙයි, මුහුමාලේ යන ප්‍රදේශ මුදවාගැනීමට පැවති "අග්නිඛීල" යන මෙහෙයුම්වලට එඩිතරව සහභාගී වී දක්වන ලද දක්ෂතා සහ ඉටුකරන ලද සේවය උදෙසා පූර්ණභූමි සහ උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම්වලින් ඔහු අගයනු ලැබීය.

සෙබළ ගුණසේකර 2000 වර්ෂයේ ලාන්ස් කෝප්‍රල් නිලයට උසස්වීම් ලද අතර, ඔහු දක්වන ලද දක්ෂතා හේතුවෙන් 2003 වර්ෂයේදී උපදේශකයකු ලෙස කමාන්ඩෝ පුහුණු පාසල උෑව කුඩාඔය වෙත අනුයුක්ත කළේය. ලක්මව සුරැකීමේ උදාතර ජාතික මෙහෙවරට උරදුන් මොහු නිරතුරුවම තම දෙමාපියන් පිලිබඳව සොයා ඔවුන්ට කෘතගුණ සැලකීමට කිසිවිට අමතක නොකළේය. තම දෙමාපියන් උදෙසා නව නිවසක් තැනීමට කටයුතු කළේය.

වර්ෂ 2005 ක් වූ මාර්තු මස 02 වන දින ගුණසේකර ප්‍රදීපා තිලකරත්න මෙනෙවිය සමග අතිනත ගත් අතර, 2005 ක්වූ දෙසැම්බර් මස 07 වන දින ඔවුන්ගේ කැදැල්ලට සිගිති පුතකු එක්විය. හේ නමින් සහන් හංසමාල් ගුණසේකර විය. 2006 වර්ෂයේදී අගභාගයේදී රජය විසින් එල්ටීටීඊ සංවිධානයේ ග්‍රහණයට ලක්ව සිටි වාකරේ ජනතාව බේරා ගැනීම සඳහා දියත් කරන ලද මෙහෙයුම් සඳහා ගුණසේකර ඇතුළු සෙබළුන් සහභාගී වූහ.

එහිදී, පළමුවන කමාන්ඩෝ රෙජිමේන්තුවේ කාර්යභාරය වූයේ මහින්පුර සිට ඊච්චලන්පත්තු, වෙරුගල්ආරු, මුත්තුආරු යන ප්‍රදේශවල සිටින සතුරන් විනාශ කර ඔවුන් සතුව තිබූ භූමි ප්‍රදේශය හා ප්‍රාණ ඇපයට තබාගෙන සිටින සිවිල් ජනයා මුදවා ගැනීමයි. නිරීක්ෂණ කණ්ඩායමක් මගින් ලබාදුන් තොරතුරකට අනුව




වෙරුගල් ආරුවෙන් අනෙක් පසට ගමන් කිරීම සඳහා බාධකයක්ව තිබූ බංකර් පෙළ අත්පත්කර ගැනීම ගුණසේකර ඇතුළු කුඩා ඛණ්ඩය හට පැවරුණි. එහිදී, සූක්ෂමව සතුරු බංකර් ආසන්නයට බඩගා සතුරාට විස්මයජනක ප්‍රහාරයක් එල්ල කරමින් මෙහෙයුමට සාර්ථක ආරම්භයක් ලබාදුන්නේය.

මේ සමඟ ගුණසේකර ඇතුළු කුඩා කණ්ඩායමට වෙරුගල්ආරුව තරණය කර අනෙක් ඉවුරට ගොස් බලය අල්ලා ගැනීමේ භාරදූර කාර්යය පැවරුණි. ඒ වනවිට සතුරාගෙන් එල්ලවූ ආර්පීජී ප්‍රහාර, මෝටාර් ප්‍රහාර හා කාලතුවක්කු ප්‍රහාර නොතකා තමා වෙත පැවරුනු කාර්යය හා වගකීම සාර්ථකව නිමකර ක්‍රියාන්විතය ඉදිරියට ගෙන යාම සඳහා මොහු විසින් අනුපමේය දායකත්වයක් දක්වන ලදී. මෙහිදී, සතුරු වෙඩි ප්‍රහාරයකට ලක්වූ ගුණසේකරට රෝහල් ගතවීමට පවා සිදුවිය. වීර සෙබළකු වශයෙන් නැවත යුධබිමට එක්ව සතුරන් පරාජය කරමින් තම මාතෘභූමියට ඇති ලැදියාව විදහා දැක්වූ ඔහු දක්වමින් තම ජීවිතය පරදුවට තබා තම ඒකකයේ සහ රෙජිමේන්තුවේ උදාරත්වය විදහා දක්වමින් සටන් වැදුණේය. සමස්ත සෙබළුන්ටද එහිදී ආදර්ශයක් වෙමින් තම ආත්මරක්ෂාවද නොතකා ගුණසේකර විසින් සිදුකරනු ලැබූ වික්‍රමාන්විතය වෙනුවෙන් හා ඔහු තුළ වූ රණකාමීත්වය උදෙසා ඔහු රණශූර පදක්කමෙන් පිදුම් ලැබුවේය.

සුව වී සේවයට පැමිණි ගුණසේකර නැවතත් ක්‍රියාන්විත රාජකාරි සඳහා අනුයුක්ත කරන ලද අතර, නැගෙනහිර ප්‍රදේශය ත්‍රස්ථවාදීන්ගෙන් මුදවාගැනීමේ මෙහෙයුම්වලදී දක්වන ලද දක්ෂතා හා මීට ප්‍රථම සටනේදී තුවාල ලැබීම හේතුවෙන් දේශපුත්‍ර පදක්කමෙන් හා නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කමෙන් පිදුම් ලැබිය. 2008 වර්ෂයේදී දැක්වූ දක්ෂතා හා විනයගරුකභාවය මත කෝප්‍රල් නිලයට උසස් වීම් ලැබුවේ මේ අතරතුරය. කොටි ත්‍රස්තවාදය විනාශ කිරීම උදෙසා යුද්ධ හමුදාව විසින් ආරම්භ කරන ලද ක්‍රියාන්විතවලදී පළමුවන කමාන්ඩෝ රෙජිමේන්තුව මුලතිව් දිස්ත්‍රික්කය තුළ විශේෂ ක්‍රියාන්විත රැසක් සිදුකළ අතර, මෙහිදී ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන මර්මස්ථානයක් වූ පුදුකුඩිඉරුප්පු ප්‍රදේශයේ පැවති සටනේ අවසන් භාගය වනවිට වියරු වැටී සිටි ත්‍රස්තයින් භූමියේ ඇති වැදගත් ස්ථාන උපක්‍රමික වශයෙන් උපයෝගී කර ගනිමින් යුද්ධ හමුදාවේ ගමන් මාර්ග අඩාළ කිරීමට උත්සාහ ගනිමින් සිටියහ. එකී ප්‍රදේශයෙහි බලය අත්පත්කර ගැනීමේ කාර්යය පළමුවන කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත පැවරී තිබුණි. වර්ෂ 2009 ක් වූ පෙබරවාරි මස 16 වන දින පළමුවන කමාන්ඩෝ රෙජිමේන්තුවේ "බී" කණ්ඩායම භාර නිලධාරි අණදෙනගේ නියෝගයන්ට අනුව කෝප්‍රල් තිස්ස ගුණසේකර තමා අණදෙන 8 දෙනාගෙන් යුත් ඛණ්ඩයත් සමඟ "දරපොයිට්" නම් වූ ස්ථානයේ බලය අත්පත්කර ගැනීම සඳහා පිටව ගියේය. මෙහිදී, කෝප්‍රල් තිස්ස ගුණසේකර නායකත්වයේ ලක්ෂණ මනාව පිළිබිඹු කරමින් පෙර සිදුකරන ලද ක්‍රියාන්විතවලදී ලත් ක්‍රියාන්විත පළපුරුද්ද උපයෝගී කර ගනිමින් දැඩිව එල්ලවූ සතුරු ප්‍රහාර හමුවේ නොබියව නිසි උපදෙස් ලබාදෙමින් තම අනුගාමික සෙබළුන් මෙහෙයවමින් සතුරා වෙත දැඩි ප්‍රහාර එල්ල කළේය.

තම සෙබළුන්ට එල්ලවන හානිය අවබෝධ කරගත් කෝප්‍රල් ගුණසේකර ස්ව කැමැත්තෙන්ම ඉදිරිපත්වී සතුරු බංකර් වෙත කඩා පනිමින් ප්‍රහාර එල්ල කළේය. එයින් නොනැවතී ඉදිරියට යන අවස්ථාවේ සතුරු වෙඩි ප්‍රහාරයට ලක්වූ ඔහු යළිත් තුවාල ලැබීය. මේ අවස්ථාව වනවිට "බී" කණ්ඩායමේ ඔහුගේ තවත් සහෝදර සෙබළුන් 18 දෙනකු තුවාල ලැබීය. තවත් සෙබළුන් 9 දෙනකු මියගියහ. සතුරු ප්‍රහාර දැඩිවීමත් සමඟ අතිරේක හට පිරිසක් එම ස්ථානය වෙත ගෙන්වා ගැනීමට නොහැකි තත්වයක් උදාවිය. ඒ වනවිට තවත් ත්‍රස්තවාදීන් පිරිසක් ඉදිරියට පැමිණෙමින් සිටියහ. ඒ දුටු කෝප්‍රල් ගුණසේකර තුවාල ලබා සිටි යෙදීන් තුවාල ලත් තම සහෝදර සෙබළුන්ගේ ජීවිත බේරාගැනීමට අභීතව උත්සුක විය. එල්එම්ජී අවියක් රැගෙන ඉදිරියට ගොස් පැමිණෙමින් සිටි ත්‍රස්තවාදීන්ට ප්‍රහාර එල්ල කළ ඔහු ඔවුන්ගේ ඉදිරි ගමන වලකාලමින් තම සහෝදර සොල්දාදුවන් ආරක්ෂිත ස්ථානයක් කරා රැගෙන යන තෙක් ප්‍රහාර එල්ල කළේය. මේ මොහොතේ නැවතත් ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද වෙඩි ප්‍රහාරයකට ලක්වීම නිසා මේ අභීත රණවිරුවා 2009 ක් වූ පෙබරවාරි 16 වන දින යුදබිමේදී දැයට සමු දී දෙනෙත් පියාගත්තේය.

තම මාතෘභූමියට ඇති ලැදියාව නිසා මියයන මොහොත දක්වාම ස්වකීය ජීවිතය හා ආත්මාරක්ෂාවට සිදුවිය හැකි උපද්‍රව නොතකා තම ඒකකයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ අභිප්‍රායෙන් යුතුව තම අනුගාමිකයන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වී සතුරා සමඟ අභීතව සටන්වැද තම රණකාමීත්වය විදහා දක්වමින් කරනු ලැබූ වික්‍රමාන්විතවූද අභීතභාවය ප්‍රදර්ශනය කරන්නාවූද උත්කෘෂ්ඨ ක්‍රියාව අරභයා මෙම රණවිරුවා හට එවකට

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති සහ සන්නද්ධ සේනාධිනායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2013 ජූලි මස 15 වන දින අරලියගහ මන්දිරයේදී සැරයන් ගුණසේකර පරම වීර විභූෂණයෙන් පිදුම් ලද්දේය.

වර්ෂ 2009 ක් වූ පෙබරවාරි 16 වන දින හෝරා 1600 පැයට උදාරතර රණවිරුවාගේ දේහය බලවලමුල්ල පොදු සුසාන භූමියේදී පූර්ණ යුද්ධ හමුදා ගෞරවය සහිතව මිහිදන් කළ අතර, රටදැය වෙනුවෙන් සටන්වැද දිවිදුන් මේ අභීත රණවිරුවාණන් සිහිකරනු වස් ඔහුගේ දේහය තැන්පත් කළ ස්ථානයේ ඔහු වෙනුවෙන් සෙහොන් කොතක් තැනීමට පවුලේ ඥාතිහු කටයුතු කළහ.

තම ආදරණීය සැමියාගේ සමුගැන්මත් සමග පුත්‍රරත්නය හා තනිව ජීවන ගමන ඇරඹූ ප්‍රදීපා තිලකරත්න මහත්මිය මේ වනවිට මහගම විශාඛා සමිතියේ ගණන් පරීක්ෂක නිලධාරිනියක වශයෙන් කටයුතු කරන අතර, හොරොම්බාව රණවිරු සංචිතයේ උප ලේකම්වරිය වශයෙන්ද කටයුතු කරන්නීය. හංසමාල් ගුණසේකර පුංචි පුතු කුඩා කල සිටම පියා මෙන්ම තරමක දඟකාර චරිතයකි. නක්කාවත්ත ජාතික පාසලෙහි 07 වන ශ්‍රේණියෙහි දීප්තිමත් සිසුවකු වශයෙන් සිප්සතර හදාරමින් සිටියි.




හංසමාල් ගුණසේකර සිඟිති පුතු අද දින නිදහසේ පාසල් යන්නේත් ප්‍රදීපා තිලකරත්න මහත්මිය තම පුතු නිවසට පැමිණෙන තුරු නොබියව සිටින්නේත් තිස්ස ගුණසේකර රණවිරුවා වැනි අභීත රණවිරුවන් දිවිපුදා මේ මාතෘභූමියේ නිදහස තහවුරු කළ බැවිනි. ඔවුන් පමණක් නොව මුළුමහත් ශ්‍රී ලාංකිකයන්ටම අද දින බියෙන් සැකයෙන් තොරව සැනසීමෙන් කල්ගත කිරීමට හැකිව ඇත්තේ එම කැප කිරීම මතය. පායන හිරු කිරණ මෙන්ම හමා එන මඳ නල අපට ලබාදෙන සැනසුම සදාකල් ආරවත් වන්නේ අභීත තිස්ස ගුණසේකර රණවිරුවා වැන්නවුන්ගේ පරාර්ථකාමී උතුම් කැපකිරීම නිසාය.

*සටහන -:*

*"උත්තමාචාරය" ග්‍රන්ථය ඇසුරිනි...*

# 52 වන පාබල සේනාංකයේ වොලිබෝල් තරඟාවලිය





ආරක්ෂක අංශ සාමාජිකයින් සහ ප්‍රදේශයේ දමිළ තරුණයින් අතර පවතින සහයෝගීතාවය තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් යුතු කච්චායි කිංග්ස් සහ මීසාලෙයි අයන්කරන් වොලිබෝල් කණ්ඩායම් අතර සුහද වොලිබෝල් තරඟාවලියක් ඉකුත් නොවැම්බර් 05 වන දින යාපනය මිරුසුවිල් හි පිහිටි 52 වන පාබල සේනාංක බොලිබෝල් ක්‍රීඩා පිටියේදී පවත්වන ලදී.

එහිදී, පැවති තියුණු තරඟයකින් පසු මීසාලෙයි අයන්කරන් වොලිබෝල් කණ්ඩායම ශුරතාවය දිනාගැනීමට සමත්විය. 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීඑස්් ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මගපෙන්වීම යටතේ පැවති මෙම තරඟාවලියේ සම්බන්ධීකරණ කටයුතු 52 වන පාබල සේනාංකයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලුතිනන් කර්නල් ඊඩීඑම් ජයකාන්ත විසින් සිදුකරන ලදී. තවද, තරඟය නැරඹීම සඳහා අතිරේක දිස්ත්‍රික් ලේකම්, චාවකච්චේරිය සහකාර පොලිස් අධිකාරී, එම සේනාංකයේ නිලධාරීන්, සෙබළුන්, කොඩිකාමම් පොලිස් ස්ථානයේ ස්ථානාධිපති, ග්‍රාම නිලධාරීන්, ප්‍රදේශයේ තරුණ තරුණියන් සහ සෙසු පිලයින් රැසක් සහභාගී වූහ.



# ක්‍රීඩා විත්ති

## ජාතික බර ඉසිලීමේ ශූරතාවලිය - 2022, ශූරතාවය යුද්ධ හමුදාවට







ජාතික බර ඉසිලීමේ ශූරතාවලිය - 2022, පොළොන්නරුව, ගල්ලැල්ල ජාතික ක්‍රීඩා සංකීර්ණයේදී නොවැම්බර් මස 10 - 13 දිනයන්හිදී පැවැත්විණ. එහිදී නාවික සහ ගුවන් හමුදා කණ්ඩායම් ඇතුළු දීපව්‍යාප්ත ක්‍රීඩා සමාජ 11 ක් පරදවා ශූරතාවය හිමිකර ගැනීමට යුද්ධ හමුදා බර ඉසිලීමේ ක්‍රීඩකයෝ සමත්වූහ. තවද, තරගාවලියේ අනුශූරතාවද ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බර ඉසිලීමේ කණ්ඩායම විසින් හිමිකර ගැනීම විශේෂත්වයකි.

තරගාවලියේදී යුද්ධ හමුදා බර ඉසිලීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් රන් පදක්කම් 4ක්, රිදී පදක්කම් 9ක් සහ ලෝකඩ පදක්කම් 4ක් දිනා ගන්නා ලද අතර, 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ සැරයන් කුමාර වයිඩීඅයි බර ඉසිලීමේ ඉසව්වේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස සම්මාන ලැබිය.

## ජාතික සවි එසවීමේ තරගාවලියේ සමස්ත ශූරතාවය යුද්ධ හමුදාවට






ජාතික සවි එසවීමේ තරගාවලිය - 2022, කොළඹ රාජ් සමුද්‍රා හෝටල් පරිශ්‍රයේදී ඉකුත් ඔක්තෝබර් 29 වන දින පැවැත්විණ. එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා සවි එසවීමේ ක්‍රීඩකයින් රන් පදක්කම් 4 ක්, රිදී පදක්කම් 3 ක් සහ ලෝකඩ පදක්කම් 1ක් දිනා ගනිමින් සමස්ත ශූරතාව දිනා ගැනීමට සමත් වූහ.

දිවයින පුරා සවිඑසවීමේ ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් ක්‍රීඩකයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම තරගාවලියේ දක්ෂතම සවි ඔසවන්නාට හිමි සම්මානය බලලත් නිලධාරි II ප්‍රදීප් එස්කේඑස් විසින් හිමිකර ගන්නා ලදී. ශ්‍රී ලංකා සවිඑසවීමේ සම්මේලනය මගින් සංවිධානය කරන ලද මෙම තරගාවලියේ කාන්තා හා පිරිමි අංශ යටතේ බර කාණ්ඩ රැසක් වෙනුවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ තරග වැදුණහ.

# ජාතික ඔරු පැදීමේ ශූරතාව යුද්ධ හමුදාවට






දියවන්නාවේ ඔරු පැදීමේ මධ්‍යස්ථානයේ පැවති 37 වැනි ජ්‍යෙෂ්ඨ ජාතික ඔරු පැදීමේ ශූරතාවලිය -2022 සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඔරු පැදීමේ පිරිමි සහ කාන්තා යන අංශ දෙක රන් පදක්කම් හතක් හිමිකර ගනිමින් සමස්ත ශූරතාවය හිමිකර ගැනීමට සමත් වූහ. ශ්‍රී ලංකා ආධුනික ඔරු පැදීමේ සංගමය විසින් දින තුනක් පුරාවට සංවිධානය කර තිබූ එම ඔරු පැදීමේ තරග ඉසව් සඳහා ත්‍රිවිධ හමුදාව, වෙනත් සංගම්, විශ්වවිද්‍යාල සහ පාසල් නියෝජනය කරමින් කණ්ඩායම් 12ක් තරග වැදුණි. ඉන් යුද්ධ හමුදා සහ නාවික හමුදා කණ්ඩායම් දෙක අවසන් තරගය සඳහා සුදුසුකම් ලැබූ අතර, එහිදී තියුණු තරගයකින් අනතුරුව යුද්ධ හමුදා කණ්ඩායම ජයග්‍රහණයට හිමිකම් කියූහ. තරග ඉසව් 10කින් සමන්විත වූ මෙම තරගාවලියේදී රන් පදක්කම් 7ක් දිනාගැනීමටද යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත්වීම විශේෂත්වයකි.

# අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරඟාවලියේදී ගජබා ක්‍රීඩකයන්ගෙන් දස්කම්







අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලිය - 2022, සම්මාන ප්‍රදානෝත්සවය ඉකුත් නොවැම්බර් 10 වන දින පනාගොඩ පිහිටි යුද්ධ හමුදා ක්‍රීඩා සංකීර්ණයේදී උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි. සම්මාන ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්කොෂ් කමිටුවේ සභාපති, 1 වන බලකායේ සහ කමාන්ඩෝ රෙජිමේන්තුවේ අධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී සහභාගී විය.

යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 16 ක ස්කොෂ් කණ්ඩායම් ක්‍රීඩකයින් නියෝජනය කරමින් සැප්තැම්බර් මස 23 සිට 30 දක්වා පැවති මෙම තරගාවලියෙහි ගජබා රෙජිමේන්තු ස්කොෂ් ක්‍රීඩකයින් ශූරතා කුසලානය දිනාගත් අතර, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා පාබල හමුදා ක්‍රීඩකයින් පළමු සහ දෙවන අනු ශූරතාවයන් දිනාගනු ලැබූහ. තරගාවලියේදී ගජබා රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ඩැනියෙල් එස්එන් විවෘත පිරිමි අංශයේ ජයග්‍රහණය හිමිකර ගත් අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ සාමාන්‍ය සෙබළ ජයමාලි පීආර්එන් විසින් කාන්තා විවෘත අංශයේ ජයග්‍රහණය හිමිකර ගන්නා ලදී. අවසන් මහා තරගය නැරඹීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු, 14 වන සේනාංකයේ සේනාංකාධිපති, යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂ ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ක්‍රීඩා ලෝලීන් විශාල පිරිසක්ද සහභාගී වූහ.

# ජාතික ජලපන්දු ශූරතාවලියේ යුද්ධ හමුදාවට ජයක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි "දියපන්දු" (වෝටර් පෝලෝ) කණ්ඩායම 2022 ඔක්තෝබර් මස 18 දින සිට 20 දින දක්වා සුගතදාස ක්‍රීඩාංගණ පිහිනුම් තටාකයේ පැවැති ජාතික "දියපන්දු" ශූරතාවලියේ තෙවන ස්ථානය දිනාගැනීමට සමත්වූහ. තරගාවලිය සඳහා දිවයින පුරා "දියපන්දු" කණ්ඩායම් 10 ක් සහභාගී වූහ.


# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අන්තර් බලඇණි සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අන්තර් බලඇණි සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ අවසන් මහා තරගය ඉකුත් ඔක්තෝබර් මස 27 දින පුදුකුඩිඉරුප්පු පිහිටි 3 වන (ස්වේච්ඡා) විජයබාහු පාබල රෙජිමේන්තු ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ක්‍රිකට් කණ්ඩායමට දක්ෂතම ක්‍රිකට් ක්‍රීඩකයින් තෝරාගැනීමේ අරමුණින් එම රෙජිමේන්තුවේ විවිධ බලඇණි නියෝජනය කරමින් කණ්ඩායම් 17 ක් මෙම තරගාවලියට සහභාගී වූහ. එහිදී, තරගාවලියේ ශූරතාවය 3 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම දිනාගත් අතර, අනුශූරතාවය 6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායමට හිමිවිය. මෙම තරගාවලියේ අවසන් මහා තරගය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ 68 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව් පොන්නම්පෙරුම ආර්එස්පී පීඑස්සී විසින් ජයග්‍රාහකයින් වෙත ත්‍යාග ප්‍රදානය කරන ලදී.

# 12 වන ආරක්ෂක සේවා උළෙලේදී යුද්ධ හමුදාවෙන් දස්කම්





12 වන ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙලේ කඹ ඇදීමේ ශූරතා ඉසව්ව ඔක්තෝබර් මස 26 දින සිට 28 දින දක්වා කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේදී පැවැත්විණි. එහි අවසන් මහා තරගයේදී කිලෝග්‍රෑම් 640 බර පන්තිය නියෝජනය කරමින් ශ්‍රී ලංකා නාවික හමුදා ක්‍රීඩකයන්ට එරෙහිව 2 - 0 ක් ලෙස ශූරතාව දිනාගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩකයෝ සමත් වූහ. එසේම, කිලෝග්‍රෑම් 560 බර පන්තිය නියෝජනය කරමින් යුද්ධ, නාවික සහ ගුවන් හමුදා කාන්තා කණ්ඩායම් තරග වැදුණු ශූරතාවලියේදී නාවික හමුදා ක්‍රීඩිකාවන්ට එරෙහිව 2 - 0 ක් ලෙස ශූරතාව දිනාගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩිකාවෝ සමත්වූහ.

# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ තරගාවලිය





යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ තරගාවලිය පසුගිය නොවැම්බර් 14 වන දින සිට 21 වන දින දක්වා දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණ. මෙම තරගාවලිය සඳහා යුද්ධ හමුදා රෙජිමේන්තු 16 ක් හා කාන්තා බලකා 05 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 450 දෙනකු සහභාගී වූහ. එහිදී, ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායම, යුද්ධ හමුදා සේවා බලකා කණ්ඩායම අභිබවමින් පිරිමි ශූරතාව දිනාගත් අතර, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව තරගාවලියේ තෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී. කාන්තා අංශයේ ශූරතාව 5 (සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය දිනාගත් අතර, 4 (සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය හා 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය පිළිවෙලින් එහි අනුශූරතාව හා තෙවන ස්ථානය දිනාගත්හ.

තරගාවලියේ විශේෂ දක්ෂතා දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වන දක්ෂතම ක්‍රීඩකයා ලෙස සාජන් බාලසූරිය ශ්‍රීලපාහ, දක්ෂතම කඩුලු රකින්නා ලෙස ලාන්ස් කෝප්‍රල් ජයරත්න ආර්ඒඑස්එච් ශ්‍රීලයුසේබ, දක්ෂතම පිතිකරු ලෙස සාජන් කල්හාර ඩීඒඩීසී ශ්‍රීලයුසේබ, දක්ෂතම ක්‍රීඩිකාව ලෙස කෝප්‍රල් දමයන්ති එම්එන්එල්කේ 5 ශ්‍රීලයුකාබ, දක්ෂතම කඩුලු රකින්නිය ලෙස ලාන්ස් කෝප්‍රල් සමන්මලී 5 ශ්‍රීලයුකාබ, හා දක්ෂතම පිතිකාරිනිය ලෙස ලාන්ස් කෝප්‍රල් ධර්මදාස 5 ශ්‍රීලයුකාබ යන අය එහිදී සම්මාන දිනාගනු ලැබූහ.

යුද්ධ හමුදා එල්ලේ කමිටුව විසින් සංවිධානය කෙරුණු මෙම තරගාවලියේ ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා එල්ලේ කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ආර්ඩබ්ලිව්ඩබ්ලිව්එච්ජේබී වනිගසේකර යූඑස්පී, විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ඇතුළු නිලධාරීන් රැසක් සහභාගී වූහ.

# අන්තර් රෙජිමේන්තු පාපන්දු ශූරතාවය යුද්ධ හමුදා සේවා බලකායට

මෙම වසරේ ජනවාරි මස ආරම්භ වූ අන්තර් රෙජිමේන්තු පාපන්දු ශූරතාවලිය - 2022 තරගාවලියේ අවසන් මහා තරග ඉකුත් නොවැම්බර් 22 වන දින පස්වරුවේ කොළඹ තුරග තරග පිටියේදී පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 17 ක නියෝජනයෙන් පැවති මෙම පාපන්දු ශූරතාවලියේ අවසන් මහා තරගය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා කණ්ඩායම සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා කණ්ඩායම සුදුසුකම් ලැබූහ.

එම අවසන් මහා තරගයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපතිතුමන් නියෝජනය කරමින් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය. එහිදී, තියුණු සටනකින් අනතුරුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා පාපන්දු කණ්ඩායම පරාජයට පත්




කරමින් ගෝල 4 - 2 ක් ලෙස ජයග්‍රහණය කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා පාපන්දු කණ්ඩායම සමත්වූහ. එහිදී, තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා කණ්ඩායමේ මාණ්ඩලික සැරයන් සිල්වා එච්ඩීඑම් විසින් දිනාගත් අතර, හොඳම ගෝල රකින්නා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා කණ්ඩායමේ සාමාන්‍ය සෙබළ ගිම්හාන එම්ඒඑන් සම්මාන හිමිකර ගත්හ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පාපන්දු කමිටුවේ සභාපති සහ පිරිස් පරිපාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේජ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී විසින් ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සම්බන්ධතාවයෙන් අන්තර් රෙජිමේන්තු පාපන්දු ශූරතාවලිය - 2022, පැවැත්වීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරනු ලැබිය.

### නොදුටිමි ලොව...

සිතුවිලි අතරම පවී සිත කැන්දා
ලොව හැමතැන අද තරකර නින්දා
ලොව්තුරු බුදුබණ කොතනද රන්දා
අපමණ සසර දුක් කඳ වින්දා

බුදුහිමි දෙසූ බණ කොතනද රැඳුනේ
අප හදවත තුළ සිරකර තිබුණේ
නැත ඒ කල් අද පින්සිත වැසුනේ
කරුමෙක උරුමය ලො අග පිපුනේ

මනුසත්කම හද පැතලා දුවන්ටයි
නොම්නිස්කම අද හදේ තියෙන්ටයි
පෙරකළ පවකට උරුම කරන්ටයි
ලැබූ ජීවය අද දුකම විඳින්ටයි

සෙ/එස්108189
ඉසෙ නිමල් ශාන්ත එස්ජ්
13 වන ඉංජිනේරු සේවා බළගණය
යුහමු

### සිගිති හිනා...

කිරිකැටි සුදු සිගිති හිනා
සිත දවටයි රසට පෙරා
දොයි දොයි දොයි දොයිය බබා
බයි බයි බයි බයිය බබා

බබෝ නුඹේ තාත්තියා
දුරට ගියා අපව දමා
වට්ස්ඇප් ඇමතුමෙන් එයා
දෝණිට දෙයි රසට හිනා

හොයනවා මම ගෙතුළ පුරා
තාත්තියා කොහිද කියා
මගේ හිතට හයිය එයා
ඉන්නවා නම් ගෙදර අපේ

මා මිරිකා අඬවන්නට
මල් පෙත්තක් සේ වඩන්න
තැලවෙන්නම් අනේ ඉතින්
දොයි දොයි දොයි දොයිය බබා
බයි බයි බයි බයිය බබා

මේජර් ඩබ්ලිව්ජීයූ පෙරේරා
ශ්‍රීලයුපොදුසේව
යුද්ධ හමුදා ගොවිපල
කන්දකාඩු

### සෙබළ පුතු...

ජීවිතය ආදරය
දුර ඈත සිට අත වනයි
මෑණියන්, පෙම්වතිය
දුරට වී පෙම් බඳියි
පතිනියද පුංචි පුතු
දුරට වී ඉකි බිඳියි
වීර පුතු යොවනය කැප කරන්
යුද බිමක අපි දුරයි

සෙ/753797
කෝප්‍රල් කුමාරසිංහ එම්පීජ්එම්
11 ඉසේරෙ

### යසෝරාවියේ...

ගිරිමල් යෞවනයේ යසෝරාවියේ
නුඹ පා තබන මේ මාවත බියකරුය
වින මෑගයන්ගේ පාරාදීසයේ නුඹ මුවැත්තියකි
කටුකොහොලින් පිරී විසල් වූ මේ ලෝකයේ
නුඹගේ ජීවන ගමන කෙතරම් බියකරුද

සෙ/2ඩී03197
ලා/කෝ දයාරත්න ඩීඑච්
2 ශ්‍රීලපාහ




### මගේ ඒකකය ආ ගමන්මඟ...

බැඳුනේ මුලින් බලමුලුවටයි ජාතික ආරක්‍ෂාවේ
අටතුන් වසර ගෙව්වා එම රෙජිමේන්තුවේ
සිරියන් එලෙස අප කරමින් ඩියුටිය මන්නාරම් තඩුවේ
ටීඑස්ආර් බලකායටයි අප සැම එකතු උනේ

ස්ථාපනය කෙරුවා දෙදහස් දහයේ
නැවතු තැන තමයි අප සැම පානදුරේ
නැතුවනෙ තිබුණේ 12(සේවා) ඉසේරෙ
ඒකක පිහිටුවා දැන් මෙම බලකායේ

පළමුවන අණදෙන නිලධාරී ලෙස මෙම ඒකකයේ
එස්ජී ගෝනුපින්නවලයි ලුතිනන් කර්නල් නිලයේ
ඇත අඩුපාඩු නැත සම්පත් අප නවතම අප ඒකකයේ
නෑ පැරදුනේ අප කවදත් ඈත්තට යුද හමුදාවේ

ගතවිය වසර තුනතුන් මෙම රෙජිමේන්තුවේ
වූවා පුරුදු සෑම සෙබලුන් වත්තියේ
වෙනසකි ඇත්තේ ඇත්තට දැන් යුද හමුදාවේ
අප ලද භාග්‍යයකි ආපසු වෙත ඉසේරෙ

දීනයයි එලඹුනේ හමුදා සංවත්සරය
දහයයි දහයටම යෙදුණා ඒකක සංවත්සරය
තිබුණා මෙදා නම් සරුවට සංවත්සරය
දීගුකල් ඕනා වැජඹෙන්නට අපෙ ඒකකය

සෙ/එස්102124
කෝප්‍රල් වනසිංහ ඩබ්ලිව්එම්සීඑස්
12(සේවා) ඉසේරෙ

### යෝධ රැජිනිය...

කනිසම හැඩවෙන
කම්හල් රෑ වැඩ
නිමවූ හෝරාවේ
නුඹ මුව මඬල
විඩාබරව තලුවන් වී
හෙම්බත් බවක් පෙනේ

පිබිදී හිමිදිරි උදෑසනින්
කඩිමුඩියේ මෙහෙවර දවසේ අරඹා
කැරකෙන කම්හල් මැසීමක
ගත වීරිය රැඳී
යෝධ රැජිනියකි
නුඹ මෑණියනී

නි/70207
කපිතාන් (උපා)
එච්එස් චන්ද්‍රසිරි ගරෙ
අමාප්‍රකා නිල නිවස

### රෝමියෝ නුඹ එන්න...

රෝමියෝ නුඹ එන්න
කියාදෙන්නම් අපේ පෙම් කතාව..
ලොවක් සමඟ යුදවැදී
ජයගත් හැටි ප්‍රේමයෙන්..
දකිනතුරු ඇසිපිය නොහෙලා
බලා ඉදපු..
හමුවුනත් පැය ගණන්
හදවතින් පමණක් කතාකරපු..
ආත්මයෙන් ආත්මයට
වියපත් නොවුනු අපේ ඒ පෙම්කතාව..
රෝමියෝ නුඹ එන්න
ප්‍රේමයෙන් ජයගන්න
කියා දෙන්නම් මම නුඹට
වචනයකුදු නොසගවා එක හුස්මට..

ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක
ගරෙ

### ණය බරිත අසහනය...

කන කෑම රස නෑ
බොන වතුර පෙවෙන්නෙ නෑ
සැනසිල්ලෙ නින්ද නෑ
සහනය හිස වසා
දැනෙන විට අසහනය
සතුට කොහෙ දෝ ඈතට ගිහින්

මේජර් කේකේජ්එස් කුමාර
ශ්‍රීලංජාආවමු, ආසේමු (වන්නි)

# ජනගහනය...

**ගුරුතුමා** - ඔය ළමය කියන්න බලන්න ලංකාවෙ ජනගහනය කියද කියල?

**කමල්** - සර්... කෝටි 35 යි.



**ගුරුතුමා** - හැ... එහෙම වෙන්නෙ කොහොමද?

**කමල්** - ඇයි සර්... මිනිස්සු කෝටි දෙකයි... තිස්තුන් කෝටියක් දෙවියොයි...

# කුඩාම නගරය...

**ටීචර්** - සිරිපාල කියනවා බලන්න ලංකාවේ කුඩාම නගරය මොකක්ද කියලා?

**සිරිපාල** - අම්බලන්ගොඩ... ටීචර්

**ටීචර්** - ඈ... ඒ කොහොමද එහෙම වෙන්නේ...?

**සිරිපාල** - ඇයි ටීචර්... "ආයුබෝවන් අම්බලන්ගොඩ" කියල ලියපු බෝඩ් එකේම අනිත් පැත්තෙ ලියල තියෙනවා "ස්තූතියි නැවත එන්න" කියලා...





# ලෝකාන්තය...

සිරිපාල තම මිතුරු පෙරකදොරුවන් කීපදෙනකු සමග ලෝකාන්තය නරඹන්නට ගොස් සිටියදී හෝර්ටන් තැන්න ප්‍රදේශයේ ගැමියන් දෙතුන් දෙනකු ද එහි සිටිනු දුටුවේය. ඒ අවට සුන්දරත්වය නිහඬව දිගු වේලාවක් විඳිමින් සිටි හේ තමා අසල සිටි ගැමියකු දෙස බලා, පරක් තෙරක් නොපෙනෙන ලෝකාන්තය දෙසට අත දිගු කොට මෙසේ ඇසුවේය.

**පෙරකදෝරුවා** -මෙතනින් මිනිස්සු නිතරම පහළට වැටෙනවද...?

**ගැමියා** - නෑ ආයුබොවන්ඩ... නිතර වැටෙන්න ඕනැවෙන්නෙ නැහැ... එකපාරක් වැටුණම ඇති.

# ගියර් එක...

තම අලුත මිලදීගත් කාරයෙන් නුවර යාමට පිටත්වූ පියසෝම ගෙදර පැමිණියේ දින හතරකට පසුවය. මේ පිළිබඳ මහත් උරණ වී සිටි ඔහුගේ බිරිඳ ඔහු නිවසට පැමිණි විගස ඇගට ගොඩවන්නට වූවාය.

**බිරිඳ** - ආ... හරි අපූරුයි මිනිහ ගෙදර එන දවස... මෙච්චර දවස් මොන මගුලක් කළාද එහෙට වෙලා...

**පියසෝම** - මන් කරපු මගුලක් නෑ හාමිනේ... මේ කාර් එක හදපු සුද්දා ඉස්සරහට යන්න ගියර් හතරක් හැදුවට පස්සට යන්න හදල තියෙන්නෙ එක ගියර් එකයිනෙ...



# බඩගෑම...

**මල්සිරි** - මචං... ඕන ගණංකාරයෙක් මට එකක් ගහයි... ඊැබැයි දෙවනි එක ගහන්න බඩ ගාගෙන එන්න වෙනවා...

**පෙරේරා** - එහෙනං උඹත් හොඳ ගණංකාරයෙක්නේ...

**මල්සිරි** - නෑ මචං එතකොට මම ඇඳ යටනේ...



# ENGLISH VISION

*English Vision* පාඩම් මාලාව ඔස්සේ *Art of the language* (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මඟින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## There is no need to

යම්කිසි කාර්යයක් කිරීම සබැඳිව එය එසේ කිරීමට **අවශ්‍යතාවක් නෑ**" යන අර්ථය ප්‍රකාශවන පරිදි වාක්‍ය නිර්මාණය කිරීම සඳහා මෙම වාක්‍යය රටාව භාවිතා වේ.

***Fomular*** :- සූත්‍රය

**There is no need to + Verb (infinitive) + Object + Rest.**
දෙයාර් ඊස් නෝ නීඩ් ටු + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
අවශ්‍යතාවක්නෑ + ක්‍රියා පදය (මූල ස්වරූපය) + කර්මය + ඉතිරිය.

***Ex*** / *උදා* :-

1. There is no need to meet her.
   දෙයාර් ඉස් නෝ නීඩ් ටු මීට් හර්.
   ඇයව හමුවීමේ අවශ්‍යතාවක් නැහැ.

2. There is no need to tell them about this incident.
   දෙයාර් ඉස් නො නීඩ් ටු ටෙල් දෙම් දිස් ඉන්සිඩන්ට්.
   ඔවුන්ට මේ සිදුවීම සම්බන්ධව කීමට අවශ්‍යතාවක් නොමැත.

3. There is no need to discuss again.
   දෙයාර් ඉස් නො නීඩ් ටු ඩිස්කස් අගෙයින්.
   නැවත සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවක් නොමැත.

***Nota Bene*** / සැ.යු :-

ඉහත වාක්‍යයෙහි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී,

- **There is no need to :-** "අවශ්‍යතාවයක් නැහැ" යන අර්ථය ගම්‍ය වන මෙම වාක්‍යය කණ්ඩය කිසිදු වෙනසකට භාජනය නොකොට වාකයේ භාවිතා වේ.

- **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී (infinitive) ක්‍රියා මූල පදයක් ලෙස භාවිතා කළ යුතුය.

- **Object :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන භේදයකින් තොරව භාවිතා වේ.


- **Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

**Analysis of the sentence formation** - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේශණය.

**Subject + Didn't mean to + Verb (Infinitive) + Object + Rest.**
සබ්ජෙක්ට් + ඩිඩ්න්ට් මීන් ටු + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + අදහස් කළේ නෑ + ක්‍රියාපදයේ මූලික ස්වරූපය + කර්මය+ ඉතිරිය.

**There is no need to call them.**
දෙයාර් ඊස් නෝ නීඩ් ටු කෝල් දෙම්.
ඔවුන්ව අමතන්නට අවශ්‍යතාවක්නෑ.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද, ඔබට මඟහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.




මේජර් චමින්ද ලියනගේ
[illegible]

www.englishvision.lk

**වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ**
**ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි**
**"රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.**



යුද්ධ හමුදා මූලස්ථානයේ උපකරණ මාස්ටර් ජෙනරාල් ලෙස

**මේජර් ජෙනරාල්**
**පීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2022 නොවැම්බර් මස 28 වන දින සිට**



ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ**

**2022 නොවැම්බර් මස 17 වන දින සිට**



61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී**

**2022 නොවැම්බර් මස 14 වන දින සිට**



62 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ආර්ඒජේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී**

**2022 නොවැම්බර් මස 13 වන දින සිට**



යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**පීජ් මුණසිංහ ආර්එස්පී ඒටීබී**

**2022 නොවැම්බර් මස 21 වන දින සිට**



විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**පීපීජ් පෙරේරා පීඑස්සී එච්ඩීඑම්සී**

**2022 නොවැම්බර් මස 04 වන දින සිට**



ජනමාධ්‍ය අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී පීඑස්සී**

**2022 නොවැම්බර් මස 06 වන දින සිට**



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**ඒපී වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී**

**2022 නොවැම්බර් මස 21 වන දින සිට**



යුද්ධ හමුදා තූර්යවාදක හා රංගකලා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**ටීඑම් හෙට්ටිආරච්චි ආර්එස්පී**

**2022 නොවැම්බර් මස 28 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**බ්‍රිගේඩියර්**
**එස්පීජී ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2022 නොවැම්බර් මස 17 වන දින සිට**



112 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්එම්එල්එස් දයාවංශ**

**2022 නොවැම්බර් මස 18 වන දින සිට**



612 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**එච්පීඅයි පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 නොවැම්බර් මස 09 වන දින සිට**



141 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**එල්පීබී කාරියවසම්**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2022 නොවැම්බර් මස 15 වන දින සිට**



662 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**කේපීපී කරුණානායක**

**2022 නොවැම්බර් මස 21 වන දින සිට**



533 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**ඒඑම්එස්ඩීබී අධිකාරි ආර්එස්පී**

**2022 නොවැම්බර් මස 25 වන දින සිට**



572 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**කේඑච්ටීපී විමලසේන**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 නොවැම්බර් මස 05 වන දින සිට**



6 වන බලඇණිය ගජබා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ආර්එම්එල්අයි රත්නායක**
**යූඑස්පී**

**2022 නොවැම්බර් මස 24 වන දින සිට**



3 වන රෙජිමේන්තුව
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
සේවා බලකායේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**කේඩීකේ ජයසිංහ**
**පීඑස්සී එල්එස්සී**

**2022 නොවැම්බර් මස 16 වන දින සිට**



9 වන ශ්‍රී ලංකා
ජාතික ආරක්ෂක බලමුළුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**එච්පීඅයි කුමාර**

**2022 නොවැම්බර් මස 13 වන දින සිට**



11 (සේවා) ශ්‍රී ලංකා
සිංහ රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඩීඑම්එන් පත්මසිරි**

**2022 නොවැම්බර් මස 16 වන දින සිට**

# 8 වසක සැමරුම අභිමානවත්ව





17 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවෙහි 8 වන සංවත්සරය පසුගිය නොවැම්බර් 11 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ඒකක අණදෙන නිලධාරී මේජර් ඊඒඩීපී එදිරිසිංහ ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පවත්වනු ලැබීය. මෙහිදී, සියලු නිලයින්ගේ සහභාගීත්වයෙන් පැවති විනෝද ජනක ක්‍රීඩා සියලු නිල දිවා භෝජන සංග්‍රහය සහ සංගීත ප්‍රසංගය ප්‍රධාන විය. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා ඉංජිනේරු ස්ථානයන්හි නිලධාරීන්, නිලධාරිණියන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# අකුරට යන්නට දෙපයට දිරියක්





233 වන පාබල බලසේනාවට අයත් 9 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ භටපිරිස් විසින් "දිඹුලාගල අධ්‍යාපන කලාපයට" අයත් පාසල්වලින් තෝරාගත් අඩු ආදායම්ලාභී සිසු සිසුවියන් සඳහා පාසල් පාවහන් යුගල 60 ක් දිඹුලාගල කලාප අධ්‍යාපන කාර්යාල පරිශ්‍රයේදී ඉකුත් නොවැම්බර් 02 වන දින ප්‍රදානය කරන ලදී.

ආරක්ෂක සේනා නැගෙනහිර ආඥාපතිගේ මාර්ගෝපදේශ යටතේ, 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ උපදෙස් පරිදි මෙම උත්සවය සංවිධානය කෙරිණ. මෙම වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වය (විශ්‍රාමික) මේජර් ජෙනරාල් චන්න ගුණතිලක නිලධාරීගේ ඉල්ලීමකට අනුව (*Ceylon Leather Products PLC (pvt) Limited*) ආයතනය විසින් ලබාදෙන ලදී.

පසුගිය කාලය පුරාවට අඛණ්ඩව එම ආයතනයේ අනුග්‍රාහකත්වය ඇතිව මෙම අධ්‍යාපන කලාපයෙහි අඩු ආදායම්ලාභී ළමුන් සඳහා අදියර කිහිපයක් යටතේ පාවහන් යුගල 5761 ප්‍රමාණයක් ලබා තිබීම විශේෂත්වයකි.

මෙම අවස්ථාවට 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ඒ කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, චන්ද්‍රිමාලා වාසලමුදලි මහත්මිය, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක, 233 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 232 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 9 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරී, විදුහල්පතිවරු, ගුරුවරු, දෙමාපියෝ, නිලධාරීහු සහ සෙසු නිලයින් රැසක් එක්වූහ.

# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
එච් වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආරඑම්ඩබ්ලිව්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්ලූ ලක්ෂිකා

---

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බම්බ II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑච් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

---

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

---

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

---

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

---

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

---

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය





# නවලෝක විරුසුව සරණ





යුද්ධ හමුදා සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා නවීනතම සෞඛ්‍ය ප්‍රතිලාභ පිරිනමනු ලබන "නවලෝක විරුසුව සරණ" වරප්‍රසාද කාඩ්පත සංකේතාත්මකව ප්‍රදානය කිරීම පසුගිය නොවැම්බර් 23 වන දින නවලෝක රෝහල් පරිශ්‍රයේදී සිදුකෙරිණි. එම අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහ සීමාසහිත නවලෝක සමූහ ව්‍යාපාරයේ සභාපති ආචාර්ය ජයන්ත ධර්මදාස මහත්මාද එක්වූහ.

ප්‍රවීණ සමාජ ක්‍රියාකාරිකයකු වන ආචාර්ය අරුණ ධම්මික කරුණාරත්න මහතාගේ සංකල්පයකට අනුව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ මැදිහත්වීම මත යුද්ධ හමුදා රණවිරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙනුවෙන් "නවලෝක විරුසුව සරණ" වරප්‍රසාද කාඩ්පත හඳුන්වාදෙනු ලැබිය.

වෙනත් රෝහල්වල නොමැති මිල අධික වෛද්‍ය පරීක්ෂණ, ප්‍රතිකාර ක්‍රම, උපදේශන, නවීන සහ උසස් ඖෂධ සහ සැත්කම් සඳහා සැලකිය යුතු වට්ටම් සහ අනෙකුත් ප්‍රමුඛතා පහසුකම් ලබා ගැනීමට මෙම විශේෂ කාඩ්පත මගින් හමුදා සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට හැකියාව ලැබේ.

උත්සවයේ වැඩකටයුතු ආරම්භයේදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කාර්යභාරයන් සහ "විරුසුව සරණ" වරප්‍රසාද කාඩ්පත හඳුන්වාදීම පිළිබඳව සැකසුනු කෙටි වීඩියෝ පටයක්ද පැමිණ සිටි පිරිස වෙත ප්‍රදර්ශනය කරන ලද අතර, දිවයින පුරා රාජකාරි කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සේවයට උපහාරයක් ලෙස හඳුන්වාදුන් සෞඛ්‍ය ප්‍රතිලාභ ක්‍රමයක් වන මෙම සංකල්පය පිළිබඳව ආචාර්ය අරුණ ධම්මික කරුණාරත්න මහතා විසින් එහිදී හැඳින්වීමක්ද සිදුකරන ලදී. එම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන් පිරිසක්ද එක්වූහ.

# රටට හරියන

# මෙරූන් බෙරය

# හිසට...

හිසට හරියන හිස්වැසුම් කවුරු දැම්මත් රටට හරියන හිස්වැසුම් දාන්න හැමෝටම බැහැ. ඒ අතරිනුත් "මෙරූන්" හිස්වැස්මක් පළඳින්න පුළුවන් හමුදාවෙ කෙනකුට විතරමයි. හැබැයි රණවිරුවෙක් වූ පමණින්ම ඒ හිස්වැසුම් පළඳින්නත් බැහැ. ඒකට අධික ඉවසීම, අසීමිත දරාගැනීම වගේම අත් නොහරින කැපවීමත් උවමනායි. "කමාන්ඩෝ" කියන්නෙ එහෙම අයට.



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.